ශ්‍රී පරාක්‍රමබාහු විල්ගම්මූල,
සංඝරාජ මහා ස්ථවිර ස්වාමිපාදයාණන් වහන්සේ විසින්

— විරචිත —

# ස ද කි ඳු රු දා ක ව

— පිළිබඳ —

**වලානේ සන්නය.**

---

පාතදුඹරේ සෞගත විද්‍යාලයාධිපතිව වැඩවිසූ
ගෞරවාහී සාසනවංශාලංකාර කවිධ්වජ
විනයාචාර්ය
වැලිගම ශ්‍රී සුමඞ්ගල මහානායක ස්ථවිර
පාදයාණන්වහන්සේගේ ද
එහිම ප්‍රධානාචාර්යව වැඩවිසූ ගරු පණ්ඩිතාචාර්ය
ජිනවර ශාසන වංශාලඞ්කාර කවිධ්වජ
පාතදුඹරේ
ඤාණවිමලතිස්ස නායක මහාස්ථවිර ස්වාමිපාදයාණන්
වහන්සේගේත් ශිෂ්‍යාන්තේවාසිවූ
මොරටුවේ ලක්ෂපතියේ ශාස්ත්‍රාරාමාධිපති
ගෞරවාර්හ උපාධ්‍යායතුමූ
වැලිගම සිරිසඞ්ඝානන්ද ස්ථවිරපාදයාණන් වහන්සේගේ

— ශිෂ්‍ය වූ —

පාතදුඹරේ වලානේ සරණපාලාරාම මහා විහාරාධිපති
විත්‍රභාණක පිරිත් ධම්මාචරිය
වලානේ ධම්මානන්ද ස්වාමීන්වහන්සේ විසින්
ලියන ලදී.

---

ආර්. ඩබ්ලිව්. ඩී. සල්මන් අප්පුහාමි විසින්
කොළඹ දෙවෙනි මරදානේ "සෙව්‍යශ්‍රී යන්ත්‍රාලයෙහි"
මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරණලදී.

---

ශ්‍රී. බු. ව. 2475

---

ක්‍රි. ව. 1931

# සංඥාපනය.

චන්ද කින්නර ජාතක කාව්‍යය— මෙනම් ප්‍රශස්ත සකල කාව්‍යාලංකාරයන්ගෙන් මොනවට හෙබියාවූ මධුර මනොහර කාව්‍ය ග්‍රන්ථය වනාහි රාජ්‍ය වර්ෂයෙන් 1250 වැන්නෙහිදී සිරිලක රජපැමිණි දඹදෙනි නුවර අග්‍රරාජධානිය කොට ගෙණ රාජ්‍යානුශාසනා කළාවූ උතුම් බෝසත් ගුණ සිරින් ඇති චීවචක්‍රවර්තිවූ විතීය පණ්ඩිත පරාක්‍රමබාහු මහාරාජාණන්ගේ කාලයෙහි රචනා කරණ ලද්දක් වෙයි. මෙහි කතෘ උත්තමයා වනාහි මුලින් කියනලද පැරකුම්බා නිරිඳු රජය අනුසස්නාකල ලක්දිව විසූ ෂඩ්භාෂා පරමෙශ්වර ත්‍රිපිටක වාගීශ්වර ශ්‍රී රාජගුරු ගලතුරුමුල සඞ්ඝරාජ මහාස්ථවිර ස්වාමිපාදයාණන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය රත්නයවූ ශ්‍රී පරාක්‍රමබාහු විල්ගම්මුල * සංඝරාජ මහා ස්වාමිපාදයාණන් වහන්සේය. මුන්වහන්සේ වනාහි බොහෝ ශිෂ්‍ය සමූහයකට ශාස්ත්‍ර හදරවමින් ස්වකීය ආචාර්‍ය්‍යන්වහන්සේගේ කාලයෙන් පසු සංඝරාජධූරය ලැබ වැඩිවිසුවා පමණක් නොව එළු, පාළි, සංස්කෘතාදි නානා භාෂා ශාස්ත්‍රයන්හිහා ත්‍රිපිටක ධර්‍මයෙහිද තීක්ෂණ බුද්ධිමත් පණ්ඩිතොත්තමයෙකි. මුන්වහන්සේගේ ශාස්ත්‍රඥතය මෙම සඳ කිඳුරු දා කවෙන් හා තමන්වහන්සේ විසින්ම කරණලද සිංහල බොධි වංශාදි වැදගත් පොතපතින්ද ප්‍රකාශවන්නේය. මෙම විල්ගම්මුල පරම්පරාවෙහි බොහෝ ප්‍රශස්ත පඬිවරයෝ වීසූබැව් පැලි තිසණ්ඩුව ආදි බොහෝ පොත්පත් තුළ මුගලන් මහතෙර පාණන් ආදී ප්‍රශස්ත පඬිවරයන්නෙන් මනාව ඔප්පුවන්නේය.

මෙම සඳ කිඳුරු දා කව වනාහි-ඡන්දස් අලංකාරාදි කාව්‍ය රසයෙන් අනූනකොට විතතාකර්ෂණය වන පරිද්දෙන් සරසා තිබීම කාව්‍යශාස්ත්‍රයෙහි අභිලාෂ ඇතියනට හා විශෙෂවශයෙන්ම සම්බුදු සිරිත් අසනු කැමතියනටද අතිශයෝපකාරිවූ මේ ප්‍රශස්ත ග්‍රන්ථය වනාහී චිරාගත ලිපිදෝෂයන්ගෙන් දූෂිතව පැවති ආකාරය කෙසේදැයි යත හොත් අපට හමුවූ එකම පොතක්වත් දෙකක් එකට සමවන පරිදි නොතිබුනබැව් කීමට කැමැත්තෙමු. පොත්

* මෙනමින් එක්තරා භික්ෂුනිකායක් පැවති බැව් පොත පතින් පෙනේ.

කීපයක් සසඳ බැලූමුත් කොයිම පොතකවත් සම්පූර්ණ කවි ගණන නොතිබුණේය. සමහර පොතක කවි තුන්සිය ගණනක්ද එකක පමණක් සාරසිය විසිහතරක්ද තිබුනි අනිත් පොත්වල නොතිබුන එක කවියක් පමණක් එම පොතේ තිබුණේය. * ඒ පොත පානදුරේ ශ්‍රී විජය කවිරාජ පඬිතුමාගෙන් ලබාගත් බැව් තුති පෙරටුව මතක්කරම්හ. මෙබඳු ආකුල පොතක් කිසි කලෙකවත් නොදුටුයෙමු. මෙනමින් පුරාන පොතක් ඇති බවක් වත් ආරංචිමාත්‍රයෙන්වත් බොහෝදෙන නොදත සිටියෝය. මෙහි සාරසිය විසිපහක් කවි ඇතිබැව් අන්තිම කවියෙන් පෙනේ. මේ කථාශරීරය ගැණ පමණකි සතෘ දක්වීම් ආදි කවහැර බැව් පෙනේ. මුන්වහන්සේ වනාහි දෙනගමු විහාරාධිපතිව වැඩවිසූ බැව් අවසානයෙහි කියනලදී.

රන් ගිරිසිරි අස ල
මල්රමින් සුත් මන ක ල
තුන් බෝ සැදි විසු ල
† පසිදු දෙනගමු වෙහෙර හැමක ල

මේ කවියෙන් ප්‍රකාශවන්නේය. මෙසේ පැවැත්තාවූ මේ ප්‍රශස්ත කාව්‍ය ග්‍රන්ථය නොයෙක් ලිපිදෝෂයන්ගෙන් ආකුල ව්‍යාකූලව පවත්නා හෙයින් හා සන්නයක් නොමැත්තෙන් ආධුනික ජනතාවට ඉන් ලැබියයුතු ප්‍රයෝජනය ගැනීමට නොහැකිව පවත්නාකල ගල්කිස්සේ ඕකඩවත්තේ සමුද්‍රාසන්න විහාරාධිපතිව වැඩවිසූ ගරුකටයුතු බුද්ධඝෝෂ මහාස්ථවිර ස්වාමිපාදයාණන් වහන්සේ විසින් පිටපත් කීපයකුත් සපයාදී මිට පදගත සන්නයක් ලියා දෙනලෙස අපට ආරාධනාවක් කෙළේය. එම ආරාධනාව පිළිගෙණ සන්නය ලියා අවසානවීමට පෙර උන්වහන්සේ අපවත්වී වදාළෙන් මුද්‍රණය පිළිබඳ කටයුතු පමාවී තිබුනබව දුටු අප හිතෛෂී ආර්. ඩබ්ලිව්. ඞී. සල්මන් අප්පුහාමි එම සන්නය ඉල්ලාගෙණ මුද්‍රණයට

---

* මෙහි තිබුනේ 411 කි.

† මෙකී දෙනගමු විහාරය සතරකෝරලයට අයත් පොල්ගහවෙල සමීපයෙහි පිහිටියේය.

පමුනුවනලදී. මෙහි අපගේ ප්‍රමාදයෙන්වූ දෝෂයෙක් දක්නාලැබේ නම් හෝ පණ්ඩිතයෝ සුධකෙරෙත්වායි එබඳු තැන සම්ධින භජනය කරණමෙන්ද දන්වමු.

මෙහි අයිතිය අපෙවෙතම තබාගත් බවද දන්වමු.

මෙවනට,

වලානේ සරණපාලාරාම මහා විහාරාධිපතිය
කරුණාවන්තවූ-වලානේ
ධම්මානන්ද උන්නාන්සේය.

ශ්‍රී බුද්ධ වර්ෂ 2475 ට පැමිණි බිනරමස පුරවිසේනියලත්
බුදදින වලානේ සරණපාලාරාම මහා විහාරයේදීය.

# සඳ කිඳුරු ජාතකය.

අප සම්මා සම්බුද්ධ පියාණන්වහන්සේ පූර්ව බෝධියෙහි එක් කාලෙක කිඹුල්වත් නම් පුරයනිසා නිග්‍රෝධාරාමයෙහි වැඩවසන සේක් සුදෙවුන් රජගෙයි යශෝධරා දේවීන් අරභයා මේ චන්ද කින්නර ජාතකය දේශනාකොට වදාළසේක. හේ කෙසේදයත්:- මේ ජාතකය වනාහි දූරේනිදානයෙහි පටන් කියයුතු වන්නේය. මේ දූරේනිදාන කථාව දීපංකර පාදමූලයෙහි පටන් සමතිස් පැරුම් පුරා කෙළවර පාරමිතා නැමති වොටුන්නෙහි අගමිණිරුවනක් බඳුවූ වෙසතුරු දූයෙහි අඹුදරුවන් පරිත්‍යාගයෙන් සත්වරෙක මහපොළොව වෙවුල්වා දෙවන අත්බැව තුසීපුර ඉපිද සත්පණස් කෙළ සැටලක්ෂයක් හවුරුදු දෙවියන්ට ධර්ම දේශනාකොට දස දහස් ලෝ දෙවිබඹුන් අයජමෙන් පස්බැලුම් බලා මවුකුස පිළිසඳ ගත්බවද ලුම්බිනී සල්වෙනෙහි මහාබ්‍රහ්මයා අතට බිහිව වැඩිවිය පැමිනියේ සකල ලොකධාතුයෙහි අසදෘශ අභිෂෙකයට පැමිණියේ උයන්කෙළියට වඩනාසඳ දෙවියන්මවාලූ ජරා, ව්‍යාධි, මෘත යන තුන්පෙර නිමිතිදුටු සතර කලකිරී සිවුවැනිව මවාළු මහණවෙස දුටු මහණවීමෙහි උත්සාහ ඇතිවූයේ මහබිනික්මන්කළ බවද සාවූ රුද්දක් මුලුල්ලෙහි ප්‍රධන් විඳීකොටලා වෙසහමස පුර පසළොස් වක්ද බෝමැඩ වීදුරසුන් අරා වැඩහිඳ බුදුව ක්‍රමයෙන් සත්සති ගෙවා අටවෙනි සතියෙහි මහබඹු අයජමෙන් බරණැස ඉසිපතන නම් උයන්හි දම්සක් පවත්වා දෙව්බඹුන් විමසන පරිදි ක්‍රමයෙන් උරුවෙල්දනව්වැඩිසේක් දහසක් ජටිලයන් රාත්කොටලා බිම්සර රජහට දුන් පිළිණ සඳහා රජගහනුවර සමීපයෙහි වුලටසිවන නම් උයනටවැඩ ඒ ගමාගමයෙහි උරුවෙල් කසුප් තෙරනුවන් එසින් කරණලද සිංහනාදය දක්වා අපන්නක ජාතකයෙහි වදාළනියායෙන් දතයුතු. එතැන්පටන් කාළුදායි සථවිරයන්ගේ ආරාධනාවෙන් කිඹුල්වත් පුරයට වැඩිගමනහා වෙස්සන්තර ජාතකයෙන් දත්තේය. එකල්හි සර්වඥයන්වහන්සේ පියරජ්ජුරුවන්වහන්සේගේ මාලිගාවට වැඩමවා වැළඳීමට පූර්වභාගයෙහි මහා ධර්මපාල ජාතකය දෙශනාකොටලා බත්කිස කෙළවර යශොධරා දෙවීන්ගේ මාලිගාවෙහි වැඩහිඳ උන්ගේ ගුණය ප්‍රකාශකරනසේක් චන්ද කින්නර ජාතකය දෙශනාකොටලා කරණලද සනිටුහන්ද අළුයම් කිව කොට වදාළ ඉක්බිති සුඩොදන රජ්ජුරුවන්හා සමග පාත්‍රා ධාතුව ගෙන්වාගෙණ අගසව්දෙනම සමග සඳකිරුදෙදෙනා දූලෙහි ලා ගමන් ගත්රුවන් මෙර සෙයින් බිම්බාදේවීන් වසන ප්‍රාශාදයට නික්මුණුසේක් එදවසට බිසවුන් ශුධාත සතළිස්දහසක් නලගනනු

වෙසෙති. එතෙක් නලනණත් අතුරෙත් පිරිසිදු ක්ෂත්‍රිය කන්‍යා
වෝම එක්දහස් අනූදෙනෙක බිම්බා දෙවීද බුදුන් තමන්ගේ භව
නයට වඩනාබව අසා ඒ ක්ෂත්‍රියකන්‍යාවන් හැමදෙනම කාෂායවස්ත්‍ර
හැඳපෙරව අවමැනවැයි නියමකළාය. උයින් එලෙසම අවුත් පිරි
වරා සිටගත්හ. බුදුහුද වැඩවදුරා පනවනලද බුදු අස්නෙහි පලක්
බැඳ වැඩඋන්සේක් ඉක්බිති හැමදෙනම එකපැහැර බුදුන් පාමුල්හි
අඩා උන්නෝය. බිම්බාදේවීන්වහන්සේද බුදුන්ගේ ශ්‍රීපාදයෙහි
දගකෙළවර තරයේ අල්ලා හඬාවැලප සෝක සංසිඳුවා මයිලනු
වන් කෙරෙහි මහත්වූ ආදර බහුමානයෙන් එකත්පසෙක උන්
නාය. සුද්ධෝදන මහරජ්ජුරුවෝද බිම්බාදේවීන්ගේ ගුණ කියන
සේක් සවාමිනි මාගේ යෙහෙළිතොම නුඹද කෙරෙහි සෙනහයෙන්
මහබිනික්මන් කොට කාෂාය වස්ත්‍රයක් පෙරවියයනු අසා තොමෝද
කාෂායවස්ත්‍රයක්ම පෙරවිය. අංගරාගයන් නොගල්වති යනු අසා
තොමෝත් අංගරාග නොගැල්ලූ විරූය. නුඹවහන්සේ එක්වේලේ
වළඳති යනු අසා තොමෝත් එක්වේලේ බතින්ම යැපෙන විරූය.
තවද නුඹවහන්සේ බිම වැදහොති යනු අසා තොමෝද භූමියෙහිම
සහනයකරණ විරූය. තවද නුඹවහන්සේ මහණවූ බව අසා නෙසු
රජුන් එවූ පඬුරු පිළිනොගෙණ නුඹවහන්සේ කෙරෙහි සෙනහ
යෙන් වැන්දඹුව ජීවත්වූයේ ඉතා ආශ්චර්යයයි සිතමි. සවාමිදරුවා
නති යනාදීන් යෙහෙලිතියන්ගේ ගුණ බොහෝකොට වර්ණනාකළ
සේක. එපවත් අසා බුදුහු මහරජ යම්බඳු මඳක් වැන්දඹුවන් කෙළ
වර අත්බැව්හි මා කෙරෙහි සෙනහයෙන් කෙලෙස් වසඟනොව
අනුන් නොපැතුබව ආශ්චර්යනොවෙයි. පෙරගිය දවස් තිරිසන්
යෝනිහි ඉපිද පවා මාකෙරෙහි සෙනහයෙන් නොපැතුබව වේදැයි ධර්ම
දෙශනාවට මුඛමාත්‍රයක්දක්වා වැඩහුන්කල්හි ඒ භවන්තර ප්‍රවෘත්ති
ඇසීමෙයි කුහුල්සිත් ඇති පියරජහු විසින් ආරාධිතවූ බුදුරදහු
විසින් සැගතිබූ මෙරපත්ලෙහි රුවන්වැල්ල නෙලවේදැයි ගෙණ
හැරපානා කලක්මෙන් භවයෙන් වැසී තිබුනාවූ මේ සඳකිඳුරු
ජාතක කථාව ගෙණහැර දක්වනසේක්:-

මහරජ, යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්තනම් රජකෙ
නෙකුන් රජයකරවන කල්හි පිරූ පෙරුමන් ඇති අප මහබෝධි
සත්වයන්වහන්සේ හිමාලයවනයෙහි සඳ කිඳුරු යෝනියෙහි උපන්
නේ ඔහුගේ අඹුවද චන්ද්‍රනම්වී මොහු දෙදෙනම රිදී පව්වෙක්හි
වසන්නෝ එකල බරණැස් රජ්ජුරුවෝ ඇමතියනට රජය පාවා
දුන්නෝ කළුදූ පිළි දෙකක් ඇඳපෙරව දුන්නය මුගුරය අඩයටියය
කඩුවය, පාරුවලල්ලයයි යන පස්වායුධයෙන් සන්නද්ධව හිමවතට
වැද මුවන් මරාකා ඇවිදින්නෝ සුළු හොයකට පැමිණ හොයඋඩ

පාත මුවහසරබලා ඇවිදින්නෝ එහි රිදීපව්වෙහි වසන්නාවූ සඳ කිඳුරෝද වැසි සාරමස පර්වතයෙන් නොබැස ගුඩිත්මය. ගිම් සාර මස් ඒ පර්වතපාදයෙහිම ඇවිදිති. එකලට යට කියනලද සඳ කිඳුරු රජ්ජුරුවෝ තමන් කිඳුරඟන සමග පර්වතයෙන් බැස ඒ ඒ තැන සඳුන් රටු කඩා ගා විලවුන් ගන්නාහුය. තවද මලපට හදනාවූ පොරානාවූ ලිය හෝ වැල්ලෙහි කෙළනාහු මිහිරි සරයෙන් ගී කියන්නාහු යට කියනලද හොයට බැස ඒ හොය වලක් එනොඩ තැඹු වැල්ලකට බැස දියවල මුල්කඩාදමා දියකෙළ නැවත මල්පට හැඳ පෙරව රිදීපටක්බඳුවූ වැලිමතලෙහි මල්හසුන් පනවා එක්වස් කුලලක් පිඹිමින් ගී කියමින් කුසුමාසන මස්තකයෙහි උන්කල්හි කින්නරාංගණාවද මහරිමල්දම්බඳු මොලොක් අත් නැබීමෙන්ද නැගීමෙන්ද හෙලීමෙන්දුයි තුඳුරුනැනසිට ගී කියමින් විසිතුරු නැටීමක් නටන්ට පටන්ගත්හ. එසඳ බරණැස් රජ්ජුරුවෝ ඒ ගායනාශබ්දය අසා පියසත් නොඇසෙනසේ සෙමෙන් අවුත් ලිය කිඳුරාණන් උන්නියාවද නටමින් සිටි කින්නරාංගනාවද දුටුවාහු පිළිබඳ සිත් ඇතිව මේ කිඳුරා විද මරා මෑ සමඟ වසස කෙළෙම්නම් යහපතැයි සිතා සැඟවීසිට කිඳුරාට හීයක් විද්දහ. ඒ ප්‍රහරින් වැහෙන්නාවූ ලෙයෙන් මහත්වේදනාවෙන් මඩනාලදුව හඬන්ට වන්නේය. සබඳ! චන්ද්‍රිකාව! මේ මාගේ ජීවිතය තවද ආයු ඇතිව තිබියදී සංතතිච්ඡෙදයෙන් නැසෙම්හි සිතමි. එබැවින් මම තිගේ ක්‍රීඩා විනෝදනයෙහි නොඇලෙම්. ලද ප්‍රහරින් හා මාගේ ජීවිතය නොබෝකලකින් කඳ සැගවෙන්නේය. නකිගුනකියා ගිය කබලෙක ලූ තලසෙයින්ද මුලින් සිඳහෙලූ ගසක් සෙයින්ද තියත් සමයෙහි පැන්සිඳී වියලීගිය වලහෝ කඳුරක් සෙයින්ද ක්‍රමයෙන් ජීවිත විනාශයට පැමිණෙනසේ බලව පර්වතයෙක්හි බස්නාලදුව ක්ෂණ ක්ෂණයෙහි වැහෙන්නාවූ වර්ෂා ජලධාරාවක්මෙන් කඳුලු වැහෙන්ට පටන්ගන්නේය. වැලින් මේ සෝක දුඃඛය උදක් මාගේම ජීවිත අපෙක්ෂාවේම නොවෙමි. මා මලකල්හි මාගේ වියෝග සොකයෙන් හඬා පෙර මාසම ග එක්ව කෙළඇවිදි ලියඹුලු වනලැහැබ් අතලගල් ගංකිස් ගිරිමුදුන් රුක්යට වැලිතල ආදීවූ ඒ ඒ තංකි අඬා ඇවිදිනා තිගේ අඳෙනාවන් සලකන්නාවූ මම හඬන්නෙමි. යනාදීන් එසේ එබෝසත් අඬා මල් ඇතිරිමත්තෝ සිහිමුලාව අතික් ඇලයට පෙරලී වැදහොත්තේය රජ්ජුද විදිතැනම සිටියෝ චන්ද්‍රිකානම් කින්නරාංගනාව මහබෝසත්හු මෙලෙස හඬනත් තමාගේ කෙළියෙහි ඇලීමත් වනලද්දී බෝසත්හු විත් කැනියාවත් නොදන්නීය. එතකුදු උවත් මහසත්හු සිහිමුලාව වැදහොත් තියාව දූක ඇයි මාගේ සවාමිපුරුෂයාණන් මේනියාවූ මාගේ කැටුම් නොබලා වැද

හෝනට කවර දුකෙක් උපන්නේදැයි පරීක්ෂා කොට බලන්නාහු ප්‍රහාර මුඛයෙන් වැහෙන්නාවූ ලේ දුක ප්‍රියවූ ස්වාමිපුත්‍රයා කෙරෙහි ශෝක දරාගතනොහැකි ආක්‍රොශබෙනමින් මහහඬින් හඬන්නට වන්හ. සැහවීසිටි රජ කිඳුරු මෙල්වනැයි හෙළින්බැස තී හඬන්නට කාරණා කවරේදැයි මම තී පාද පරිචාරිකා කොට සොළොස්දහසක් පුරඟනන්ට අගමෙහෙසුන් කෙරෙමි. යන ආකාර දුන්විය කිඳුරඟ ණද ඔහු දුක මේ සොරහු විසින් විදිනාලද්දේයයි භය ශෝක දෙකින් වෙව්ලමින් දිව්ගෙණගොස් පර්වත මුදුනටනැගී රජහට අවන්ට පටන්ගත්තීය. ඒ කෙසේදයත්; යම් රජෙක් මාගේ කැමති සමණන් කිසිලිමැද විදපිද එතෙමේ විත් කෑසරවේගයෙන් නැතිගත්තේ සිහිමුලාව බිම වැදහොත්තේය. අනේ! මා දිවගෙණගොස් ගල මුදුන්කලා මේසා දුකක් උපදවනලද පාපිෂ්ටවූ නාවැති ද්‍රොහියෙක් මාගේ ස්වාමිපුත්‍රයාණන් මා උදෙසා මැරීනම් මාගේ ස්වාමිපුත්‍රයාට පැමිණී මරණ දුඃඛය තටම වේවයි මට පැමිණියාවූ මේ ශෝකය තාගේ අඹුවන්ටද වේවයි තවද පව්පිවූ රජ තාගේ මවුද තා නොදුක සෝහොන්වදීවයි. තවද දුෂ්ටවූ මහරජ තාගේ ප්‍රජාපතිතොම තමන් දරුවන් නොදුක නිරුවදීවයි යනාදීන් ඇවිලි අවමින් අඬන්ට පටන්ගත්හ. රජ්ජුරුවෝද මෙසේ හඬන්නාය අස්වසන්නාහු මහබෝසත්හු විත්කා අඬතෙව්ලෙහි තම කියා හැඬූහෙයින් තම දුනද ගින්නේරිය මලබඳු ඇස්ඇති මනාවූ හාවභාව ලීලාවිලාස ඇති චන්ද්‍රිකාව ශෝකනොකරව. ඉදින් තී කැමැත්තෙහිනම් මට බිරිඳකොට සොළොස් දහසක් පුරඟනන් මැද රජකුලයෙහි ප්‍රසිඬ වසි කීහ. එපවත් අසා චන්ද්‍රිකාතොමෝ අවලක්ෂණ හෝ මානිසා නිරපරාධවූ මාගේ සමණන්ද මැරීද ඔහුකෙරේ සෙනෙහයෙන් අඩා මියනපමණක්මුත් තොපට පාදපරිචාරිකාවීමෙක් ඒකාන්තයෙන් නොවෙම්යි තදකොට කිව මෙසේකියනලද ඕ චන්ද්‍රිකාවගේ වචන ඇසූ රජ්ජුරුවෝ නිරුක්ති ජාතවූ පැවැත්තිය ඉදින් ජීවත්වනු කැමැත්තේවිනම් තලිස්පතුරුහා තුවරලා ගොදුරුකොට වසන්නාවූන් තීසේම සමාන ජාතිඇති කිරිසනුන් රමනය කෙරෙමින් වැස වැලි තිට රජකුලයෙහි සම්පත්තීන් ප්‍රයොජන කිම්දැයි කියා කිඳුරඟනට හැර බැණ ඇකෙරෙහි ආලය පසිඳ නැගීගියාහ. ඕ කිඳුරඟණතොමෝ රජහු නිරපෙක්ෂකව පලාගියබව දුන පර්වතයෙන් බැස මහබෝසත්හු සීපගෙණ ඔසවා පර්වතමුදුනේලා බෝධිසත්වයන්ගේ හිස තමාගේ ඇකෙහි තබාගෙණ අඬා තී මාගේ ප්‍රියවූ ස්වාමිපුත්‍රයානනි! පෙර තුඹහෝ මාහා පව්ඝගුහාදියෙහි සිත්සේ ඔවුනොවුන් ගා සනහමින් කෙළඇව්ද දැන් තුඹකෙරෙන් වියෝවූ මම කුමක්කියා ලය සනසම්ද, තවද හිමයෙහි පුෂ්පඵල පලලවයෙන්

අලංකෘතවූ වනලැහැබුත්හා පෙර අපි කෙළඇවිද් සමන් ලියමඩුලු හා බලන්නෙම් තොප නොදුක කෙසේනම් ඉවසියෙහිද, තවද ස්වාමිදරුවාණෙනි, නුඹ ගෙනෙන් සැතපෙන පිණිස අතුරණලද තලිඡ් පතුරුවා කොලතිරිහා ගිරි හිසින් වැහෙන ගං හෝ ඇල කඳුරැලියෙහි පෙර අප බැස නහන තොටවල ඉඳ කෙළනාලද වැලිතලාහා කඩා ගොනා පළඳිනා මල්වඩම්හා ඉද්ද කොළිලිය හෝ විල් බලන්නාවූ මම කෙසේනම් ලය සනසාගන්නෙම්ද, තවද පිය කල් මහිමියනි, ඉතා දුකුම්කළු මහ බඳනාලද ඉඳුනිල් මැනික් කුලින් රන්ගිරිකුලටද රන්ගල්කුලින් කෙලෙස්පව්වටද කෙලෙස් ගල්කුලින් සත්රුවන් කුලටද පැනබැස සිත්යේ තොපහා කෙළ ඇවිද දුන් තොපකෙරෙන් වියෝව කෙසේනම් ලය සැනසෙම්ද අනේ හිමියනි! යක්ෂ, රාක්ෂ, සිඬවිද්‍යාධරාදිවූ නානා භූතගණයන්ගේ වාසස්ථානයවූද තවද පොළඹමින් පිපින්පිව තොළු තබතබා ඒ ඒ තන්හි ලන පබුළුවන් ඇදකමින් ඇවිදිනාලද නොයෙක් ජාතියෙහි ජලචර පක්ෂීන් කෙළිනා ලඳුව පස්පියුමෙන් ලකල් විල් තටාක පඞ්ක්තියෙන්ද ආමූලාග්‍රව පිපී වැනී ගියාවූ නඳුන් සඳුන් දෙව්දුරු තුවරලා ආදිවූ නොයෙක් සුවඳ රුකින් ගැවසීගත් නොයෙක් සිය දහස් ගණන් වන:සාව පඞ්ක්තියෙන්ද විරාජමානවූ ඉතා දර්ශනීයවූ ප්‍රාපිවිය නැමති අංගනාව එසින් පළඳනාලද මිණිකිරුළු අගස් මෙන් උස්ව ඉතා සොභමාණවූ මෙහිමවුවනයය පෙර තා හා සමග කෙළ ඇවිදිනාබව වැටහෙනබවමුත් ඉතිබබනාගේ (ඉනුඹ්බෙහි නම් වඩා මැනවි) විරහ ශෝක දුඃඛයෙන් හඬනාලද්දවූ මට අඳුරු ගෙයක්මෙන් නිසොභාව වැටහෙන්නේයයි යනාදීන් මහත්වූ ශෝකයෙන් හඬා මහබෝසතාණන්ගේ ළලහි අතතබා මලාවූද්දෙයි බලා ඔදක් පණ සැළී සැළී තුබුවා දුක මහිමි තව ජීවතැයි දූත දෙවතාවන්ට උපක්ඛායනාකොට යන පණ ඇරදෙවාලම්යි සිතා කිමෙක්දෝහෝ මෙලොව රන්නාවූ ලෝකපාලක දෙවියෝ නැත්ම දෝහෝ අනික් සක්වළ දෙවියෝ වෙසෙත්දෝහෝ නොහොත් මලාහුදෝහෝයි හඬා නැවත ඉදින් දෙව්කෙනෙක් මෙලොව ඇත් තාහුනම් මහිමිහට මේ පැමිණි දුකින් නොබලා හරිද්දුයි දෙවියන්ට උපක්ඛායනාකොට හැඬූහ. එකල උතුම් ගුණඇති පතිවත්වූ ඇගේ සොකාග්නිවේගය සුවාසුදහසක් යොදුන් උඩනැගී සක්දෙව්රජහු ගේ භවනය හුණුකෙළේය. ශක්‍රදේවේන්ද්‍රයෝ දහසක් දිව ඇසින් ලොව බලනුවෝ මේ කාරණය දුක බමුණුවෙසක් ගෙණ ඇසිල් ලකින් අවුත් මහබෝසතාණන් ඔත් ගල්මුදුනෙහි පෙනී කොණ්ඩකා වෙත් පැන්ගෙණ මහබෝසතාණන් ඇඟ ඉසලූහ. එකෙනෙහි විස නැසී විණය සුවීව සොතනාඞිදි බවත් නොදනැහැකිවිය. මහබෝ

සඳ එවිට අනුත්‍ර වෙහෙසත්ව මලෙවස්ලා වැදහොත් එකකු පරිද්දෙන් වෙහා නැඟිසිට සුවපත්වූයේය. චන්ද්‍රිකාද එසඳ සුවපත්ව සිටිය ප්‍රිය ස්වාමිදැක බලවත්වූ සොම්නසට පැමිණෙවුවා මිනි, යම් බඳු නුඹවහන්සේ මාගේ ප්‍රියකල්හු ඇඟ අමා පැන්ඉස නිදුක් කොට මාගේ ඒ කලකම් දුරැකොට ප්‍රියවූ අප දෙදෙනා සමග කලසේක්ද එසේවූ නුඹවහන්සේගේ ශ්‍රීපාදය වඳිමියි වැදහොත් තිය. ඒ ශක්‍රදේවේන්ද්‍රයෝද උන් දැක බලවත්වූ සොම්නසට පැමිණ මෙතැන්හි නොවසව පජීනයෙන් බැස මිනිසුන්ට අවිසයනැත වෙසෙවයි අවවාදකොට තමන්ගේ දිව්‍යලෝකයට ගියාහ. චන්ද්‍රිකාද ස්වාමිනි, මෙසේවූ උපද්‍රව ඇතිතැනින් අපට ප්‍රයෝජන කිම්ද, චන්ද්‍රපජීතයට පැමිණ ගල්ගිරිකුළු මුදුන්වලද ගංසිහිල වලද මල්මුවරදහල දියවලට බැස සහාත පාණය කෙරෙමින් තුරු ගෙවත්හි ඔවුනොවුන් සමග ප්‍රියකථා කෙරෙමින් සැපසේ වසම්හයි. පෙරවිසූ චන්ද්‍රපර්වතයටම ගියාහයි යනාදීන් බුදුහු මේ ජාතක දෙශනාව ගෙණහැර දක්වා වදාළසේක මහරජ දැන් පමණක් නොවෙයි පෙරත් මා කෙරෙහි සෙනහයෙන් අනුන් වසහයට නොපැමිණියා යි ජාතකය නිමවා මහරජ එකල විසී බරණැස් රජනම් දැන් දිවස් ඇත්තන් කෙරෙන් අගනැත්ලත් අනුරුඩ මහතෙරුන්වහන්සේය එකල චන්ද්‍රිකානම් කින්නරාංගණාව දැන් යසොධරානම් තෙපෙ ගෙහලියය. එකල චන්ද්‍රකින්නරු රජනම් මෙකල තිලෝගුරු බුදුවූ මම්ම වෙම්දැයි තමන්වහන්සේ දක්වා වදාළසේක.

මේ චන්ද්‍රකින්නර ජාතක දෙශනාව කුළුගන්වා වදාළසේක.

සු භ ම ස්තු.

# සඳකිඳුරු ජාතක කාව්‍යය

පිළිබඳ

# වළාණේ සන්නය.

නමො බුධාය.

1 ගොසැතිලෝ ඇ දු රු
තිරසර ගුණෙන් ඇ දු රු
රාග දෙස් ඇ දු රු
වඳිම් මුනිඳුන් තිලෝ ඇ දු රු

2
විනෙ දන ක ත ර වූ
බව සයුරෙන් එ ත ර වූ
නැණ රුවල ත ර වූ
වඳිම්සදහම්නැව ප ත ර වූ

3
කුසල් බිජුනන් ස ත්
වපුරණ සත්තොසින් සි ත්
මෙත් සිහිල බිම් යු ත
වඳිම් මහ සඟ සාරපින් කෙ ත

---

1 ලෝ ඇදුරු, මහාබ්‍රහ්මයාගේ; ගොසැති, සවරය ඇත්තාවූ; තිරසර ගුණෙන්, ස්ථිර සාරගුණයෙන්; ඇදුරු, (මහාමෙරු) පර්වතය වැනිවූ; රාග දෙස් ඇ, රාග ද්වෙෂාදියෙන්; දුරු, දුරීභූතවූ; තිලෝ ඇදුරු, ත්‍රෛලොක්‍යාචාර්‍ය්‍යවූ; මුනිඳුන්, මුනීන්ද්‍රයන්වහන්සේ; වඳිම්, නමස්කාරකෙරෙමි.

2 විනෙදන, වෛනෙයජනයා; කතරවූ, තරණයට දුෂ්කරවූ; බව සයුරෙන්, සංසාර සාගරයෙන්; එතරවූ, පරතෙරට පැමිණියාවූ; තරවූ, ස්ථිරවූ; නැණ රුවල, ඥාන නැමති රුවල්ඇත්තාවූ; පතරවූ, විශාලවූ; සදහම් නැව, සද්ධර්ම නැමති නෞකාව; වඳිම්, නමස්කාර කෙරෙමි.

3 නන්සත, අනෙක සත්වයන් විසින්; කුසල්බිජු, කුසල් නැමති බීජයන්; සිත සතොසින්, චිත්ත සන්තොෂයෙන්; වපුරණ, වපුරණ ලද්දවූ; මෙත් සිහිල, මෛත්‍රී නැමති (ජලයෙන්) සිහිල්වූ; බිම් යුත, භූමියෙන් යුක්තවූ; මහ සඟ, මහා සංඝයා නැමති; සාර පින් කෙත, සාරවූ පුණ්‍යක්ෂෙත්‍රය; වඳිම්, නමස්කාර කෙරෙමි.

4 ස ත ත හිසුලත් න ත්
කොතත විදුරවි රත්ග ත්
ච ත ත සොම් පත් ම ත්
ස ත ත සතරක මෙසුරසෙත්දෙ

5
ඇසුවන් සිත පැහැ ද
සගමොක් සැප ලබන ලෙ ද
එලු බසිනි මනන ද
කියමි සඳකිඳුරු ද, පදබැ ද

6
මබසෙහි කිවිවර ණ
වරදක් ඇතත් කොපම ණ
සැදුහැයෙන් බුදුගු ණ
පමණගෙණ සතුටුවව් අපමණ

7 සුගතිඳු ගුණ පත ර
වණම්යි මා සිතන වැ ර
පුළුන් රළකින් මෙ ර
පැහැරසොලවන වැත්නහිරස ර

---

4 සතත, මහා බ්‍රහමයාය; හිසුලත්, ඊශ්වරයාය; නත්, අනන්ත නම් නාගරාජයාය; කොතත, කතරගමදෙවියාය; විදුරවි, ශක්‍රයාය; රත්ගත්, අඟහරුය; චිතත, ගණදෙවියාය; සොම්, චන්ද්‍රයාය; * පත්මත්, සූර්‍ය්‍යයාය යන; මෙසුර, මේ දේවතාවෝ; සතත, ඒකාන්ත යෙන්; සතරක, සත්‍වයා රක්‍ෂාකොට; සෙත් දෙත්, ශාන්ති දානය කෙරෙත්වා.

5 ඇසුවන්, ශ්‍රවණයකලවුන්ගේ; සිත පැහැද, චිත්තප්‍රසන්නව; සගමොක් සැප ලබන්නාලෙද, ස්වර්ගමොක්‍ෂ සම්පත් ලබන පරිද්දෙන්; එළුබසිනි, සිංහල භාෂාවෙන්; මනනද, මනොනන්දනීයවූ; සඳකිඳුරු ද, චන්ද්‍රකින්නර ජාතකය; පදබැඳ, පද්‍යබන්ධනය කොට; කියමි, කථනය කෙරෙමි.

6 කිවිවරණ, කාව්‍යොත්තමයානෙනි; මබසෙහි, මාගේවචනයෙහි; කොපමණ වරදක් ඇතත්, කෙතෙක් දොෂ විද්‍යමානවූයේ නමුත්; සැදුහැයෙන්, ශ්‍රද්ධාවෙන්; බුදුගුණ පමණගෙණ, බුඩගුණය පමණක් ග්‍රහණයකොට; අපමණ, අප්‍රමාණව; සතුටුවව්, සන්තුෂ්ටවව්.

7 පතර, මහත්වූ; සුගතිඳු, සුගතෙන්ද්‍රයාගේ; ගුණ, (කරුණා ප්‍රඥාදි) ගුණයන්; වණම්යි, වර්ණනාකරමැයි; සිතන, චින්තනය කරන්නාවූ; මා වැර, මාගේ උත්සාහය; (කෙසේදයත්) පුළුන් රළකින්, තූලිකාරොදයකින්; හිරසර, ස්ථිරසාරවූ; මෙර, මේරුපර්වත යට; පැහැර, ගසා; සොලවනවැත්න, චලනයකිරීමට කරන උත්සාහයක් මෙනි.

---

* බුදහුටද නම්.

8 දූරවිදූර සන්නි ක
යන තුන් නිදන් බේද ක
ඉන් දක්වනු මද ක
අසව් සවනත නොලා වෙනක ක

9
දනන් රැඳි සිල්ව ත්
නිවන් පුර දෙර සොල්ව ත්
දුටන් මන කුල්ම ත්
නමින් නුවරෙක්වී කිඹුල්ව ත්

10
මෙර මහිනි දියබ ද
කිරි සයුර අලලන ස ද
නැඟිදිය කඳ පබ ද
වැන්න පිළිමිණිපවුර මනන ද

11
දුටුවන්වන පිරිය
නිමල සිහිලඹ ස පිරිය
එනුවර මහ පිරිය
කෙරේ සොරසතුරන්ට අ පිරිය

12
විසිතුරු තුඟු විස ල්
දුටු නෙතට පුර වහස ල්
සුරිඳු පුර වහස ල්
වැන්නතවසර වසන පන්සල්

---

8 දූර, දූරෙනිදානය; අවිදූර, අවිදූරෙනිදානය; සන්තික, සන්තිකෙනිදානය; යන, කියන්නාවූ; නිදන, නිදානයන්ගේ; තුන්බේදයක, භෙදත්‍රයක් වන්නේය; ඉන්, ඔවුනතුරෙන්; මදක්දක්වනු, ස්වල්පයක් දක්වනු ලැබේ; ( එහෙයින් ) වෙනනක, අන්‍යදිශාවෙක්හි; සවනත නොලා, ශ්‍රවණාන්තය නොපිහිටුවා; අසව්, ශ්‍රවණයකරව්.

9 සිල්වත් දනන්, සීලවන්ත ජනයාගෙන්; රැඳි, රඤ්ජමානවූ; නිවන්පුරදෙර, නිර්වාණපුරද්වාරය; සොල්වත්, චලනයකිරීමෙහි ප්‍රභුවූ; දුටන්, දර්ශනය කළවුන්ගේ; මන, චිත්තය; කුල්මත්, කුතුහලභාවයට පමුණුවන්නාවූ; කිඹුල්වත්නමින්, කපිලවස්තු යන නාමයෙන්; නුවරෙක්, නගරයෙක්; වී, වූයේයි.

10 මනන්ද, මනොනන්දනීයවූ; පිළිමිණිපවුර, ස්ඵටිකමාණික්‍යමයප්‍රාකාරය; (කෙසේවීදයත්) දියබඳ, විශුද්ධව්‍යරාජයා; මෙරමහිනි, මේරුමථනයෙන්; කිරි සයුරු, ක්ෂීර සාගරය; අලලන සඳ, ආලෝලනයකරනකල්හි; නැඟිදියකඳවැන්න, උද්ගතවූ ජලස්කන්ධය මෙනි.

11 දුටුවන්, දර්ශනයකළවුන්; පිරියවන, ප්‍රියවන්නාවූ; නිමල, නිර්මලවූ; සිහිලඹ, සිහිල් ජලයෙන්; සපිරිය, සම්පූර්ණවූ; එනුවර, ඒ නගරයෙහි; මහ පිරිය, මහත්වූ පරිඛාව ( දිය අගල ) ; සොරසතුරන්ට, වෛරශත්‍රුන්ට; අපිරිය කෙරේ, ප්‍රියනොකෙරෙයි.

12 විසිතුරු, විචිත්‍රවූ; තුඟු, උස්වූ; විසල්, විශාලවූ; පුර, නගරයෙහිවූ; වහසල්, රාජභවනයන්; දුටු, දුටුවන්ගේ; නෙතට, නෙත්‍රයන්ට; සුරිඳු පුර, ශක්‍රපුරයෙහිවූ; වහසල්, දිව්‍යරාජභවනයන්; තවසර, තපස්වීන්; වසන, වාසයකරන්නාවූ; පන්සල් වැන්න, කුඩාපර්ණශාලාවැනියහ.

13 සරද ගන කු — එවත්
තුඟු පහ පෙළ ලකු — එවත්
දුටත් පා වෙ — එවත්
පලායන්නට වේද පු — එවත්

14
අනගිනත් පටපි — ළි
සැදි සොඳ රත්රුවන් කි — ළි
එපුර දිළි සල්පි — ළි
කෙසේ මෙතකැයි යෙද්ද නොහැකි

15
පෙර කළ මහ පිණැ — ති
එහෙයින්ම මහ දනප — ති
දුසිරිත සිත නැව — ති
එපුර මහසල් කුලන්ගෙන් යු — ති

16
සුර පුර සුරන් ලෙ — ස
එපුර වැජඹෙන දන රැ — ස
දක තුනුසිරි විල — ස
කෙසේ යාහැකිවේද නොවල — ස

17
එහි මහ තුඟු යට — ග
බඳ ලෙල දද රුවන්ව — ග
උරගුන් ගෙණ වල — ග
නොයාහිගැසෙන ගුරුළුන් රග

---

13 සරද, සරත්කාලයෙහි; ගනකුළුවන්, මේඝකූටයෙන්; තුඟු, උස්වූ; ලකුළුවන්, අලඞ්කාරවූ; පහපෙළ, ප්‍රාසාද පඞ්ක්තිය; දුටුවන්, දර්ශනයකළවුන්ගේ; පා වෙළුවන්, පාදවේෂ්ටනය කළ හෙයින්; පලායන්නට, පැන යාමට; පුළුවන්වේද, හැකිවන්නේද; (නොහැක්කේයයනු භාවයි).

14 අනගි, අනර්ඝවූ; නැත් පටපිළි, අනෙක පට්ටවස්ත්‍රවලින් හා; රත්රුවන්, සුවර්ණ රත්නයන්ගෙන්ද; සැදි, සජ්ජිතවූ; සොඳ, සුන්දරවූ; කිළි, කුටිකාවලින් යුක්තවූ; එපුර, ඒ නගරයෙහි; දිළි, බබලන්නාවූ; සල්පිළි, ආපණශාලාවන්; කෙසේ, කවරාකාරයකින්; නොහ: කිළි, අසඞ්කුචිතව; මෙතෙකැයි යෙද්ද, මේ ප්‍රමාණයයි කිය හැකිවේද්ද; (නොහැකිවේමය යනු භාවයි).

15 පෙර, පූර්වකාලයෙහි; කළ, කරණලද්දාවූ; මහ පිණැති, මහා පුණ්‍යවන්තවූ; එහෙයින්ම, ඒ පුණ්‍ය හේතුවෙන්ම; මහ දනපති, මහා ධනපතිවූ; සිත, චිත්තයෙහි; දුසිරිත, දුශ්චරිතය; නැවති, වැලැක්කාවූ; එපුර, ඒ නගරය; මහසල්කුලන්ගෙන්, මහාසාර කුලයන්ගේන්; යුති, යුක්තවී.

16 සුරපුර, දිව්‍ය පුරයෙහි; සුරන්ලෙස, දෙවියන්මෙන්; එපුර, ඒ නගරයෙහි; වැජඹෙන, විජෘම්භමානවන්නාවූ; දන රැස, ජන සමූහයාගේ; තුනුසිරි විලස, ශරීර ශ්‍රී විලාසය; දක, දර්ශනයකොට; නොවලස, අනලස්ව; කෙසේ යාහැකිවේද, කොයි පරිද්දෙකින් ගමනයකොට හැක්කේද.

17 එහි, ඒ නගරයෙහි; මහ, මහත්වූ; තුඟු, උස්වූ; යටග, යෂ්ට්‍යග්‍රයන්හි; බඳ, බඳනාලද්දාවූ; රුවන්වග, රත්නවර්ගයන්ගෙන්සරසනලද්දාවූ; ලෙල, ලීලෝපෙතවූ; දද, ධ්වජ කේතුවිදයන්; උරගුන්, සර්පයන්ගේ; වලගගෙණ, වාලධිග්‍රහණයකොට; නොයාහි, යාහෙනො හැකිව; ගැසෙන, ගැටෙන්නාවූ; ගුරුළුන්රග; ගරුඩපක්ෂි ආකාරය දක්වී.

18 බැඳිනත් දද යට ග
පතල අවුවෙහි පුරම ග
පිළිබිඹුත් දිසි ර ග
කෙළිත මිත්රලවැනි පබළු ග ග

19
නලඟන විදුලි අ * ත්
ඉඳුනිල් මිණි සෙවෙනි ය ත්
පහගණකුළු දිලෙ ත්
එදුවු ගෙම්පුරු සතුටු නදදෙ ත්

20
පිළිමිණි බිත දිමු ත්
නළු පිළිබිඹු කෙවැනිය ත්
සුරලොවනි මෙහෙවු ත්
මොවුන් සහ නටන නළුමුළුයු

21 දිසි දෙවඟන ත් තේ
මුත්වෙනසක් නොව ත් තේ
ඇසිපිය හෙල ත් තේ
මිසක් නොදුනෙයි වෙනස උ ත් තේ

---

18 පතල, විශාලවූ; පුර මග, නගර මාර්ගයෙහි; අවුවෙහි, ආතපයෙහි; යටග, යෂ්ට්‍යග්‍රභාගයන්හි; බැඳි, බඳනාලද්දාවූ; නත්දද, අනේක ධවජයන්ගේ; පිළිබිඹුත්, ප්‍රති බිම්බයන්; දිසිරග, දෘශ්‍යමානාකාරය; (කෙසේවීදයත්) පබළු ගග, ප්‍රවාල ගඞ්ගාවෙහි; කෙළිත, ක්‍රීඩාකරන් නාවූ; මින් රළ වැනි, මත්ස්‍ය සමූහයා මෙනි.

19 නලඟන, නාටිකාඞ්ගනාවන්ගේ; අත්, හස්ත නමැති; විදුලි, විද්‍යුත්හා; ඉඳුනිල් මිණි, ඉන්ද්‍රනීලමාණික්‍යමයවූ; සෙවෙනියත්, ඡදනද; පහ, ප්‍රාසාද නැමති; ගණකුළු, මෙඝකූටද; දිලෙන්, බබලන කල්හි; එදුවු, හේ දශීනය කළාවූ; ගෙම්පුරු, ගෘහ මයූරයෝ; සතුටු, සන්තෝෂව; නදදෙත්, නාදදෙනයකෙරෙත්.

20 පිළිමිණි බිත, ස්ඵටිකමාණික්‍යමය භිත්තීන්හි; දිමුත්, දීප්තිමත්වූ; නළුපිළිබිඹු, නාටිකාවන්ගේ ප්‍රතිබිම්බයන්; කෙවැනියත්, කෙසේවීදයත්; සුරලොවිනි, දිව්‍යලොකයෙන්; මෙහෙවුත්, මේ නගරයට පැමිණ; මොවුන් සහ නටන, මේ නාටිකාවන් හා නටන් නාවූ; නළුමුළු යුත්, නාටිකා සමූහයාගෙන් යුක්තවූවාක්මෙන්වී.

21 දිසි, දෘශ්‍යමානවූ; දෙවඟනන්තේ, දිව්‍යාඞ්ගනාවන් හා; වෙනසක් නොවන්නේමුත්, විනාශයක් නොමැත්තේවීනමුත්; ඇසිපිය හෙලන්නේමිසක්, ඇසිපිය හෙලීමෙන්විනා; උන් වෙනස, ඇලාගේ විශෙෂයක්; නොදුනෙයි, අවබොධ නොවෙයි.

---

* වත් කියාද පොත්වල තිබේ.

22 එපුරෙහි වෙසෙසි නා
අඟනෝ පාළි කෙළි නා
ඇසිපිය නොහෙළ නා
සඳෙහි සුරඟනාවූය සොඳි නා

23
දෙර දෙර සිටි කද ලි
තුරු සෙවනවල මනක ලි
කුමරු කෙළකෙළ වැ ලි
බොලඳ තෙපලින් ගනිති සිතිවිලි

24
සඳපානට ඔබි න*
හෙළ සඳුන් හෙළ දුහුලි න
හෙළ මල් මුතු හරෙ න
සලෙළු සැදුමින් සරති මනමෙන

25
රන් තොරණ තැනතැ න
කලඳේ තොරණ ගණග න
මිණි තොරණ වෙනවෙ න
එපුර වැජඹේ කිරණ දිනදි න

26
දෙරණ බට විල සිත්
තරුණ ගන කුළු අහ සිත්
සරණ වන නොල සිත්
වරණ ගනසිටිතේයසතොසි

---

22 එපුරෙහි, ඒ නගරයෙහි; වෙසෙසිනා, විශෙෂයෙන්; පාළිකෙළිනා, පෙළින්පෙළ ක්‍රීඩාකරන්නාවූ; අඟනෝ, අඞ්ගනාවෝ; ඇසිපියනොහෙළනා සඳෙහි, අක්ෂිස්පන්දනය නොකරණ කාලයෙහි; සොඳිනා, යහපත්වූ; සුරඟනාවූය, දෙවඟනෝවැනිවූවෝය.

23 දෙර දෙර, වාරයක් පාසා; සිටි, පිහිටියාවූ; කදලිතුරු සෙවන වල, කෙසෙල් ගස් ඡායාවන්හි; මනකලී, මනොකල්‍යවූ; කුමරු, කුමාරයෝතුමූ; වැලි කෙළකෙළ, වාලුකා ක්‍රීඩාකොටකොට; බොලඳ තෙපලෙන්, සුරතල් වචන වලින්; සිතිවිලි ගනිති, ( අන්‍යයන්ගේ ) සිත් ගනිත්මය.

24 සඳපානට, චන්ද්‍රාලොකයටම; ඔබිනා, යොග්‍යවන්නාවූ; හෙළ සඳුන්, ශ්වෙතචන්දනය; හෙළදුහුලිනා, ශ්වෙතදුකූලය; හෙළමල්, ශ්වෙතපුෂ්ප ද; මුතුහරෙන, මුක්තාහාරය යන මෙයින්; සලෙළු, සල්ලාලයෝතුමූ; සැදෙමින්, සජ්ජිතව; මනමෙන, සිත්වූ පරිද්දෙන්; සරති, සඞ්චාරණය කෙරෙති.

25 තැන තැන, තන්හි තන්හි පිහිටියාවූ; රන් තොරණ, සවර්ණ තොරණයන්ගේද; ගණගන, සමූහ සමූහව පිහිටියාවූ; කලඳේ තොරණ, කලධෞත (රිදී) තොරණයන්ගේද; වෙනවෙන, පෘථක් පෘථක්ව පිහිටියාවූ; මිණි තොරණ, මාණික්‍ය තොරණයන්ගේද; කිරණ, කාන්තියෙන්; එපුර, ඒ නගරය; දින දින, දවසක් පාසා; නොහොත් මධ්‍යාහනයෙහි; වැජඹේ, විජෘම්භමානවේ.

26 තරුණ ගන කුළු, තරුණ මේඝ කූටයන්; අහසින්, ආකාශයෙන්; දෙරණ බට විලසින්, ධරණීයට අවතීර්ණවූවාක්මෙන්; නොලසින්, අනලස්ව; වන, වනයෙහි; සරණ, සඞ්චාරණය කරන් නාවූ; වරණගණ, හස්ති සමූහයෝ; සිතසතොසින්, චිත්ත සන්තොෂයෙන්; සිටිති, සිටිත්ය.

---

* බියෙන සංහර.

27 සයුර තුඟු තර ගේ
විලස දිසි හය සෙනා ගේ
වැද වැද උනු නෑ ගේ
එපුර නිති සරණ මහසෙන ගේ

28
බඳ සෙමර පල ගේ
සැදි තොමඳ රිය සෙන ගේ
එපුර සත සිත ගේ
කෙළිති කෙළි මඬුලු බැඳසම ගේ

29
සැදිපුල් කමලුපු ල්
තිසර බිඟු නද මනක ල්
සපිරි දිය හැම ක ල්
එපුර ඇත පිරිසිදු ගෙදිගුවි ල්

30
සපු නා ප නා යා
තල් පොල් දෙල් ම නා යා
දූක සිතු පි නා යා
උයන්වතු කවරෙක් ව නා යා

31
කර ණ පින් නර ස ක්
නර ඔා යොමා දිව ස ක්
කර නුව පින් රැ . ස ක්
පු ර යසහබටවැන් නසුරස ක්

---

27 සයුර, සාගරයෙහි; තුඟු, උස්වූ; තරගේ විලස, තරඞ්ගයමෙන්; දිසි, දෘශ්‍යමානවූ; හයසෙනගේ, අශ්වසේනාව ඇත්තේය; උනු නෑගේ, ඔවුනොවුන්ගේ ශරීරයෙහි; වැද වැද, හැපි හැපී; එපුර, ඒ නගරයෙහි; නිති, නිරන්තරයෙන්; සරණ, සඤ්චාරණය කරන්නාවූ; මහ සෙනගේ, මහා සේනාවද ඇත්තේය.

28 පලගේ, ඡදනාග්‍රයෙහි; බඳ, බඳනාලද; සෙමර, චාමරයන්ගෙන්; සැදි, සජ්ජිතවූ; තොමඳ, අමන්දවූ; රිය සෙනගේ, රථ සේනාද ඇත්තේය; එපුර, ඒ නගරයෙහි; සත, සත්වයන්ගේ; සිතගේ, සිත්වූ පරිද්දෙන්; සමගේ, සමගිව; කෙළි මඬුලු බැඳ, ක්‍රීඩා මණ්ඩල යන් බැඳගෙණ; කෙළිති, ක්‍රීඩාකෙරෙත්.

29 පුල්, පුල්ලවූ හෙවත් පිපුනාවූ; කමලුපුල්, කමලොත්පලයන් ගෙන්; සැදි, සජ්ජිතවූ; තිසර, හංසයන්ගෙන් හා; බිඟු නද, භෘඞ්ග නාදයෙන්; මනකල්, මනොකල්‍යවූ; හැමකල්, සියළු කාලයෙහි; දියසපිරි, ජලයෙන් සම්පූර්ණවූ; පිරිසිදු, පරිශුද්ධවූ; ගෙදිගුවිල්, ගෘහ තඩාගයන්; එපුර, ඒ පුරයෙහි; ඇත, ඇත්තේය.

30 සපු, චම්පකය; නා, නාගය; පනායා, කොස්ය; තල්, තාලය; පොල්, නාලිකෙරය; මනායා, යහපත්වූ; දෙල්, ලබුජය යනමෙයින් යුක්තවූ; උයන්වතු, උද්‍යානවස්තූන්; දූක, දශීණයකොට; සිතු පිනායා, චිත්තප්‍රීණනයකොට; කවරෙක්, කවරනම් කෙනෙක්; වනායා, වර්ණනාකෙරෙද්ද.

31 නරසක්, මනුෂ්‍යයන් විසින්; කරන, කරනලද්දාවූ; පින්, පුණ්‍යකම්; දිවසක් යොමා, දිව්‍යචක්ෂුස යොමුකොට; නරඔා බලා; පින් රැසක් කරනුව, පින් රැස්කරනු පිණිස; සුරසක්, ශක්‍රදෙවෙන්ද්‍රයා; පුරය සහ, නගරය හා සමාන; බට වැන්න, අවතීර්ණවූවාක් මෙනි.

32 දනන් රැඳි නොම   ඳ
සැපතින් සපිරි හැම   ඳ
එපුරෙහි මනන   ඳ
විය සුදෙවුන් නමින් නිරි   ඳ

| 33 | | 34 | |
|---|---|---|---|
| දස පව් ව | රා ලි ය | සිත පින් කා | රා ලි ය |
| දස රජ දම් පු | රා ලි ය | දුමන මුල් උදු | රා ලි ය |
| සිය කුල ස | රා ලි ය | විරූ සිරි ද | රා ලී ය |
| සතර සඟරුවත් ද | රා ලි ය | විරුදුරදනොයෙකඅසුරා | ලි ය |

35 කලා සව් උදු   ලි ය
බෝසත් සිරින්ඉසි   ලි ය
සොමි ගුණෙනි විපු   ලි ය
එරද පුත්සඳුගෙ සිරි කිය   ලි ය

---

32 නොමඳ, බොහෝකොට; දනන්, ජනයාගෙන්; රැඳි, රැඳුනාවූ; හැමඳ, සියලුකාලයෙහි; සැපතින්, සම්පත්තියෙන්; සපිරි, සම්පූර්ණවූ; එපුරෙහි, ඒ නගරයෙහි; මනනඳ, මනොනන්දනීයවූ; සුදෙවුන් නමින්, සුද්ධොදන යන නාමයෙන්; නිරිඳ, නරෙන්ද්‍රයෙක්; විය, වූයේය.

33 දසපව්, දසඅකුශල ධර්මයන්; වරලිය, ආවරණය කරවාලීය, දසරජ දම්, දශරාජ ධර්මයන්; පුරලිය, සම්පූර්ණකරවාලීය; සියකුල, ස්වකීය වංශය; සරලිය, සජ්ජිතකරවාලීය; සතර සඟරුවත්, චතුස් සංග්‍රහ වස්තූන්; දරලිය, ධාරණය කරවාලීය.

34 සිත, චිත්තය; පින්, පුණ්‍යයෙහි; කරලිය, ඇතුළත්කරවාලීය; දුමන, දෞර්මනස්‍යයාගේ; මුල්, මූලයන්; උදුරලිය, උත්පාටනය කරවාලීය; විරූසිරි, වීරශ්‍රීය; දරලිය, ධාරණයකරවාලීය; නොයෙකවිරුදු රද, අනෙක විරුද්ධ රජයන්; අසුරලිය, වලකාලීය.

35 සව්කලා, සකලකලා ශිල්පයන්ගෙන්; උදුලිය, උජ්වලිතවූ දේහෝ නොහොත්; සව්කලා, ෂොඩශ කලාවන්ගෙන්; උදුලිය, බබලන්නාවූ; බෝසත්සිරින්, බොධිසත්ව චරිතයන්; ඉසිලිය, උවහණයකලාවූදේහෝ නොහොත්; බෝසත්සිරින්, (සාවඋපන් කල ශක්‍රයාවිසින් පිහිටුවනලද) බොධිසත්වචරිතයක්; ඉසිලිය, උවහණයකලාවූ; විපුලිය, විපුලවූ; සොමිගුණෙනි, සෞම්‍යගුණයෙන් යුක්තාවූදේහෝ නොහොත්; සොමිගුණෙනි, සෞම්‍යවූරශ්මියෙන්; විපුලිය, බබලන්නාවූ; එරද, ඒරජයා; පුත්සඳුගේ, පූර්ණචන්ද්‍රයාගේ; සිරි, ශොභාව; කියලිය, කථනයකරවාලීය.

36 පෙර ගොත් මුදුන් පත්
යදියන් කරණ සුව පත්
පොබ කරණ සිය පත්
එරද නවදිවයුරු සිරින් පත්

37 දියත සිටිනා නි ති
සිවුවණිනි බැබළුම් ඇ ති
පව්දුරුකොට පැව ති
එරදසඳ මහමෙරසිරින් යු ති

39 බලවිකුමෙන් නොම ඳ
සරිකරත යුතුදිය බ ඳ
සිරිසඳ රැඳි නිබ ඳ
පවර සුදෙවුන් එනරනිඳුසඳ

38 සුරගන නමා යා
කියවූ යුතු අමා යා
රුවින් අසමා යා
බිසෝසඳ පවර මහමා යා

---

36 පෙර, පූර්වයෙහිසිට පැවතඑන්නාවූ; ගොත්, ගෞතමගෝත්‍රයාගේ; මුදුන්පත්, මස්තකප්‍රාප්තවූ ඥෙහෝ නොහොත්; පෙරගොත්, පූර්විගපවීතයාගේ; මුදුන්පත්, මුදුනට පැමිණියාවූ; යදියන්, යාචකයන්; සුවපත්කරණ, සුඛප්‍රාප්තකරවන්නාවූ ඥෙහෝ නොහොත්; යදියන්, යදනාවුන්; * සුවපත්කරණ, සැප ඇති කරවන්නාවූ; පත්, (තමාකරා) පැමිණියාවූ; සිය, සවකීය රටවාසීන්; පොබකරණ, ප්‍රබෝධකරන්නාවූ ඥෙහෝ නොහොත්; සියපත්, සතපත්‍රයන්; පොබකරණ, විකසිතකරවන්නාවූ; එරද, ඒරාජයා; නවදිවයුරු සිරින්, බාලාර්කමණ්ඩලශ්‍රීන්; පත්, ප්‍රාප්තවී;

37 නිති, නිත්‍යයෙන්; දියත, ලෝකයෙහි; සිටින, වාසයකරන්නාවූ; ඥෙහෝ නොහොත්; (ජලාන්තයන්තාක්) නිතිසිටින, නිරන්තරව පවත්නාවූ; සිව්වෙණිනි † චාතුර්වර්ණියන්ගෙන් ඥෙහෝ නොහොත් වර්ණචතුස්කයකින්; බැබළුම්ඇති, බැබලීම් ඇත්තාවූ; පව් දුරුකොට, පාපයන් දූරීභූතකොට; පැවති, පැවත්තාවූ ඥෙහෝ නොහොත්; පව්, අන්‍යවූ පවීතයන්; දුරුකොට, දූරීභූතකොට; පැවති, පැවත්තාවූ; එරදසඳ, ඒ රාජේන්ද්‍රතමයා; මහමෙරසිරින් යුති, මහාමේරුපර්වත රාජශ්‍රියෙන් යුක්තවී.

38 නොමඳ, අමන්දවූ; බලවිකුමෙන්, බලවික්‍රමයෙන්; දියබඳ, විෂ්ණුදිව්‍යරාජයාහට; සරිකරතයුතු, සමානකොට හැක්කාවූ; නිබඳ නිරන්තරයෙන්; සිරිසඳ, ශ්‍රීචන්ද්‍රිකාව; රැඳි, රඤ්ජමානවූ; පවර, උතුම්වූ; සුදෙවුන් එනරනිඳුසඳ, සුද්ධෝදන ඒ නරේන්ද්‍රතමයා.

39 සුරගන, දෙවඟනන්ලවා; නමායා, සවකීයවූ; අමායා, මැතියෝයයි; කියවූ, කියයෙව්වාවූ; අසමායා, අසමානවූ; රුවින්යුතු, රූපයෙන් යුක්තවූ; පවර, උතුම්වූ; මහමායා, මහාමායානම්වූ; බිසෝසඳ, මහෙසිකා උතුම්ය–

---

* සුයසීහකානිකායන් සැප බලාපොරොත්තුවෙන් යාඥකරණ බව මෙයින් කියත්.

† ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය සුද්‍ර යන මොහු වෙත්.)

40 අගමෙහෙසිනිය ක ර
උමා ඉසුරෙව් හැම්ව ර
සෙනෙහගස දිවුනු ක ර
වසන්තසඳ විඳ ඉසුරු නොවිත ර

41 දස පෙරුමන් නිබ ද
පිරූ බෝසත් මනන ද
සුදෙවුන් නිරිඳු ස ද
නිසා එබිසව කුසෙහි පිළිසි

42 රත් පියුම් කෙමි යෙ ක
ගත රන් රුවක් විලසෙ ක
මවු ගැබ තුල නිසැ ක
පලක්බැඳ ඉඳිමින් නොවිඅක

43 ඇමුනු පිළි මිණෙ ක
කසුන් හුයක් විලසෙ ක
පෙනෙමින් මවු ස ක
පිරුණු දසමස් උවෙත් දවස ක

---

40 අගමෙහෙසිනියකර, අග්‍රමහෙසිකාකොට; හැමවර, සියළු කාලයෙහි; උමා ඉසුරෙව්; උමාදෙවිය හා ඊශ්වරයාමෙන්; සෙනෙහස, සෙනහාධ්‍යාසය; දිවුනුකර, විගුණකොට; නොවිතර, අප්‍රමාණවූ; ඉසුරුවිඳ, ඓශ්වර්‍ය්‍යහි විඳිනයකොට; වසනසඳ, වාසයකරණ කල්හි-

41 නිබද, නිරන්තරයෙන්; දසපෙරුමන්, දසපාරම්ධර්මයන්; පිරූ, පූරණයකළ වූ; මනනඳ, මනොනන්දනීයවූ; බෝසත්, බෝධිසත්වතෙම; සුදෙවුන් නිරිඳුසඳ, සුද්ධොදනරාජොත්තමයා; නිසා, ආශ්‍රයකොට; එබිසවකුසෙහි, ඒ (මහාමායා) බිසවගේ කුක්ෂියෙහි; පිළිසිඳ, ප්‍රතිසන්ධිග්‍රහණය කොට-

42 රත්පියුම්කෙමියෙක, රක්තපද්මකර්ණිකාවෙක්හි; ගතරන් රුවක් විලසෙක, ස්වර්ණවර්ණරූපයක්මෙන්; මවුගැබතුළ, මාතෘව ගේ ගර්භය ඇතුළෙහි; නිසැක, නිඃශංකාව, අකනොවී, මඥනොව, (ඉඩඇතිව) පලක්බැඳ ඉඳිමින්, පර්‍ය්‍යඞ්කබන්ධනයකොට වැඩඉඳ-

43 පිළිමිණෙක, සඵටිකමාණික්‍යයෙක්හී, ඇමුනු, ඇමුනුවාවූ; කසුන්හුයක්විලසෙක කාඤ්චන සූත්‍රයක්මෙන්; මවුසක, මෑනියන් ගේ චක්ෂුසයට; පෙනෙමින්, දර්ශනයවෙමින්; (සිටිනා අතර) පිරුණු දසමස් උවෙත්, සම්පූර්ණ දසමාසයක්වූ හෙයින්; දවසක, එක් දිනයෙක්හි-

44 බිසෝසඳ මොනව ට
එපවත් කියා නිරිඳු ට
දෙවුදහැනම් පුර ට
නික්ම පිරිවරසමග එමවි ට

45
ගොස් දෙනුවරට මැ ද
ලුම්බිනි උයනට වැ ද
සල්තුරක් යට සො ද
නැමුනු සල්අත්තගෙණ සිටිස ඳ

46
කම්ජවා බලයෙ න
මහත් මැණිකක් විලසි න
දම්දෙසමින් යෙහෙ න
අස්නකින් බසිනා කෙනෙකු මෙ න

47
බිහිවන එබෝස තු
බඹ රන්දැලින් පිළිග තු
සිවුසුරිඳු දිමු තු
අඳුන් දිවිසම් පෙළින් පිළිග තු

48
සතුටින් ඇමති ව ර
දුහුල් සුඹුලෙන් මනහ ර
පිළිගතු කුමර ව ර
ඔවුනතින් බැසබිමට එක ව ර

---

44 බිසෝසඳ, මහෙසිකා උත්තමිය; මොනවට, මනාකොට; එපවත්, ඒ ප්‍රවෘත්තිය; නිරිඳුට, නරෙන්ද්‍රයාහට; කියා, කථනයකොට; දෙව්දහැනම්පුරට, දෙවදහනම්නගරයට; (යනුපිණිස) එමවිට, ඒ ඇසිල්ලෙහි; පිරිවරසමග, පරිවාරසෙනාව හා; නික්ම, නික්මී;–

45 ගොස්, ගමනයකොට; දෙනුවරටමැද; (දෙව්දහැකිඹුල්වත්) යන නගරද්වයට මධ්‍යයෙහිවූ; ලුම්බිනීඋයනටවැද, ලුම්බිනීනම්; උද්‍යානයට ප්‍රවිෂ්ටව; සොද, සුන්දරවූ; සල්තුරක්යට, සාලවෘක්ෂයක් හුගේ අධොභාගයෙහි; නැමුනු, (තමාගේ අතට) නැමුනාවූ; සල් අත්තගෙණ, ශාලසාඛාව ග්‍රහණයකොට; සිටිසඳ, සිටිකල්හි;

46 කම්ජවාබලයෙන, කර්මජවාතබලයෙන්; මහත්මැණිකක් විලසින, මහත්මාණික්‍යරත්නයක්මෙන්; යෙහෙන, යහපත්ව; දම්දෙසමින්, ධර්මදේශනාකොට; අස්නකින්, (ධර්ම) ආසනයකින්; බසිනා කෙනෙකුමෙන, බස්නා (ධර්මකථික) යෙකුමෙන් .

47 එබෝසතු, ඒ බෝධිසත්වයන්වහන්සේ; බිහිවන, බිහිවන කල්හී; බඹ, බ්‍රහ්මයනමේ; රන්දැලින්, ස්වර්ණජාලයෙන්; පිළිගතු, ප්‍රතිග්‍රහණයකලෝය; සිවුසුරිඳු, සතරවරම් දෙවියෝ; දිමුතු, දීප්තිමත්වූ, අඳුන්දිවිසම්පෙළින්; අඥ්ජනදීපිචර්මපාලියෙන්; පිළිගතු, ප්‍රතිග්‍රහණය කළෝය,

48 (ඉක්බිතිව) ඇමතිවර, උත්තම අමාත්‍යයෝ; සතුටින්, සන්තෝෂයෙන්; මනහර, මනොඥවූ; දුහුල්සුඹුලෙන්, දුකූලචුම්බටකයෙන්; කුමරවර උත්තම (බොධිසත්ව) කුමාරයන්; පිළිගතු, ප්‍රතිග්‍රහණයකළෝය; එමවර, ඒ ඇසිල්ලෙහි, ඔවුන් අතින් (ඒ ඇමතියන්ගේ) අතින්; බිමටබැස, භූමියට බැසලා;—

49 මහබඹු දරන, සත්
සුර අසුර නරනා සත්
කරන පුද බෝ සත්
උතුරුදිග වැඩ පියවරක් සත්

| 50 | | 51 | |
|---|---|---|---|
| අබිරු නද දුන් ස | ද | එකුමරු සිරිපු | ල |
| දෙනුවරදන නේ මනන | ද | ඉසිහට කාලදේව | ල |
| කපිල පුරවම සො | ද | වඳිනට එලවූ ක | ල |
| වඩාගෙණකුමරුන් ගියෝ සෙ | ද | ජටාවේ පිහිටියේ පදත | ල |

| 52 | | 53 | |
|---|---|---|---|
| දිනෙක වප් මඟු | ල | පෙරඩමස නිස යු | ර |
| කුමරුන් වඩා ගින වි | ට | අයුරෙන් වැඩී හැම ව | ර |
| ඉඳ දඹරු කෙහි ය | ට | බෝසත් සසිරි බ | ර |
| කෙළෙල් පෙළහර සිතූ සතුටු කො | ට | සොළොස් ඇවිරිද්දට පැමිණිව | ර |

49 මහබඹු, මහාබ්‍රහ්මයා; සත්, සේවතච්ඡත්‍රය; දරන, ධරණ කල්හි; සුර, දෙවිය; අසුර, දානවය; නර, මනුෂ්‍යය; නා, නාගය; යන මොවුන්; බෝසත, මහාබෝධිසත්වයන්ට; පුදකරන, පූජාකරණ කල්හි; උතුරුදිග, උත්තරදිශාභාගයට; සත්පියවරක්, සප්තපදවාරයක්; වැඩ, වැඩමවා-

50 අබිරුනද, අභිරූප (උත්තම) නාදය; දුන්සද, දුන්නාවූකල්හි; දෙනුවර (කපිලදෙව්දහ යන) නගරවාසීජනයෝ; මනනඳ, චිත්තසන්තෝෂයෙන්; සොඳ, සුන්දරවූ; කපිලපුරවම, කිඹුල්වත් පුරයටම; සෙද, වහා; කුමරුන්, කුමාරයන්; වඩාගෙණගියෝ, වඩාගෙණගියෝය.

51 සිරිපුල, ශ්‍රීයාවෙන්මහත්වූ; එකුමරු, ඒ කුමාරයා; කාලදේවල ඉසිහට, කාලදේවල නම් සෘෂිතාහට; වඳිනට, වන්දනය කිරීමට; එලවූකල, සමීපයට පෑකල්හි; පදතල, පාදතල (යුග්මය) ජටාවේ පිහිටියේ, දූලූ ජ්ගි ප්‍රතිෂ්ඨිතවූයේය-

52 දිනෙක, එක්දවසෙක්හි; වප්මඟුලට, වප්පමඞ්ගලයට; (සීසාන මඟුලට) කුමරුන්, කුමාරයන්; වඩාගිනවිට, වඩාගෙණගියකල්හි; දඹරුකෙහි යට, ජම්බුවෘක්ෂයෙහි යටත්භාගයෙහි; ඉඳ, නිසීදනයකොට; සිතූසතුටුකොට, චිත්තසන්තෝෂකොට; පෙළහරකෙළෙල්, ප්‍රාතිහාර්‍ය කළසේක-

53 සසිරිබර, ඓශ්වර්‍යභාරවූ; බෝසත්, මහාබොධිසත්වතෙම; හැමවර, සියලුකාලයෙහි; පෙරඩමස, පූර්වාධිමාසයෙහි; නිසයුරු අයුරෙන්, නිශාකරයාගේ ආකාරයෙන්, ගෙවුන්; චන්ද්‍රයාමෙන්, වැඩී; වර්ධනයවෙමින්, සොළොස් ඇවිරිද්දට පැමිණිවර; ෂොඩශ වර්ෂයට ප්‍රාප්තකල්හි-

54 හිම ගිම් වසන් ය  න
තුන් ඉරුතුවට වෙන වෙ  න
තුන්පායක් යෙහෙ  න
ලෙසට කරවා එනරනිඳු දි  න

55
* නිවන් සිදුහත්  වූ
එකුමරුට සිරිමත්  වූ
සම්කුලෙනි යුත්  වූ
බිසෝකෙනෙකුන් ගෙණෙනසිත්  වූ

56
උවන සිසි බිම්  බා
පියකරණ රණ බිම්  බා
ලවන පල බිම්  බා
සදිසිසිරිබර බිසව් බිම්  බා

57
සිදුවනුය නියති  න්
පෙරවාසනා පණති  න්
යෙදූ සුබ මොහොති  න්
සරණපාවා දුන් නු සිරිති  න්

58
මෙ මිනිස්ලොව අස  ම
යසස් දුරුවෙන් මන ර  ම
බිම්බා බිසව් එ  ම
යසෝදරයයි ලූ දෙවෙනිනා  ම

---

54 හිම ගිම් වසන් යන, හෙමන්ත, ගිම්හාන, වසන්ත, යන; තුන් ඉරුතුවට, ත්‍රිවිධඍතුන්ට; වෙන වෙන, පෘථක් පෘථක් වශයෙන්, හෙවත් වෙන්වශයෙන්; තුන්පායක්, ප්‍රාසාදත්‍රයක්; එනරනිඳු, ඒ නරේන්ද්‍රයා; යෙහෙන ලෙසට කරවා, යහපත් ආකාරයෙන් සාදවා; දින, දුන්නේය–

55 නිවන්, ඥාණවන්තවූ; සිරිමත්, ශ්‍රීමත්වූ; සිදුහත් එකුමරුට; ඒ සිද්ධාර්ථකුමාරයාහට; සම්කුලෙනියුත්වූ, සමානකුලයෙන් යුක්තවූ; බිසෝකෙනෙකුන්, මෙහෙසිකාවක්; ගෙණෙනසිත්වූ, ගෙණඊමට සිතක් පහළවූයේය.

56 උවන, වක්ත්‍රය කරණකොටගෙණ, සිසිබිම්බා, චන්ද්‍රබිම්බය සමානවූ; රණබිම්බා, ස්වර්ණප්‍රතිමාවක් මෙන්; පියකරණ, ප්‍රිය උපදවන්නාවූ; ලවන, දෙතොල; බිම්බාපලසදිසි, බිම්බුපලසමානවූ; (පැහැ ඇති) සිරිබර, ශ්‍රීභාරවූ; බිම්බාබිසව, බිම්බා නම් මෙහෙසිකාව, හෙවත් යසෝධරා දේවිය–

57 පණතින්, ප්‍රඥප්තියෙන්; පෙරවාසනා, පූර්වවාසනාව; සිදුව නුය, සිද්ධවීම; නියතින්, නිත්‍යයෙන්වෙයි; යෙදූ, යොජිතවූ; සුබමොහොතින්; සුභමුහුර්තයෙන්; සිරිතින්, සිරිත්ප්‍රකාරයෙන්; සරණපාවා දුන්නු, සරණපාවා දුන්නේය–

58 මෙමිනිස්ලොව, මේ මනුෂ්‍යලෝකයෙහි; අසම, අසමවූ; යසස් දුරුවෙන්, යසස්දුරුහෙයින්; මනරම, මනොරම්‍යවූ; එම බිම්බාබිසව්, ඒ බිම්බාමෙහෙසිකාවට; යසෝදරයයි, යසෝධරායයි කියා; දෙවෙනි නම, විතීය නාමයක්; ලූ, තැබුවේය—

---

( * නිවන් සිදුහත් කියා සමහර පොත්වල පෙනේ.)

59 ඌරුවෙස් ග ත් තෙත්
දියබඳව නොකමැ ත් තෙත්
සිරිසඳ එකැ ත් තෙත්
වසනවැනි මොහු කෙරෙකැමැත්තෙත්

60

සම්සළු මිනිස් පා
ඇඳගෙණ වියරු වෙස් පා
හැරඉත් කෙලෙස් පා
උමා සෙව්නෙව් මහපුරිස් පා

61

සුළුදුනු දූරු ද
සිගල්වෙස් ගත් වර ද
සිහිනෙහෙරෙමින් එ ද
සුරිඳු හැර ආ සුරගනක් ද

62

ඉසුරුගෙ දල නෙ ති න්
දුවූවෙත් අනඟ නිය ති න්
රති ඔහුකෙරෙ කැ ති න්
වසනවැනි මොහු කෙරේ සත ති න්

63

සවත් සඟ සිව්ව ත්
කිවත් නොගෙවන සිරිම ත්
රුවත් ගුණ බලව ත්
තවත් වනතත් අනනමයි ව ත්

---

59 ඌරුවෙස්ගත්තෙත්, සූකරවෙසග්‍රහණය කළහෙයින්; (විෂ්ණුසූකර අවතාරයගත්නිසා;) දියබඳව, විෂ්ණුදිව්‍යරාජයාහට; නොකමැත්තෙත්, අකමැතිව; සිරිසඳ, ශ්‍රියාකාන්තාව; එකැත්තෙත්, ඒකාන්තයෙන්; මොහුකෙරෙහි, මේ සිද්ධාර්ථකුමාරයා කෙරෙහි, කැමැත්තෙත්, කැමතිව; වසනවැනි; වසන්නාක් වැනිවීය,

60 සම්සළු, වම්ශාටකය; ඇඳ, අඩ්ඩාදනයකොට; මිනිස්පා, මනුෂ්‍ය ශිෂ්පාත්‍රය; ගෙණ, ග්‍රහණයකොට; වියරුවෙස්, විකාරවේසයන්; පා, ප්‍රකාශකළහෙයින්; ඉත්, එයින්; කෙලෙස්පා, කෙලාශපර්වත යෙහිවූ මහාදෙවියා; හැර, දුරුකොට; උමා, උමාදෙවිය; මහපුරිස්පා. මහාපුරුෂපාදයන්; සෙව්නෙව්, සෙව්නාක් වැනිවීය—

61 සුළුදුනුදූරුද, චුල්ලධනුර්ධරජාතකයෙහිදී; සිගල්වෙස්ගත් වරද, ශෘගාලවේසයගත්වරද; එද, ඒකාලයෙහි; සිහිනෙහෙරෙමින්, සමරණයකොට; සුරිඳුහැර, ශක්‍රයා අත්හැර; ආ, ආවාවූ; සුරගනක්ද, දිව්‍යාඞ්ගනාවක්දෝ—

62 ඉසුරුගෙ, ඊශ්වරයාගේ; දලනෙතින්, දෘෂ්ටිනෙත්‍රයෙන්; නිය තින්, නියතයෙන්; අනඟ, අනඞ්ගයා; දුවූවෙත්, දැවූහෙයින්; රති රතිනම්දිව්‍යාඞ්ගනාව; ඔහුකෙරෙ,ඒ ඊශ්වරයාකෙරෙහි; කැතින්, අකාමැත්තෙන් (අවුන්) මොහුකෙරේ, මේ( සිදුහත්කුමරා) කෙරෙහි, සතතින්, ඒකාන්තයෙන්; වසනවැනි, වාසය කරන්නාක්වැනිවීය;

63 සවත්සඟ, ෂන්මුඛයාහා; (කතරගමදෙවියාහා;} සිව්වත්, චතුර්මුඛයාද; (මහාබ්‍රහ්මයාද) යන මොහු; කිවත්, කීයේනමුත්; නොගෙවන, නොගෙවන්නාවූ; සිරිමත්, ශ්‍රීමත්වූ; රුවත්, රූපවත්වූ; ගුණ (යහපත් ගුණය හා; බලවත්, ශක්තිවන්තවූ (ඒ යශෝදරා දේවිය) තවත්වනතත්, වැඩියක් වර්ණනාකරත් හොත්; වත්, ප්‍රභූවුයේනම්; අනනමයි, අනන්තයාමැයි—

64 එබිසව සහ නිත — ර
සිදුහත් කුමරු මනහර — ර
සිතුපෙම් දියුණු කැ — ර
මහත් සැපතින් යුතුව දවසැ — ර

65
තෙවරෙක බුදුකු — රු
උයන්කෙළියට යතු — රු
කරණසඳ එමු — රු
මවා පෑ ජර රෝග මල — රු

66
දුක කලකිරී සි — ත
නුවරට ගොසින් නොනැව — ත
සතර වෙනි වර ය — ත
මවා පෑ මහණරුවදුක * නෙ — ත

67
කසවත් පා දු — රු
සත්සුන් වෙසට සොඳු — රු
කැමතිව බුදුකු — රු
උයන් කෙළියට කෙලේය තු — රු

68
රාහුල මවූ එස — ද
පුත්රුවන වැදුවා සො — ද
එපවත් කියා ර — ද
ගමන්කරවී දූතයෙකු ඉද — ද

---

64 මනහර, මනොඥවූ; සිදුහත්කුමරු, සිද්ධාර්ථකුමාරයාණන්; වහන්සේ; නිතර, අනවරතයෙන්; එබිසවසහ, ඒ යසෝදරා නම් මෙහෙසිකාවන් හා; සිතුපෙම්, චිත්තප්‍රෙමය; දියුනුකැර විගුණ කොට; මහත්සැපතින් යුතුව, මහාසම්පත්තියෙන් යුක්තව; දවසැර දිවශාතික්‍රමණයකොට—

65 බුදුකුරු, බුඩාංකුරයාණන්වහන්සේ; උයන්කෙළියට, උද්‍යාන ක්‍රිඩා පිණිස; තෙවරෙක, තුන්වාරයෙක්හිම; යතුරුකරණසඳ, යාත්‍රාකරණකල්හි; (වඩිනකල්හි) එමුරු ඒ දෙවතාවෝ; මවාපෑ, නිර්මිතකොට පෙන්නුවාවූ; ජර රෝග මලරු, ජීර්ණ රෝග මෘත යන රූපයන්—

66 දුක, දුශ්ඛිතයකොට; සිත, චිත්තය; කලකිරී, උත්කණ්ඨිතව; නොනැවත, නොනැවතී; නුවරට ගොසින්; නගරයටගොස්; සතර වෙනිවර, සිවුවෙනිවාරයෙහි; යත, වඩිනාකල්හි; මවාපෑ, නිර්මිත කොට; පෙන්නුවාවූ; මහණරුව, ශ්‍රමණරූපය; නෙත, නෙත්‍රයෙන්; දුක, දුශ්ඛිතයකොට—

67 බුදුකුරු, බුඩාංකුරතෙම; කසවත්, කෂාවස්ත්‍ර(ඇත්දවූ)පාදුරු පාත්‍රධාරීවූ; සොඳුරු, සුන්දරවූ; සත්සුන්වෙසට, සංසිඳුනාවූ වෙශයට; කැමතිව, ආශාව; උයන්කෙළියට, උද්‍යාන ක්‍රිඩාවට; යතුරු කෙලේ, යාත්‍රාකලසේක—

68 එසඳ, ඒකාලයෙහි; රාහුලමවූ, රාහුලමාතෘතොම; සොද, සුන්දර වූ; පුත්රුවණවැදූවා, පුත්‍රරත්නය වැදීය යයි; රද, (සුදොවුන් මහ) රජතෙමේ; එපවත්, ඒ පුවෘත්තිය; කියා, කථනයකොට; සෙද, වහා; දූතයෙකු, පතිවිඩකාරයෙකු; ගමන්කරවී, ගමන්කරවූයේය-

69 එහොසිත් ඇසිල් ලෙස
උපතිය රහල්පිල් ලෙස
කීයද ඇසිල් ලෙස
මේත් එක්සසර දුවවිල් ලෙස

70
කියමින් නික් මෙ මින්
මඟුල් රථයට නැගෙ මින්
සෙනඟ පිරිවර මින්
එපුර මහවේ ගෙවා වඩි මින්

71
කිසාගොතමි සි ත
තුටුව රූව දුක ඔහු වෙ ත
කීගයකට නැව ත
තුටුව මුතුහර දෙමින් බෝස ත

72
රජගෙට පිවිසි ලා
නළඟණ රැගුම් දුක ලා
සිතසතුටක් නො ලා
සතරපෙර නිමිති සිහි කර ලා

73
ඉඳ යහන ම ත් තේ
රජසැපත නොකමැ ත් තේ
පලයනු කැමැ ත් තේ
බලාකාවරෙක්ද දොර ඇ ත් තේ

---

69 එහොසත්, එගමනයකොට; ඇසල්ලෙස, ඇසිල්ලෙක්හි! රහල්පිල්ලෙස, රාහුල නම් කුඩ කුමරෙක; උපතය, උපන්නේයයි; ඇසිල්ලෙන, වහා; කීසඳ, කථනයකළ කල්හි; මේත්, මේ (කුමාර යාගේ) උපපත්තියත්, එක; එක්තරා; සසර දුවවිල්ලෙස, සංසාර යෙහි දුවවීමට කරුණකැයි,

70 කියමින්, කථනයකරමින්; නික්මෙමින්; නිස්ක්‍රාන්තව; මඟුල් රථයට නැගෙමින්, මංගලරථයට ආරූඪව; සෙනඟ, සේනාවන්; පිරිවරමින්, පිරිවරා; එපුර, ඒ නගරයෙහි; මහවේ, මහාවීථිය; ගෙවා, ඉක්මපකොට; වඩිමින්, වැඩමවනකල්හි;–

71 කිසාගෝතමි, කිසාගෞතමීයගේ; සිත, චිත්තය; ඔහුවෙත, උන්වහන්සේ කෙරෙහි; රූවදුක, රූපදර්ශනයකොට; තුටුව, තුෂ්ටවී; කීගයකට, * කියනලද ගාථාවකට; නැවත, නැවතත්; බෝසත, මහාසත්වතෙම; තුටුව, තුෂ්ටව; මුතුහරදෙමින්, මුක්තාහාර දානයකොට–

72 රජගෙට, රාජගෘහයට; පිවිසිලා, ප්‍රවිෂ්ටව; නළඟණ, නාටිකාඞ්ගනාවන්ගේ; රැඟුන්, නෘත්‍යයන්; දුකලා, දර්ශනයකොට; සිත, චිත්තයෙහි; සතුටක්, සන්තුෂ්ටභාවයක්; නොලා, නොකොට; සතරපෙරනිමිති, චතුර්විධ පූර්වනිමිත්තයන්; සිහිකරලා, සමරණයකොට–

73 යහන මත්තේ, සයනමතුයෙහි; ඉඳ, නිසිදනයකොට; රජසැපත, රාජසම්පත්තිය; නොකැමැත්තේ, අකමැතිව; පලයනු කැමැත්තේ, පලායන අභිමතයෙන්; දොරඇත්තේ, දොරසමීපයෙහි ඇත්තේ; කවරෙද්ද? කවරඅයෙක්දැයි; බලා, අවලෝකනයකොට

---

( * දුකවෙත යයිද පොත්) * නිබ්බුතා නූන සාමාතා. යනාදිගයයි

74 එලිපතට ඉස ලා
ඔත් සන්මැතිඳු දැක ලා
පියබසිනි ඔහු ලා
අසකු සදමින් ගෙණෙව තෙප ලා

75
කුමරු දැක ඔ ත්තේ
එම් යන සිත ඇ ත්තේ
ගොසින් එලිප ත්තේ
සිටම ඔහුදැකලා නැවැ ත්තේ

76
සන්මැතිසඳ එස් ද,
ගොසින් කන්තකහයර ද
සදගෙණවුත් සෙ ද
නැගෙණලෙස දූන්විය පදවැඳ

77
බෝසත් දිනිඳු ගති
අසුපිට නැගී ඉඳ ගති
සත් වාලදිය ගති
තුරඟු පුරමග යෙහෙන් දිවගති

78
දෙවියන්හල දෙ රින්
*නික්මු සෙද ගොස් නුව රින්
තිස්යොදුනක් දු රින්
ගෙවාගොස් එකරැයක්විතරින්

74 එලිපතට, දෙහලියට; ඉසලා, හිසතබා; ඔත්, සයනය කළාවූ; සන්මැතිඳු, ඡන්න නම් අමාත්‍යයා; දැකලා, දර්ශනය කොට; ඔහුලා, ඔහට; පියබසිනි, ප්‍රියවූ වචනයෙන්; අසකු, අශ්වයෙකු; සදමින්, සර්ජිතකොට (සරසා) ගෙණෙව, ගෙණඑවයි; තෙපලා, කියා:—

75 ඔත්තේ, සයනයකළාවූ; කුමරුදැක, කුමාරයා දර්ශනය කොට; එමියන, ආගමනය කෙරෙමි යන;සිතඇත්තේ, සිත්ඇතිව; ගොසින්, ගමනය කොට; එලිපත්තේ සිටම, දෙහලියෙහි වැඩසිටම; ඔහුදැකලා, එකුමාරයන් දර්ශනයකොට; නැවැත්තේ, නැවතුනසේක:—

76 එසඳ, එකල්හි; සන්මැතිසඳ, ඡන්න නම් අමාත්‍යයා; ගොසින්, ගමනයකොට; කන්තකහයරද, කන්ථකනම් අශ්වරාජයා; සෙද, වහා; සදගෙණවුත්, සරසාගෙණවිත්; නැගෙණලෙස, ආරූඪවනුපරිද්දෙන්; පදවැඳ, පාදවන්දනයකොට; දූන්විය,දූන් වූයේය:—

77 †දිනිඳුගති,සූර්‍ය්‍යයාටබඳුවූ තෙජසක්ඇත්තාවූ;බෝසත්, මහාසත්වතෙම; අසුපිටනැගී; අශ්වයාගේ පිටට ආරූඪව; ඉඳගති, වැඩහුන්සේක; සත්, ඡන්නයාලවා; වාලදිය, වාලධිය (වල්ගය) ගතී, ග්‍රහණය කරවූසේක; තුරඟු, අශ්වයා; පුරමග, නගරයෙහි වූ මාර්ගය; යෙහෙන්, යහපත්ව; දිවගති, ධාවනයකෙළේය.

78 දෙවියන්, දෙවතාවන් විසින්, හළ, හරණලද; දෙරින්, වාරයෙන්;නික්ම,නිස්ක්‍රාන්තව;සෙද, වහා; නුවරින්, නගරයෙන්; ගොස්, ගමනයකොට; දුරින්, දූරයෙන්; තිස්යොදුනක්, තිංසද්‍යොජනයක් පමණවූ මාර්ගය; එකරැයක් විතරින්, එකාව රාත්‍රියක් පමණින්; ගෙවා, ක්‍ෂෙපකොට; ගොස්, වැඩමවා;

* නික්ම දිවගොස් නුවරින්. පොත්
† දිනිඳුගතියනු අශ්වයාටද විශෙෂණකොට කියහැකිවෙයි. එකල සූර්‍ය්‍යයාට බඳු ගමන් ඇතියයි අර්ථ කියයුතුයි.

79 පුලුලැති ඉසුබුඅ. ට
අනෝමා නම් නදිය ට
පැමිණ අසු සන්කො ට
නැගු පිඹිමෙන් පැමිණ එතර ට

80
අසුපිටින් බැස ලා
සන්මැතිඳු අමතා ලා
පියබසින් තෙප ලා
අසුද බරණද බාරකර ලා

81
සුරතින් කඩුව ගෙ ණ
වමතින් කෙස්වැටියගෙ ණ
සිඳ අහස දමමි ණ
බඹහු දුන් තුන්සිවුරුදරමි ණ

82
සන්මැතිඳ තො ගො සින්
දෙමවුපියහට මබ සින්
නිදුක් බව වෙසෙ සින්
*කියසිමෙහෙයාපුරටනොලසින්

83
අනුපිය නම් ල ද
අඹවෙනෙහි සතියක්ඉ ද
තිස්යොදුනක් නොම ද
ගෙවාගොස් මහරජගහා වැ ද

---

79 අටඉසුබු. අෂ්ටවෘෂභයක් පමණ; පුලුල්ඇති, පලල ඇත්තාවූ; අනෝමානම්නදියට, එනම්ගංගාවසමීපයට; පැමිණ, ප්‍රාප්තව; අසු, අශ්වයාහට; සංකොට, සංඥකොට; නැගුපිම්මෙන්; නගනලද්පිම්මෙන්ම; එතරට, පරතීරයට (එගොඩට) පැමිණ, පැමිනිලා:—

80 අසුපිටින්, අශ්වයාපිටින්; බැසලා, බැස; සන්මැතිඳු, ඡන්නනම් අමාත්‍යයාහට; අමතාලා, ආමන්ත්‍රණය කොට; පිය බසිනි, ප්‍රියවූ වචනයෙන්; තෙපලා, කථාකොට; අසුද, අශ්වයාද; බරණද, ආභරණයන්ද; බාරකරලා, භාරකොටදීලා:—

81 සුරතින්, දක්ෂිණ හස්තයෙන්; කඩුව, ඛඩ්ගය; ගෙණ, ග්‍රහණයකොට; වමතින්, වාම හස්තයෙන්; කෙස්වැටිය, කෙස කලාපය; ගෙණ, ග්‍රහණයකොට; සිඳ, ඡේදනයකොට; අහසදම මිණ, ආකාශයටදමා; බඹහු, බ්‍රහ්මයාවිසින්; දුන්, පිළිගන්වනලද; තුනසිවුරු, තිචීවරය; දරමිණ,ධාරණයකොටගෙණ;(පැලඳ)

82 සන්මැතිඳ, ඡන්නාඅමාත්‍යය; තො, යුෂ්මත්; ගොසින්, (නුවරට) ගොස්; දෙමවුපියහට, මව්පිය දෙදෙනාහට; මබසින්, මාගේවචනයෙන්; නිදුක්බව, (මාගේ)නිරෝගීභාවය;වෙසෙසින්, විශේෂයෙන්ම; කියසි, කථනය කරවයි(කියා) නොලසින්, වහා; පුරට, (කිඹුල්වත්)පුරයට; මෙහෙයා, (පිටත්කර)යවා:—

83 අනුපියනම්ලද, අනුපියයනනාමයලද්දාවූ; අඹවෙනෙහි, අම්බවනයෙහි; සතියක්, සප්තාහයක්; ඉඳ, නිසීදනයකොට; තිස් යොදුනක්, තිංසයොජනයක්; නොමඳ, අමන්දව; ගෙවා, (මාගීය) ක්ෂෙපකොට; ගොස්, වැඩමවා; මහරජගහාවැද, රාජගෘහනම් මහානගරයට්ප්‍රවිෂ්ටව:—

---

* කියව මෙහෙයා පුරට නොලසින්, පොත්.

84 එනුවර සිහාළ ද
ඇඹිලිලි අහර එමස ද
පාඬවසෙවන ඉ ද
වළඳවා උරුවෙල් දනව් වැ ද

85
වීරිය කොට උ දක්
දුක්විඳ සාවුරුද් දක්
බුදුවන්නට ලෙ දක්,
නොදූක සැපදී ගතට නොමදක්

86
උරුවෙල් දනවු හි ම
සේනානි නියම්ග ම
සුජාතාවන් න ම
එලෙවු කිරිබත්යදුම් ලෙසටම

87
අජපල් නුගයග න
සෙවන වැඩ ඉඳ පිළි ගෙ න
නේරංජරාය න
ගංතෙරට වැඩ එබත් බුදිමි න

88
තලිය උඩුගංකො ට
හරිමින් නිමිති දක්න ට
අසල්සල් වනය ට
ගොසින් වැද දහවල් විසිම ට

---

84 එනුවර, ඒ නගරයෙහි; සිහාළද, භික්ෂාටනයෙන් ලැබුවාවූ; ඇඹිලිලිඅහර, මිශ්‍රආහාරය; එමසද, එකල්හි; පාඬවසෙවන, පාණ්ඩවනම් පර්වතච්ඡායාවෙහි; ඉඳ,නිසිදනයකොට,වළඳවා; අනුභවකොට; උරුවෙල්දනව්, උරුවෙලනම් ජනපදයට; වැද, ප්‍රවිෂ්ටව:—

85 උදක්, තනිවම; වීරියකොට, උත්සාහකොටත්; සාවුරුද් දක්, සට්වෂීයක් මුලුල්ලෙහි; දුක්විඳ, දුක් අනුභවකොට; බුදුවන් නට,බුධත්වයටපැමිනිමට; ලෙදක්,ආකාරයක්; නොදූක,(උපායක්) දශීනයනොකොට; නොමඳක්, අමන්දව; ගතට, ශරීරයට; සැපදී, සුඛදානයකොට:—

86 උරුවෙල්දනව්හිම, උරුවෙල ජනපදයෙහිම; ,සේනානි නියන්ගම්,සේනානීනම්නිගමග්‍රාමයෙහි;(මහගමෙහි)සුජාතාවන්, සුජාතානම් සිටුදුවනිය විසින්; තම, තමන්ගේ; යදුම්ලෙසටම, යාඥවවූපරිද්දෙන්ම; (බඃරවූ පරිද්ම) එලෙවු, පිළිගන්වනලද; කිරිබත්, ක්ෂීර පායාසය:—

87 ගන, ඝණවූ ඡායාවෙන් යුක්තවූ; අජපල්නුගය, අජපාල නම් නිග්‍රොධ වෘක්ෂයාගේ; සෙවන, ඡායාවෙහි; වැඩහිඳ, නිසීදනයකොට; පිළිගෙණ, ප්‍රතිග්‍රහණය කොට; නේරන්ජරා යන, නේරංජරානම්වූ; ගංතෙරට, ගංගාතීරයට; වැඩ, වැඩම කර; එබත්, ඒ (කිරි) බත; බුදිමිණ, වළඳා:—

88 තලිය, මලාව; උඩුගංකොට, ගංගාවගේ උඩදිශාවට; නිමිතිදක්නට, නිමිතිදක්නා පිණිස; හරිමින්, යවා; අසල්, සමීපයෙහිවූ; සල්වනයට, සාලවනයකරා; ගොසින්, ගමනය කොට; දහවල් විසිමට, දිවාවිහාරය සඳහා; වැද, ප්‍රවිෂ්ටව:—

89 සවස්නල වදිමි ත *
මල්පෙති හෙත තැතින් තැ ත
සුසැදූ මහ වති ත
යමින් එකෙසර කෙසර විලසි ත

90 91
පෙරට එන තණ ගෙ ණ පෙරබුදුවරන් හැ ම
සොත්තිය නමැත්තහු ගෙ ණ කෙලෙසුන් පසුන්කල බි ම
තණ අටමිටක් ගෙ ණ සලත තණ එවිට ම
+ගොසින්බෝමැඩ අරාසිට ගෙ †නැගුනුවිදුරස්නේපිණින් තම

92 බෝතුරට පිට ලා
සතර අදිටුන් බැඳ ලා
නොවී කිසි සස ලා
ඉඳිත ඔහුබුදුබවෙහිලොබ ලා

---

89 සවස් නල, සවස්කාලයෙහි වූසුලඟ; වදිමිණ, වැදීමෙන්; තැතින්තැන, ඒ ඒ තන්හි; මල්පෙති, පුෂ්ප පත්‍රයන්: හෙත; පතිතව; සුසැදූ, මහාකොටිසරසතලද; මහවතින,මහාමාර්ගයෙන්; එකෙසර, ඒ කවාරිදූ; කෙසරවිලසින, කෙසරසිංහරාජයෙකු මෙන්; යමින්, ගමනයකරණ කල්හි:—

90 තණගෙණ, (කුස) තෘණග්‍රහණය කොට; පෙරටඑන, ඉදිරියෙන් එන්නාවූ; සොත්ථිය නමැත්තහුගෙණ, සොත්ථිය නම් (බමුණා)ගෙන්; තණ, තෘණසම්බන්ධවූ; අටමිටක්, අෂ්ටමුෂ්ටියක්, ගෙණ, පිළිගෙණ; ගොසින්, (ඉදිරියට) ගමන්කොට; බෝමැඩ අරා, බොධිමණ්ඩපයට ආරූඪව; සිටගෙණ, වැඩසිටලා:—

91 පෙර, පූර්වයෙහි; හැමබුදුවරන්, සකලබුදුවරයන් වහන්සේලාම; කෙලෙසුන්, කෙලෙසයන්; පසුන්කල, ප්‍රව්‍රජ්‍යාකාලාවූ; බිම, භූමියෙහි; තණ, තෘණයන්: සලත, සලනාකල්හි; එවිටම, එඇසිල්ලෙහී; තම, තමන්වහන්සේ විසින් පුරුදුකරණලද දස පාරමිතාවන් පිළිබඳවූ; පිණින්, පුණ්‍යයෙන්; නැගුනු, උද්ගතවූ; විදුරස්නේ, වජ්‍රාසනයෙහි:—

92 බෝතුරට, බොධිවෘක්ෂයට; පිටලා, පෘෂ්ඨයකොට; සතර අදිටන්, චතුර්විධ අධිෂ්ඨානයන්; බැඳලා, බඩකොට; කිසි සසලා, කිසිම්වංචලයක්; (සෙලවීමක්) නොවී, නොව; ඔහු, උන්වහන්සේ; බුදුබවෙහි, බුද්ධත්වයෙහි; ලොබලා, ආසාකොට; ඉඳිත; වැඩහිඳිනාකල්හි:—

---

* සවස්වත එම දි ත සුසැදූ මහවති ත
දෙවියන් විසින් සතොසි ත ගොසින් කේසර සිංහවිලසි ත

මේ අනුමට එකපොතක පමණක් මේ කව තිබුනා මෙසේ වැඩියක් ගැලපේයයි අප අදහසයි.

+ බෝමුලඅරා පොත්. †දනවිවෙම කියා පොත්.

*නොදන්නාල කියනුකිමියාපත්පොත්.

93 එදූක මරු දෙව්පු ත්
බුදුවේය අද සිදුහ ත්
†බුදුබව සිදුළුවෝ ත්
මගේ අදිපති කමක්නම් නැ ත්

94 සිදුහත් මගෙ විසය
ඉක්ම වන්නට අ විසය
මගෙ තෙපුල් ගි විසය
නික්ම පලයයි කියා ඇ විසය

95 ගොස් මරසෙනඟ වෙ ත
දුක්ව පවසන වසව ත
×ගුගුලහඬ පවස ත
පොළොව දෙපලුව පැලෙනවිතර

96 හිමිසඳ දුකනොසි ත
ඔහුපලවනු එකා ඇ ත
කී සඳ නොදෙඩ මැ ත
එතෙම නාරායන බලෙන්යු ත

93 මරුදෙව්පුත්, මාරදිව්‍යපුත්‍රයා; එදූක, එදශීනයකොට, අද, අදදිනයෙහි; සිදුහත්, සිඬාර්ථකුමාරයා, බුදුවේ; බුඬත්වයට, පැමිණෙන්නේමය, බුදුබව, බුඬත්වය; සිදුළුවොත්, සිඬවූයේනම්, මගේ; මාගේ; අදිපතිකමක්නම්, අධිපතිභාවයෙක්නම් නැත්, නැත්තේය.

94 සිදුහත්, සිඬාර්ථය; මගෙවිසය, මාගෙවිෂය; ඉක්මවන්නට, ඉක්මවාලන්නට; අවිසය, විෂයනොවෙයි; (පොහොසත්නොවෙයි; (එහෙයින්;) මගෙතෙපුල්, මාගේවචනයන්; ගිවිසය, අසව; නික්ම පලයයිකියා (මින්) නික්මීදුවවයි කියා; ඇවිසය, ඇස් වූයේය.

95 මරසෙනඟවෙත, මාරසේනාවකරා; ගොස්, ගමනය කොට; වසවතු, වසවර්තිදිව්‍යපුත්‍රයා; දුක්ව, දුඃඛිතව; පවසනු, ප්‍රකාශ කරණකල්හි; ගුගුල, ගර්ජනාකළවූ; හඬ, ශබ්දය; පවසන, ප්‍රකාශ කරත්ගොත්; පොළොව, පෘථුවිය; දෙපලුව, දෙපලුවී; පැලෙන විතරන, ප්‍රදෘනයවීමක් මෙන් වූයේය;

96 (එකල්හි) හිමිසඳ, ස්වාමීන්ද්‍රයානෙනි; දුකනොසිත, දුක් නූන මැනවි; ඔහුපලවනු, ඔහුඑලවීමට; එකාඇත, අප අප ගෙන් එකෙකිම ප්‍රමාණකොට ඇත්තේයයි; කී සඳ, කිකල්හි; මැන නොදෙඩ, කයිවාරු කථානොකරව්යයි කියා; එතෙම, ඒ සිදුහත් කුමරතෙමේ; (නාරායනබෙලෙන්යුත, නාරායන බලයෙන් යුක්තවූ වෙකැයිද කියා:—

† නොදත්කල කියනුකීමයාපත් පොත්.
× ගුගුළහඬ නොතැව ත
ගුගුලවිතරන අහස දෙරණන මෙසේද පොත්

97 පසු නොලා අ ඞියෙනි
විකුම් බලපා වැ ඞියෙනි
ගොසින් සිත එ ඞියෙනි
ගතිව් සිදුහත් කුමරු දූ ඞියෙනි

98

කියමින් සතුටු කොට
අබිමන් සිතෙහි තර කොට
†වෙසෙසින් තියුණු කොට
මෙසේසියසෙනඟට නියම කො

99

අනූයොදුනුස ඇ ති
යෙළසිය යොදුන් දිග ඇ ති
ගිරිමෙවුලානා මැ ති
×ගිජිඳුපිට වසවතු නැඟීග ති

100

ඔහුට ඉදිරිව ය න
දෙළොස්යොත්නක්පැතිරෙන
*සෙනඟදෙපසෙහි ය න
සෙනඟඑපමණවෙතියොදුනෙ

101

පස්සෙහි යන සෙන ඟ
සක්වළ පව්වටම ල ඟ
මත්තෙන් යන සෙන ග
පිරුණුනවයොත්නෙක අහස්මග

---

97 අඞියෙනි, අඞියක්වන්; පසු නොලා, පසු නොබැස; වැඞියෙනිවැඞියක්; විකුම්බලපා, බලවික්‍රමය ප්‍රකාශකොට; සිත එඞියෙනි, සිත ආඩම්බරව; ගොසින්, ගමනය කොට; සිදුහත් කුමරු, සිඩාර්ථකුමාරයා; දූඞියෙනි, දූස්ව; ගතිව්, ග්‍රහණයකරව්යයි:—

98 කියමින්, කථනය කරමින්; සතුටුකොට, සන්තුෂ්ටකර; සිතෙහි, චිත්තයෙහි; අබිමන්, අභිමානය; තරකොට, ස්ථිරකොට; වෙසෙසින්, විශෙෂයෙන්; තියුණුකොට, තීක්‍ෂණකොට; මෙසේ, මෙයාකාරයෙන්; සිය සෙනඟට, ස්වකීයසේනාවට; නියමකොට, නියමකොටලා:—

99 අනූයොදුන්, නවුතියොජනයක් ප්‍රමාණ; උසඇති, උස, ඇත්තාවූ; යෙළ්සියයොදුන්, යොදුන්එකසියපණහක් පමණ; දිග ඇති, අයම්යුක්තවූ; ගිරිමෙවුලා නැමැති, ගිරිමෙඛලායන නාමයක් ඇත්තාවූ; ගිජිඳුපිට, හස්තිරාජයාපිට; වසවතු, වසවතී මාරයා; නැඟීගති, පැනනැංගේය.

100 ඔහුට, ඕහට; ඉදිරිව යන, ඉදිරියේන් ගමන්කරන්නාවූ; දෙළොස් යොත්නක්, ද්වාදසයෝජනයක් තැන්; පැතිරෙණ, පැතිරිපවත්නා; සෙනඟ, සෙනාවගේ; දෙපසෙහි යන, උභයපාර්ශ්වයෙහි යන්නාවූ; සෙනඟ, සෙනාවද; යොදුනෙන, යොදුන්ගනනාවෙන්; එපමණවෙති, ඒ ප්‍රමාණමවේත්.

101 පස්සෙහි, පසුභාගයෙහි; යන, ගමන්කරන්නාවූ; සෙනඟ, සේනාව (නොනෙක් පමණවිදයත්,) සක්වළපව්වටම ලඟ, චක්‍රවාට පර්වතයටමසමීපවූහ; මත්තෙන්, මතුභාගයෙන් (ඉදිරයෙන්) යන, ගමන්කරන්නාවූ; සෙනඟ, සේනාව; අහස් මග, ආකාසමාර්ගයෙහි; පිරුණු, පිරුණාවූ; නවයොත්නෙක, නවයොජන ප්‍රමාණ ස්ථානයෙහි පිහිටිශේය.

---

† එඞිතර සිත් ඇතිව ×සෙනඟෙහා දෙපසයන පොත්
* වෙසෙසින් දිවුනුකොට ‡ ගිජිඳුහුටසෙද පැනනැගීගතිපොත්.

102 නන් වෙස් නනවි ගෙණ
සෙනහෙක් ගොසින් දිව ගෙණ
උනුන් මිගබෑණ ගෙණ
ගනුව අනුවයිකියතිසිට ගෙණ

103
නෙත්රත්යවට තු ල්
මුවමු දිලෙන ගිනි දෑ ල්
අත වත අවි උදු ල්
*සිටිතිසෙනහෙක්ලමින්රැකව

104
සිහ දිවි වග වල ස්
එල්වා අතින් දිවගො ස්
කියා කරදරබ ස්
සිටිතිසෙනහෙක්වෙමින්සිතරො

105 අනු ගනු බඳු කො ටව
තල මුර බලා නොසි ටව
අවිකැලඇඟප ටව
කියාසෙනහෙක්සිටිති පෙර ටව

---

102 නන්වෙස්, නානාවෙශයන්ද; නන්අවි, අනෙක'ආයුධයන්ද; ගෙණ, ග්‍රහණය කොට; දිවගෙණ, ධාවනයකරමින්; සෙනහෙක්, සෙනාවක්; ගොසින්, ගමනයකොට; උනුන්, ඔවුනොවුන්; මිගබෑණගෙණ, මිගදෙඩමින්; (අහන්කාරවචනයන්) සිටගෙණ, සපිහව; ගනුව, (සිදුහත්කුමරාං) හැරගනිව්; අනුවයි, (අවිආයුධවලින් අනිව්යයි) කියති,කථයකෙරෙත්.

103 නෙත්, නෙත්‍රයන්; රත්, ගිනියම්කරණලද; යවටතුල්, අයකූටයක් වැනිය; මුවමුව, මුඛයක්පාසා; දිලෙන, බබලන්නාවූ; ගිනිදෑල්, අග්නිජ්වලා ඇත්තාවූ; අත අත, හස්තයක් පාසා; උදුල්, උජ්වලිතවූ; (බබලන්නාවූ) අවි, ආයුධගත්තාවූ; සෙනහෙක්, සෙනාවෙක්; රැකවල්ලමින් රක්‍ෂාවරනයකොට ගෙණ; සිටිති, සිටිත්ය.

104 සිහ, සිංහය; දිවි, දිවීය; වග, ව්‍යාඝ්‍රය; වලස්, තරවජය; යන මෙකිසත්වයන්; අතින්, හස්තයෙන්;එල්වා,ආලම්බනයකොට දිවගොස්, ධාවනය කොට ගොසින්, කරදරබස්,, කෲරවචනයන්; කියා, කථනයකරමින්; සිතරොස් වෙමින්, චිත්තකොපයෙන්; සෙනාවෙක්, සෙනහෙක්; සිටිති, සිටිත්ය–

105. අනු, (මේසිදුහත්කුමරාට) ආවුධයෙන්, අනිව්; ගනු, මොහුදෑඹව; ග්‍රහණයකරව්; බඳු, යානොදි; බන්ධනගතකරව්; කොටව, කෙටේරිආදියෙන්; කොටව්, තල, (මුගුරුවලින්) තලව්; මරදිවියෙන්පහකරව්; බලානොසිටව, නිරීක්‍ෂණකොට නොසිටිව්; අවිකැල, ආවුධසමූහය; ඇඟ, ශරීරයමතුයෙහි; පටවපටවව්යයිකියා; කථනයකරමින්; සෙනහෙක්, ශෙනාවෙක්;පෙරටව, ඉදිරියටව්; සිටිති, සිටිත්ය–

106 නයිපොලොගුන් ග　　තේ
† වෙලවාඋනුන්නොව　　තේ
දිවගෙණගොස් ම　　තේ
සිටිති සෙනහෙක්දෙඩාසම　　තේ

107　　108

රතගරඅලෙවි කා　　ර　දිගුදළ සුරත්නෙ　　ත්
සුරත්වත් හැඳවළු බ　　ර　සප්ආබරණයෙන් යු　　ත්
යමගුරු අතනොහැ　　ර　කලුරලුපරළු ග　　ත්
සිටිත් සෙනහෙක් අවුත්බියකර　සිටිතිසෙනහෙක්රකුස් වෙස්ග

109 මරසෙනඟ හමුව　　ත
සුරසෙනඟ බියගෙණ සි　　ත
පුදවත් දමා අ　　ත
ගියෝ ඉස්ලුලු අතින් අ　　ත

106. ගතේ, ශරීරයෙහි; නයිපොලොගුන්, නාගගෝනස යන සර්පයන්; වෙලවා, වෙඨනයකරවාගෙණ; උනුන්, ඔවුනොවුන්; නොවතේ, නොනැවතී; මතේ, මත්ව; දිවගෙණගොස්, ධාවනයකොට ගොසින්ලා; සෙනහෙක්, සෙනාවෙක්; සමතේ දෙඩා, සමත්කම්කථාකරමින්; සිටිති, සිටිත්ය–

107. රතගර, රක්තාංගරාගයන්; අලෙවිකර, ආලෙපකොට; වළුබර, වළුයෙන්බරවූ; (වල්ලරීභාරයෙන්) සුරත්වත්, අතිරක්තවස්ත්‍රයන්; හැඳ, අච්ඡාදනය කොට; අත, හස්තයක්පාසා; නොහැර, අත්නොහැරම; යමගුරු, යමමුද්ගරයන්ගෙණ; බියකර, භයංකරවූ; සෙනහෙක්, සෙනාවෙක්; අවුත්, ආගමනය කොට; සිටිති, සිටිත්ය–

108 දිගු, දීඝීවූ; දළ, දංෂ්ට්‍රායෙන්යුක්ත වූ; සුරත්, අතිරක්තවූ; නෙත්, නෙත්‍රවලින්යුක්තවූ; සප්ආබරණයෙන්, සර්පාභරණයෙන්, යුත්, යුක්තවූ; කලු, කාලවර්ණවූද; රළු, රෞද්‍රවූද; පරළු, කර්කශවූද; ගත්, ශරීරයෙන්යුක්තවූ; රකුස්වෙස්ගත්, රාක්ෂසවෙශධාරිවූ; සෙනහෙක්, සෙනාවෙක්; සිටිත්, සිටිත්ය–

109. මරසෙනඟ, මාරසෙනාව; හමුවත, සම්මුඛවතකල්හි; සුරසෙනඟ, දිව්‍යසෙනාවගේ; සිත, චිත්තය; බියගෙණ, භයප්‍රාප්තව; අත, හස්තයන්හිවූ; පුදවත්, පූජාවස්තූන්; දමා, හැරදමා, ඉස්ලුලුඅතින්අත, හිසතැමූන තැමූනදිශාවලින්; ගියෝ, ගමනයකලෝය–

† උනුන්නෙගතේ.

110 දෙදෙනෙක් එකවෙ ස ක්
තොගෙණසිට මහමරස ක්
උවත් මුවදහ ස ක්
උදක්බැරිපවසන්ඩ වෙසෙස ක්

111
අතමුත් යතුරැමු ත්
මුතමුත් අමුත් අවියු+ ත්
†එදිමුත් සෙන්මහ ත්
වණත්මුත්කොඳඅනතනාමු ත්

112
මරසෙනහට හ මුව
කලනසිඳුදිවපළ මුව
හොත්සලවසා ව
මරුගෙබලබල කෙසේවණ මුව

113 සිහ මුව උසබ මුව
ගජමුව දිවි වලස් මුව
සිවුමුව මැවු මුව
අනතනාමුත් කෙසේ වණ මුව

---

110. මහමරසක්, මහාමාරශෙනාවෝ; දෙදෙනෙක්, දෙන්නෙක්; එකවෙසක්, එකවෙසයක්; තොගෙණ, ග්‍රහණයනොකොට සිටිආකාරය; මුවදහසක්උවත්, සහශ්‍රමුඛයාවූයේනමුදු; උදක්, තනිව; වෙසෙසක්, විශෙෂයෙන්; පවසන්ඩබැරි, ප්‍රකාශකරකථනයට නොහැක්කේමය:-

111 අතමුත්, හස්තමුක්තවූද; හෙවත් අඩයටිආදියගත් අත්ඇත්තාවූද; යතුරැමුත්, යන්ත්‍රයෙන්මුදනලද්දවූද; හෙවත් දුන්නෙන්හරණලද අවිගත් අත්ඇත්තාවූද; මුතමුත්, මුදනලද ආවුධාදීයගත් අත්ඇත්තාවූද; හෙවත් මුද්ගරාදියගත් අත් ඇත්තාවූද; අමුත්, නුමුදනලද ආවුධාදිය ගත් අත් ඇත්තාවූද හෙවත් කිරිච්චිආදියගත් අත්ඇත්තාවූද"යි අවියුත්, (නානාප්‍රකාර) ආයුධයන්ගෙන් යුක්තවූ; එදිමුත්, ඒ දීප්තිමත්වූ; මහත්සෙන්,මහාශෙනාව; වණත්මුත්, වර්ණනාකරත් හොත්; අනතනාමුත්, අනන්ත නම් නාගරාජයාහැර; කොඳ, කවරහු ප්‍රභූෂ්වද්ද:-

112 කලනසිඳු, කාලනම් නාගරාජයා; මරසෙනහට, මාරශෙනාවට; හමුව, සම්මුඛව; පළමුව, ප්‍රථමයෙන්; දිව, ධාවනයකොට; මුවවසා, මුඛයපිධානයකොට; හොත්සල, සයනයකලකල්හි; මරුගේ, මාරයාගේ; බල, බලය; කෙසේවණමුව, කවරාකාරයකින් වර්ණනාකෙරෙම්ද; බල, අවලොකණයකරව:-

113 සිහමුව, සිංහමුඛඇත්තාවූද; උසබමුව, වෘෂභමුවඇත්තාවූද; ගජමුව, හස්තිමුඛඇත්තාවූද; දිවිමුව, දිපිමුඛඇත්තාවූද; වලස්මුව, තරක්ෂමුඛ ඇත්තාවූද; (ඒ මාරශෙනාවගේ විලාශය) සිවුමුව, චතුර්මුඛයාවිසින්;(මහබඹහුවිසින්) මැවු,මාපණයකරණලද; මුව, (දහසක්)මුඛඇත්තාවූ; අනතනාමුත්, අනන්තනම් නාගරාජයාහැර;කෙසේවණමුව, කොයිආකාරයකින්වර්ණනාකරම්ද -

---

+අවිමුත්පොත්. †මුක්තා මුක්තාදින්ගේවශයෙන් සියලු ආයුධයෝ චතුර්විධවෙති.

114 මරසෙන් දූකල මූව
වෙව්ලාගියෙන් සිවු මූව
ගත්සේසත්ද මූව
කෙසේමරසෙනග බලවණ මූව

115

අතටගත් ජය සක
නොපිඹ සිත බියවැද සක
දිවූකල විය සක
මරුගෙඅණසකවණමූකෙලෙසක

116

එසඳ මරදෙව්පු ත්
සිදුහත්සරිකෙනෙක් නැ ත්
වැදපිටිපසින්මු ත්
ඉදිරියේ සිටජයගැනුම්නැ ත්

117

කියමින්මේ පව ත්
මවා දහසක් අවිඅ ත්
ගිරිමෙව්ලා මහ ත්
රුගෙණවිත්එකපසෙකසිටග ත්

118

මහබෝසත් එස ද
සිටිනඝෝරමරසෙනග ද
දෙවියන් ගියබව ද
අබිරුසිහවිලසින් බලාහි ද

---

114 සිවුමූව, චතුර්මුඛතෙමේ; දූක, දශීනයකොට; ලමූව, මනොචාරය; වෙව්ලා ගියෙන්, කම්පාව ගියහෙයින්; ගත්, (බුඬ පූජාපිණිස) ග්‍රහණකලාවූ; සේසත්, සෙවතච්ඡත්‍රය; දූමූව, බැහැර දූමූවේය; (එහෙයින්) කෙසේ, කවරාකාරයකින්; මරසෙනඟ, මාරසේනාවගේ; බල, ශක්තිය; වණමූව, වර්ණනාකොරෙම්ද:—

115 සක, ශක්‍රදිව්‍යරාජයා; අතටගත්, අතින්ගත්තාවූ; ජය සක, ජයසංඛය; නොපිඹ, ධමනය නොකොට; සිතබියවැද, සිතෙහිබියඋපදවා; විගසක, වහාම; දිවූකල, ධාවනයකලකල්හි; මරුගෙ, වසවර්තිමාරයාගේ; අණසක, ආඥාචක්‍රය; කෙලෙසක, කවරාකාරයකින්; වණමූ, වර්ණනාකෙරෙම්ද; (නොහැක්කේය යනු භාවයි)

116 එසඳ, එකල්හි; මරදෙව්පුත්, මාරදිව්‍යපුත්‍රතෙමේ; සිදුහත්සරිකෙනෙක්, සිඬාර්ථකුමාරයාණන්ටසමානකෙනෙක්; නැත්, නැත්තේයයි; පිටිපසින්වැදමූත්, පිටිපසෙහිසිටවිනා; ඉදිරියේ සිට, ඉදිරිභාගයෙහි සිටනම්; ජයගැනුම් නැත්. ජයග්‍රහණයක් නොහැක්කේයයි:—

117 මේපවත්, මේප්‍රවෘත්තිය; කියමින්, කථනයකොරෙමින්; අවි, ආයුධසහිතවූ; අත්දහසක්, සහස්‍රසංඛ්‍යාතහස්තයන්; මවා, මාපණයකොටගෙණ; මහත්, විශාලවූ; ගිරිමෙව්ලා, ගිරිමෙඛලා නම් හස්තිරාජයා; රුගෙණවිත්, ග්‍රහණයකොටඅවුත්; එකපසෙක, එක්පාර්ශ්වයෙක්හි; සිටගත්, ස්ථිතග්‍රහණයකෙළේය. (සිටගත්තේය)

118 එසඳ, ඒකාලයෙහි; මහබෝසත්, මහාබොධිසත්වයන් වහන්සේ; ඝටින, සිටින්නාවූ; ඝොර, ඝොරවූ; මරසෙනඟද, මාරසේනාවද; දෙවියන්, දෙවිනාවන්; ගියබවද, පැනගියබවද; අබිරු, අභීතවූ; සිහවිලසින්, සිංහවිලාශයෙන්; බලාහිඳ, දර්ශනය කොට වැඩහිඳලා:—

119 මෙහි මවුපිය කෙනෙ ක්
වත් අන් කිසිනෑකෙනෙ ක්
නැත පින්මිස අනෙකෙ ක්
ඇද්ද පිහිටක් පෙරකීකෙනෙ ක්

120
දසපෙරුමන් නැමැ ති
දසමහයෝදයෝ ඇ ති
දසබිම්බරට ඉ ති
දසදෙනාගෙන් එකිඑකාඇ ති

121
මෙලෙසින් බෝස තා
උන්සඳපින්බලසි තා
නෑවතත්වසව තා
මින්ම මොහුපලවමිසිතසි තා

122
ගිරිතුරුහෙලා ය න
මහත්සුලඟක් මවමි න
බෝසත්සහ අස් න
ඉගිලයනසේකෙළේතොලසිත

123
එසඳබෝසතුවෙ ත
පැමිණගිම්දුරුකෙළෙග ත
කියතුවකිම පුව ත
සිව්රකොතකුත් සෙලවුණේනෑ

---

119 මෙහි, මේ ස්ථානයෙහි; මවුපිය කෙනෙක්වත්, මාතෘපිතෘ කෙනෙක්වත්;අන්කිසිනෑකෙනෙක්, අන්‍යකිසියම්ඥාතිකෙනෙක් වත්; නැත, නැත්තේය; අනෙකෙක්, අනෙකකාලයක්මුළුල්ලෙහි කරණලද; පින්මිස, පින්විනා; පිහිටක්, ප්‍රතිෂ්ඨාවක්; පෙර, පූර්ව කාලයෙහි; කීකෙනෙක්, කීවාහුතම්; ඇද්ද, ඇත්තාහුද:—

120 දසපෙරුමන් නැමැති, දසපාරමිතාධර්මයන්නැමැති; දස මහයෝදයෝඇති, දශමහයෝධයෝ ඇත්තාහ;ඉති, මෙසේ; දස බිම්බරට, බිම්බරදශයටම; දසදෙනාගෙන්,දසමහයොධයන්අතු රෙන්; එකිඑකා ඇති, එකඑක යොධභටයා ප්‍රමාණ වේයයි:—

121 මෙලෙසින්, මෙයාකාරයෙන්; බෝසතා මහාසත්වතෙමේ; පින්බල, පුණ්‍යශක්තිය; සිතා, අනුස්මරණයකෙරෙමින්; උන්සඳ, වැඩසිටිකල්හි; නෑවතත්, යලිත්; වසවතා, වසවර්තිමාරයා; මින් ම, මෙයින්ම; මොහු, මේ බොධිසත්වයා; පලවම්, පන්නාහරිමියි; සිතසිතා, චින්තනයකොට කොට:—

122 ගිරි, පර්වතය; තුරු, වෘක්ෂයයනමේද; හෙලායන, පතිතව යන්නාවූ; මහත්සුලඟක්, මහාමාරුතයක්; මවමිණ, මාපණයකර මින්; බෝසත්සහ, මහාසත්වයන් සහිතවූ; අස්න, විදුරාසනය, ඉගිලයනසේ, උදුරායනපරිද්දෙන්; තොලසිත, වහා; කෙළේ; කෙළේය.

123 එසඳ, එකල්හි; බෝසතුවෙත,බොධිසත්වයන්කරා; පැමිණ, ප්‍රාප්තව; ගත, ශරීරයෙහි; ගිම්දුරුකෙළේ, ග්‍රීෂ්මයදුරිභූතකෙළේ ය; පුවත, ඒ ප්‍රවෘත්තිය; කියතුකිම, කුමට කියම්ද; සිව්රකොත කුත්, චීවරකන්තයපමණකුදු; සෙලවුනේනැත, චලනයක් නො වූයේය.

124 නැවත මරුදෙව් පු  ත්
වැස්සක්මවා බලව  ත්
වතුරෙන් වේග ව  ත්
ගඞායතලෙස කෙලේබෝසත්

| 125 | 126 |
|---|---|
| ඉන්බිඳක්පමණ ත් | සිතදිවුනු රො ස්විය |
| මහබෝසතුන් ගතව ත් | ගිරිකුළුපහණ වැ ස්විය |
| නැතහොත් සිව්රව ත් | * දිලෙන ගිනිරැ ස්විය |
| වැදතෙමිගිය තැනෙක්නම්නැත් | ඔහුට පුද මල්වටවිල ස්විය |

| 127 | 128 |
|---|---|
| අවිදහර වැ ස්විය | සහලඟුරු වැ ස්විය |
| දුමින් තුබ ගැබ වැ ස්විය | ගිනිදූල් නොයෙක දි ස්විය |
| ගොස් අවට රැ ස්විය | පුදටමසුදු ස්විය |
| † ඔහුට පුද කළ මල්සදි ස්විය | දිලෙනබඳුවදපෙතිවිල ස්විය |

124 නැවත, යලිත්; මරුදෙව්පුත්, මාරදිව්‍යපුත්‍රයා; බලවත්, වේගවත්වූ; වැස්සක්, වර්‍ෂාවක්; මවා, මාපණයකොට; වේගවත්, බලවත්වූ; වතුරෙන්, ජලයෙන්; බෝසත්, මහාසත්‍වයන්; ගඞායතලෙස, ගඞාගණයන පරිද්දෙන්; කෙලේ, කෙලේ ය;

1:5 ඉන්, ඒජලයෙන්; බිඳක්පමණත්, බින්‍දුමාත්‍රයකුත්; මහබෝසතුන්, මහාබෝධිසත්‍වයන්ගේ; ගතවත්, ශරීරයටවත්; නැතහොත්, නැත්තේනම්! සිව්රවත්, චීවරයවත්; වැද, සප්‍රීව; තෙමිගිය තැනෙක්නම්, තෙමුනාවූ ස්ථානයෙක්නම්; නැත්; නැත්තේය;

126 සිත, චිත්තයෙහි; රොස්, ක්‍රොධය; දිවුනුවිය, දිගුණවිය; ගිරිකුළුපහණ, පර්‍වතකූටපාෂාණයන්; වැස්විය, වර්‍ෂාකරවීය; දිලෙන, බබලන්නාවූ; රැස්විය, රාශිභූතවූ; ගිනි, වහ්නිය; ඔහුට, උන්වහන්සේට; පුද, පූජාකරණලද; මල්වට, මල්මාලාවක්හුගේ; විලස්විය, විලාසය දැක්විය; (මල්මාලාවක්මෙන්විය.)

127 අවිදහර, ආයුධධාරාවන්; වැස්විය,වර්‍ෂාකරවූයේය; දුමින්, ධූමයෙන්; තුබගැබ, නාභොගර්‍භය; (අහස) වැස්විය; ජාදිතකරවිය, ගොස්,(එකී සියලුවර්‍ෂාවන්) ගමනය කොට; ,වට, (මහාසත්‍වයන්) හාත්පස; රැස්විය, රාශිභූතවිය; (එසියල්ල) ඔහුට, උන්වහන්සේට, පුදකළ, පූජාකරණලද; මල්සදිස්විය, මල්මාලාවන් සමානවිය.

128 සහලඟුරු, ගිනිඅඟුරුද; වැස්විය, වර්‍ෂාකරවීය, ගිනිදූල්, අග්නිජ්වාලාවන්, නොයෙක, අනේකාකාරයෙන්; දිස්විය, දෘශ්‍යමානවිය (එසියල්ල) දිලෙන බබලන්නාවූ; බඳුවදපෙති විලස්විය, බන්‍ධුජීවක පුෂ්පයන්ගේ වූ ඒසියල්ල, පුදටමසුදුස්විය, පූජාවට ම සුදුසුවූයේය.

* මල්විලස්විය, පොත්.  † දිලෙන ගිනි වැස්විය, [illegible]

129 උණු අලුද වැ ස්විය
දිලෙන කඳුකුළු රැ ස්විය
පුදටම තිදෙ ස්විය
සඳුන් සුණුවිලසටම දි ස්විය

130
සිහින් වැලි වැ ස්විය
හෙද මල් රොන් විල ස්විය
මරුගෙ මන් සි ස්විය
එබඳුවත් සිත නොපසු බැ ස්විය

131
කලල් වැසිවැ ස්විය
ගිනිදළු විලස් දි ස්විය
දුටුවන් ඇස් වැ ස්විය
ඔහුට ලූ පිරිමඩ විල ස්විය

132
මවත මහගනඳු රු
† සිවු අඟිනි යුතු කොට ම රු
තදතෙදින් දිවයු රු
දුරලූ ගනඳුරු විලසවිය දූ රු

133
මෙසේවැසි නව යක්
වස්වා නොදුටු පල යක්
ලමී මතුතිල යක්
තවත් වසවතු සිතාබල් යක්

---

129 වැස්විය, වශීකාරවණලද; උණුඅලුද, උෂ්ණභස්මය; දිලෙන බබලන්නාවූ; කඳුකුළු, පර්වතකූටයන්මෙන් රැස්විය; රාශිභූත, විය, පුදටම, පූජාපිණ්ඩම (ගන්නාලද) තිදෙස්විය, තිදේශවූ; සඳුන්සුණු විලසටම, චන්දනචූර්ණයක්මෙන්, දිස්විය, දෘශ්‍යමානවිය;

130 සිහින්වැලි, සිහින්වූවාලුකාවන්; වැස්විය, වශීකාරවිය; හෙද, ඒවැලිද. මල්රොන් විලස්විය, පුෂ්පරේණූන් මෙන්විය; (මෙසින්) මරුගෙ, මාරයාගේ, මන්, මනය; සිස්විය, තුච්ඡවිය; එබඳුවත්, එසේවූයෙනමුත්; සිත, (මාරයාගේ) චිත්තය, නොපසුබැස්විය, පසුනොබැස්සවූයේය.

131 වැස්විය, වශීකාරවනලද; කලල්වැසි, මඩවශීාව; ගිනිදළු විලස්, අග්නිජ්වාලාවන්මෙන්; දිස්විය, දශීනීය විය; දුටුවන්, දශීනය කළවූන්ගේ; ඇස්, චක්ෂූන්; වැස්විය, පියවිය; (එසේවූවශීාවන්) ඔහුට, උන්වහන්සේට; ලූ, හෙළනලද; පිරිබඩවිලස්විය, පරිභාණ්ඩයක්මෙන්විය; (පිරිසිදුබවසඳහා හමුවෙහි අතුල්ලනලද සුවඳකළලක්මෙන් වූයේය යනු භාවයි.)

132 මරු, මාරයා; මහගන්දුරු, මහත්වූ අන්ධකාරය; සිවු අඟිනියුතුකොට, චතුරංගයෙන් යුක්තකොට; මවත, මැවූකල්හි තදතෙදින්, සඵබඳතෙජසින් යුක්තවූ; දිවයුරු, දිවාකරයාවිසින්; දුරලූ, දුරුකරණලද; ගනඅඳුරුවිලස, ඝනාන්ධකාරයමෙන්; දුරුවිය දූරීභූතවිය;

133 මෙසේ, මෙයාකාරයෙන්; වැසිනවයක්; නවවිධවශීාවක්; වස්වා, වශීකොටත්; පලයක්, (ඉන්) ප්‍රයොජනයක්; නොදුටු; දශීනය නොකොට; මතු, අනාගතයෙහි; තිලයක්ලමී, තිලයක් ලන්නෙමි, මසවතු, වසවර්තියා, තවත්, නැවතත්; පලයක්සිතා, ශකුනියක් සමරණය කොට;

---

× චතුරංගයනම්, මහත්වූවතලැහැබය, ඝනවූමෙඝපටලය. කාලපක්ෂය පිළිබඳ චාතුර්දසිය අර්ධරාත්‍රියය යන මොහුයි.

134 ගනගල් වැඹෙක ව ත
කිලිල් කඩමෙන් සිඳ ය ත
සක්අවිය ගෙණ ති ත
ගැසී දෙකඩක් කරණ දහසි ත

135
එසඳ ඔහු ම ත්තේ
මල්වියනෙවු නැවැ ත්තේ
මෙසේ මතු ම ත්තේ
යත්නකෙළෙ පලවනු කැමැත්තෙ

136
මහබෝසත් එවි ට
මේ අස්න හිමිවන්න ට
කළපින් සැබැකො ට
කියවමින් කුළුදෙස් විටින්වි ට

137
සිදුහත්කුමර ත §ට
මේ විදුරස්න ලැබුම ට
†කළපිණට දෙස් ම ට
යුහුව කියවයි කී නියම කො ට

138
මහබෝසත් එවි ට
දකුණත බිමට දිගු කො ට
මිහිකතවිනා ම ට
කෙනෙක් නැත කිය දෙස් කීම

---

134 ගන, ඝනවූ; ගල්වැඹෙක, පාෂාණ ස්තම්භයෙක්හි; වන, වැදුනේනම්; කිලිල්කඩමෙන්, කළිරඛණ්ඩයක්මෙන්; (ලාගොබ ලෑන්) සිඳයන, කැපීයන්නාවූ; සක්අවිය, චක්‍රායුධය; අතින, හස්තයෙන්; ගෙණ, ග්‍රහණයකොට; දෙකඩක් කරණ අදහසින, (සිදුහත්කුමාරයා) දෙපලුකරණ අධ්‍යාශයෙන්; ගැසී, ගැසුයේය;

135 එසඳ, ඒකාලයෙහි; ඔහුමත්තේ, උන්වහන්සේගේ මස්තකයෙහි; මල්වියනෙවි, පුෂ්පවිතානයක්මෙන්; නැවැත්තේ, තිඊතවීය;(නැවතුනේය)මෙසේ,මෙයාකාරයෙන්ම; මතුමත්තේ, මතුමත්තෙහිත්; පලවනු කැමැත්තේ, පලායවන කැමැත්තෙන්; යත්නකළේ, උත්සාහකොළේය;

136 එවිට, එකල්හි; මහබෝසත්, මහාබොධිසත්වතෙම; මේ අස්න, මේ වජ්‍රාසනය; හිමිවන්නට, අයිතිවීමපිණිස; කළපින්, කරණලද පුණ්‍යයන්; සැබෑකොට, සත්‍යකොටලා, විටින්විට, ඇසිල්ලෙන් ඇසිල්ලෙහි; කුළුදෙස් කියවමින් (මාරපිරිසලවා) බොරුසාක්ෂිකථනය කරවා;

137 සිදුහත්කුමර, සිඬාර්ථකුමාරය; තට, යුෂ්මතුන්ට; මේ විදුරස්න, මේවජ්‍රාසනය;ලැබුමට ලැබිමපිණිස; කළපිණට, කරණලද පුණ්‍යකම්ශට; මට, මාහට; යුහුව, ඉක්මන්ව; නියමකොට, නිශ්චය කොටලා; දෙස්, සාක්ෂි; කියවයි, කථනයකරවයිකියා; කී, කථනය කොළේය;

138 එවිට, එකල්හි; මහබෝසත්, මහාබොධිසත්වයන්වහන්සේ; දකුණත, දක්ෂිණහස්තය; බිමට, මෙදිනියට; දිගුකොට, ප්‍රසාරණයකොට; මට, මාහට; මිහිකතවිනා, මහිකාන්තාවහැර; දෙස්කීමට, සාක්ෂිකීමපිණිස; කෙනෙක්, අන්‍යවූවෙක්; නැත, නැත්තේයයි; කිය, කථනයකොළේය;

---

§ කුමරහට, පොත්, † කළපින් කියවමට, පොත්,

139 ඔහුකල මහපිණ ට
සැකයක් නොවෙන විලස ට
සියක් දහසක් වි ට
ගුගුල මිහිකත් එසඳ පිට පි ට

140
මරදෙව්පුත් එවි ට
එබෝසත් වනසන්න ට
ගිරිමෙවුලා ඔහු ට
‡දතින් හෙවසෙද වැද පිසහතුට

141
මරුද මරසෙනඟ ද
විස්ම දුක සිත බිය වැ ද
නොසිටම දිවු සෙ ද
එදුටු සුරසෙන් වෙමින් මනන

142
බෝසතුට ජය විය
වසවතු පරාජය විය
මොක්පුරට ජය විය
*මෙතෙම තෙදියට එකමරජවිය

143
බෝසත් මෙර පබ ද
මරසෙන් යුගපවන් වැ ද
නොසලවනු විය අ ද
ඉතින් සොලවනු කවරකලකද

---

139 ඔහුකල, උන්වහන්සේවිසින් කරණලද; මහපිණටා, (පාරමිතාආදි) මහාපුණ්‍යයන්ට; සැකයක් නොවනවිලසට, සංඛ්‍යා, වක් නොවන පරිද්දෙන්. එසඳ, එකල්හි; සියක් දහසක්විට, සත සහස්‍ර වාරයෙක්හි; පිට පිට, පිට පිටම, මිහිකත්, මහීකාන්තා තොමෝ; ගුගුල, ගර්ජනාකලා;

140 එවිට, එකල්හි; මරදෙව්පුත්, මාරදිව්‍යපුත්‍රයා; එබෝසත්, ඒ මහාසත්වයන්; වනසන්නට, විනාශකරණු පිණිස; ඔහුට, උන්වහන්සේකරා හයාගෙණියාවූ; ගිරිමෙවුලා, ගිරිමෙඛලා නම් හස්තිරාජයා; සෙද, වහා; දතින්හෙව, දතින්වැටි; සහතුට, සංතුෂ්ටව; වැදපි, නමස්කාරකෙළේය;

141 මරුද, මාරයාද; මරසෙනඟද, මාරසෙනාවද; විස්මදුක, ඒ විස්මය දර්ශනයකොට; සිතබියවැද චිත්තභීතියට පැමිණ, සෙද, වහා; නොසිටම, සිටිනනොවම; දිවු, ධාවනයකළෝය; ඒ දුටු, ඒ (මාරසෙනාවගේ පැනයාම) දුටුවාවූ; සුරසෙන්, දිව්‍යසෙනාව; මනනද‍වෙමින්, චිත්තසන්තොෂයට පැමිණ;

142 බෝසතුට, බොධිසත්වයන්ට; ජයවිය, ජයඅත්වීය; වසවතු, වසවර්තිමාරයා; පරිජයවිය, පරාජිතවීය; මොක්පුරට, මොක්ෂපුරයට; ජයවිය, ජයඅත්වීය; මෙතෙම, මේ මහාසත්වතෙම; තෙදියට, ජගත්‍රයට; එකමරජවිය, අසහායරාජන්වීය;

143 බෝසත්, මහාසත්වයන්නැමති; පබද, ප්‍රසිද්ධවූ; මෙර, මෙරුපර්වතය; මරසෙන්, මාරසෙනා නැමැති; යුගපවන්, කල්පාන්තවාතය; වැද, සපැමිණ; අද, අදනම්; නොසලවනුවිය, චලනයට නොහැකිවිය; ඉතින්, ඉතොබඩෙහි; සොලවනු, චලනයෙක්නම්; කවරකලකද, කිනම් කලෙක්හි හැකිවේදෝ;

---

‡ දතින්හෙලවාවැදපි, දතින්හෙවහෙද, පොත්,
* එසඳ ජයවිය, පොත්මෙහි යකාරපෙළ මෙසේ කලගැනේ

144 පවසා සුරසෙන ඟ
අවුදින් බෝසතුන්ල ඟ
පුදවත් ගෙණසම ඟ
සිටිති තුතිකියමින් නොයෙකර ඟ

145
සඳගණසවණදු ලී
තෝඩුයුවලෙව් මනක ලී
රිවිඅත් හිරග දි ලී
සපිරිසඳමඩල උදයග දි ලි

146
තුන්යම පිළිවෙළි ත
තුන්නුවණලැබ වෙසෙසි ත
අරුණළු දිළුැ තැ ත
සියල්දත් නැණපසක්කරමි ත

147
අඳබිහිරි හැර විය
සිඳුදිය මිහිරි කර විය
පොළොවද ගුගුර විය
සියල්ලෙව් අසිරිමත්කර විය

148
බුදුවසතියක් මු නි
අස්න නොහැරම වැඩ උ නි
ඉන්බැස සිට දෙවෙ න
සතිය අනිමිස ඇසින් පුද දු නි

144 සුරසෙනඟ, දිව්‍යසෙනාවෝ; පවසා, ප්‍රකාශකොට; බෝසතුන්ලඟ, බෝධිසත්‍වයන්සමීපයට; අවුදින්, ආගමනයකොට; සමඟ, එක්ව; පුදවත්, පූජාවස්තූන්; ගෙණ, ග්‍රහණයකොට; නොයෙකරඟ, අනෙකාකාරයෙන්; තුතිකියමින්, සතුතිකථා කථාකරමින්; සිටිති, සිටිත්‍ය॥

145 සඳැගණ, සංඛ්‍යානමැතිඅංගනාවගේ; සවණ, කණීයන්හි; දුලී, බබලන්නාවූ; මනකලී, මනොකල්‍යවූ; (සිතටප්‍රියවූ) තෝඩුයුවලෙව්, තාඩංකයුග්මයක්මෙන්වූ; රිවි, සූය්‍ය්‍යා; අත්ගිරඟ, අස්තපර්වතාග්‍රයෙහි; දිලී, බබලන්ටවිය; සපිරි, සම්පූණීවූ; (පුරපසළොස්වක්දිනයබැව්ති)සඳමඩල, චන්ද්‍රමණ්ඩලය; උදයග, උදයපර්වතාග්‍රයෙහි; දිලී, ශාලිතවිය–

146 තුන්යම, ×ත්‍රිවිධයාමයෙහි; පිළිවෙළින, පටිපාටියෙන්; වෙසෙසින, විශෙෂයෙන්; තුන්නුවණලැබ, ත්‍රිවිධඥණලාභිව; අරුණළු, අරුණාලෝකය; දිළුැතැන, බබලන්ටවූකල්හි; සියල්දත්නැණ, සර්වඥතාඥනය; පසක්කරමිණ, ප්‍රත්‍යක්‍ෂකොට–

147 අඳබිහිරි, අන්ධබධිරබැව්; හැරවිය, පහකරවූසේක; සිඳුදිය, සමුද්‍රජලය; මිහිරිකරවිය, මධුරකරවූසේක; පොළොවද, පෘථුවියද; ගුගුරවිය, ගර්ජනා කරවූසේක; සියල්ලෝ, සකලලොකය; අසිරිමත්කරවිය, ආස්වය්‍ය්‍යමත්කරවූසේක–

148 මුනි, මුනීන්ද්‍රයන්වහන්සේ; බුදුව, බුඩත්‍වයටපැමිණ; සතියක්, සප්තාහයක්මුලුල්ලෙහි; අස්න, ආසනය; නොහැරම, වර්ජනය නොකොටම; වැඩඋනි, වැඩඋන්සේක; ඉන්බැසසිට, ඒආසනයෙන් බැසසිටලා; දෙවෙනිසතිය, ද්විතීයසප්තාහය; අනිමිසඇසින්, නොපියනලදඇසින්ම; පුදදුනි, පූජාදනය කළසේක–

×පූථම, මධ්‍යම, පස්චිම යන මොහුයි.

149 තුන්වන සතියදි . ත
බෝමැඩරුවන් සක්ම න
සක්මන් කරයේමෙ න
සතරවන සතියෙහිද එමතැ න

150
රුවන්ගෙහිවැඩිහි ඳ*
අබිදම් දෙසා මනන ඳ
අජපල් නුගය බ ඳ
සෙවන පස්වන සතිය වැඩහි ඳ

151
මාරදූ තුන්දෙ න්
†කෙලෙසුන් බවද නොමදූ න
පොළඹන්ට මුනිඳු න
යත්නකොට නොහැකිවූ එමදි

152 වැඩම්දෙල් විල්තෙ ර
යවෙනිසතියෙහි මුනිව ර
නාරජුගෙ විසගො ර
දරණතුලඉඳ සිතුළුකහක ර

---

149 දින, සර්වඥයන්වහන්සේ; තුන්වන සතිය, තෘතීයසප්තාහයෙහි; බෝමැඩ, බොධිමණ්ඩපසමීපයෙහිවූ; රුවන්සක්මන, රත්නචංක්‍රමනයෙහි; සෙහෙන, යහපත්ව; සක්මන්කර, චංක්‍රමනයකොට; සතරවනසතියෙහිද, චතුර්ථසප්තාහයෙහිද; එමතැන, එමස්ථානයෙහිමවූ–

150 රුවන්ගෙහි, රත්නඝරයෙහි; වැඩහිඳ, නිසීදනයකොටලා; මනනඳ, මනොනන්දනීයවූ; අබිදම්, අභිධර්මය; දෙසා, දෙසනාකොට; (සිහිකොට) අජපල්නුගයබඳ, අජපාලනාමිනිග්‍රොධය සමබන්ධවූ; සෙවන, ඡායාවෙහි පස්වනසතිය, පඤ්චමසප්තාහය; වැඩහිඳ, නිසීදනය කොටලා:–

151 මාරදූතුන්දෙන, (තණ්හා, රතී, රගා. යන) මාරධීතෘතුන්දෙනා; මුනිඳුන, මුනීන්ද්‍රයන්වහන්සේගේ, කෙලෙසුන්බවද; කෙලසයන් ඇතිනැතිබවද; නොමදූන, අජානනයකොට; පොළඹන්ට; (රාගයෙන්) ප්‍රලොභකරවාලන්ට; එමදින, එදවසෙහි; යත්නකොට, උත්සාහකොටත්; නොහැකිවූ, නොහැකිවූය–

152 මුනිව්ර, මුනිඋතුමා; සවනසතියෙහි, ජටඨමසප්තායෙහි; මිදෙල්විල්තෙර, මුචලින්දනම් විල්ඉවුරට; වැඩ, වැඩමකර; විසගොර, විෂඝොරවූ; නාරජුගෙ, නාගරාජයාගේ; දරණවුල, හොගාවලිය ඇතුලෙහි; සිතුළුකහකර, චිත්තෛකාග්‍රතාවයට පමුණුවා; ඉඳ, නිසීදනයකොට–

---

* දෙවියන්මවාදූන් රුවන්ගෙයකැයිද, හෝ අබිදම්අටුවාහි වලකා, සප්තප්‍රකරණ නමැති රුවන්මෙනෙහි කළතැන රුවන් ගෙයයයිද කියත්, මේ පිළිගතයුතු—

† කෙලෙසුන් පසුන්නොමිදූන, මෙසේනම් වඩායෙහෙකි, නමුත් වැඩිපොතකාව මෙසේ තිබුන බැවින් එසේම යෙදීවූ, කෙලෙසයන්දුරුකළබව නොමදූනයනු අර්ථයි.

153 ගොසින් කිරිපලු තු ර
සේවන වැඩහිඳ මහග ර
සත්වනසතිය තු ර
විමුත් සැපවිඳිමින්මකල් හැ ර

154
මෙලෙසසත්සති ය ක්
නොකොට තුනුපිළිදූගු ම ක්
නොවළඳ අහර ක්
මුනිඳුවැඩඋන්සඳෙහිදූකසක්

155
නාලිය දූහැටියෙ න
අනෝතත්විල ජලයෙ න
සිතඅදර බැතියෙ න
ඇසිල්ලෙකගෙණ දූහැටී දියදි න

156 ගැල්ගෙණයන එස ඳ
තවුස්බල්ලුක දෙවෙළෙ ඳ
දුන් මීපිඬු පැහැ ද
නොපිළිගෙණවැඩඉඳිතමුනිසඳ

---

153 කිරිපළුතුර, රාජයතනවෘක්ෂාන්තරයෙහි; මනහර, සිත් කලුවූ; සෙවන, ඡායාවෙහි; වැඩහිඳ, නිසීදනයකොටලා; සත්වන සතියතුර, සප්තමසප්තාහයෙහි; විමුත්සැපවිඳිමින්ම, විමුක්තිසුඛයඅනුභවකරමින්ම; කල්හැර, කාලාතික්‍රමණයකොටලා–

154 මුනිඳු, මුනීන්ද්‍රතෙම; මෙලෙස,මෙයාකාරයෙන්; සත්සතියක්, සප්තසප්තාහයක්; තුනුපිළි දූගුමක්, ශරීර ප්‍රතිජග්නයක්ද, නොකොට, නොකොටලා; අහරක්, ආහාරයක්ද; නොවළඳ, අනුභවනොකොට; වැඩඋන්සඳෙහි, නිසීදනය කළකල්හි; සක්, ශක්‍ර දෙවේන්ද්‍රයා; දූක, දර්ශනයකොට–

155 නාලියදූහැටියෙන, නාගලතාදන්තකාෂ්ඨයෙන්ද; අනෝතත්විල, අනෝතත්තනම් විල්හිවූ;ජලයෙන, උදකයෙන්ද; සිත, චිත්තයෙහි; අදරබැතියෙන, ආදරභක්තියෙන්; ඇසිල්ලෙක, ඉක්මන්වම; ගෙණ, ග්‍රහණයකොට; දූහැටිදිය, දූහැටීහාවතුර; දින පිළිගැන්වීය–

156 එසඳ, එකල්හි; ගැල්ගෙණයන, සකටගෙණයන්නාවූ (කරත්තගෙණයන්නාවූ);තවුස්බල්ලුක,තාපසය භල්ලුකයකියන්නාවූ; දෙවෙළෙඳ, වාණිජයෝ දෙදෙන; පැහැද, ප්‍රසන්නව; දුන්, පිළිගන්වනලද; මීපිඬු, මධුපිණ්ඩය; මුනිසඳ, මුනිඋතුමා; පිළිනොගෙණ, ප්‍රතිග්‍රහණයනොකොට; වැඩඉඳිත, වැඩඉඳිනාකල්හි—

157 සිතහිඳුන මුනි ත්දු
දුන් සිවුවරන් සුරි දුන්
තිල් මිතිපාත දුන්
අකපයයි ඒ නොගෙණමුනි, දුන්

158
කැපනොවන ඒ පා
උවෙන් මුනිඳුට ඒ පා
මුන්වන් සිලා පා
නැවතසතරක්දුන්නුමතු පා

159
කුළුණෙන් උන්කෙ රේ
පිළිගෙණඑපාසත රේ
එකක්කොට විත රේ
ඉටුසඳ පෙනෙනලෙසතෙහි රේ

160
නොකලහැකිපින් පි ඩු
එපයෙහිබහාමී පි ඩු
සැදැහැයෙන්නු අ ඩු
වළඳවා වෙළදු බැතිපෙම් වැ ඩු

161
එසඳෙහි මුනිස ද
දෙසාසදහම් පැහැ ද
උතුමහපිරිමැ ද
දෙමින් ඔවුනට මිටක්කෙස් ද

---

157 මුනිදුන්, මුනීන්ද්‍රයන්වහන්සේගේ; සිතහි, සිතෙහි; අහි ප්‍රව, දූන, ජානනයකොට; සිවුවරන්සුරිඳු න්, සතරවරන් රජදරුවන්විසින්; දුන්, පිළිගන්වනලද; නදුන්, නඤනීයවූ; තිල්මිතිපා, නීලමානිඝ්‍යපාත්‍රයෝ; මුනිදුන්, මුනීන්ද්‍රයන්වහන්සේවිසින්; අකපයයි, කැපනොවේයයි; ඒ, ඒ පාත්‍ර,නොගෙණ, ප්‍රතිග්‍රහණය නොකොට වැඩඋන්කල්හි—

158 කැපනොවන, අකැපවූ; ඒපා, ඒ පාත්‍ර; මුනිදුට, මුනීන්ද්‍රයන්ට; ඒපාඋවෙන්, එපාවූහෙයින්; මූන්ව න්, මූන්පැහැය ඇත්තාවූ; සිලාපා, සෙල්මුවාපාත්‍ර පිළිබඳවූ; සතරක්, චතුස්කයක් මතුපා, මතුමතුයෙහිකොට; නැවත, යළිත්, දුන්නු, පිළිගැන්නුවෝය–

1.9 උන්කෙරේ, ඒ වරම්රජදරුවන්කෙරෙහි; කුළුණෙන්, කාරුණාවෙන්; එපාසතරේ, එපාත්‍රාචතුෂ්කයම; පිළිගෙණ, ප්‍රතිග්‍රහණයකොට; විතරේ, ප්‍රමාණවශයෙන්; එකක්කොට, එකක්කොට; තෙහිරේපෙණෙනලෙස, රේඛාත්‍රයදර්ශනයවනපරිද්දෙන් ඉටුසඳ, අධිෂ්ඨානකළකල්හි–

160 පින්පිඩුනොකලහැකි, පුණ්‍යපිණ්ඩකෘතනොකොටහැක්කාවූ; එපයෙහි, එපාත්‍රයෙහි; මීපිඩු,මධුපිණ්ඩයන්; බහා, ප්‍රක්ෂෙපකොට, නූඅඩු, ඌණනුවූ; සැදැහැයෙන්, ශ්‍රද්ධායෙන් යුක්තව; වළඳවා, අනුභවකරවා; වෙළඳු, වානිජයෝ්තුමු; බැතිපෙම්වැඩු, භක්තිප්‍රෙමය වර්ධනයකළෝ–

161 එසඳෙහි, එකල්හි; මුනිසඳ, මුනීන්ද්‍රචන්ද්‍රතෙම; සදහම් දෙසා, සද්ධර්මයදෙශනාකොට; පැහැද, පහදවා; උතුමඟ,උත්තමාංගය; (හිස) පිරිමැද, පරාමර්ශනයකොට; ඔවුනට, ඔවුන්හට; කෙස්දුම්ටක්, කෙසධාතුමුෂ්ටියක්; දෙමින්,දානයකොට–

162 අජපල් නුගමුල ට
තැවිත වැඩමුනි එමවි ට
මෙගැඹුරුදම් කා ට
දෙසම් දූයි සිත් වීය පසු බ ට

163
එබව දත් සිවුව ත
+නැසෙසිලොවමතු පින්වත
කියමින් දෙසුම් සි ත
නොපසු බස්නා ලෙසට අයදි

164
පිළිගෙණ බඹ වද ත
නුවණැතියවුන් බලමි ත
අලාරුද්දක ය ත
*දෙදෙන පරවිපිලිවූබව දූ ත

165 පස්වගමහණු ම ට
උපකාරිය පෙරසි ට
දෙසම් දම් ඔවුන ට
සිතා ඉසිපතනාරාමය ට

---

162 මුනි, සර්වඥයන්වහන්සේ; එමවිට, එඇසිල්ලෙහි; අජපල්නුගමුලට, අජපාලනිග්‍රොධමූලයට; තැවත, යලිත්; වැඩ, වැඩමවා, මෙගැඹුරුදම්, මේගම්භීරධර්මය; කාට, කාවරක්හට; දෙසම්දූයි, දෙශනාකරම්දූයි; සිත්, චිත්තය; පසුබටවීය, පසුබැස්වූයේය–

163 එබවදත්, ඒභාවයදත්තාවූ; සිවුවත, චතුර්මුඛයා; (බ්‍රහ්මයා) පින්වත, පුණ්‍යවන්තය; මතු, අනාගතයෙහි; ලොවනැසෙයි, ලොකයවිනාසවේයයි; කියමින්, කථනයකරමින්; දෙසුම්සිත, දෙසනාචිත්තය; නොපසුවස්නාලෙසට, පසුනොබස්වනමෙන්; අයදිත, අයාචනාකලකල්හි–

164 බඹවදත බ්‍රහ්මාරාධනාව; පිළිගෙණ, ප්‍රතිග්‍රහණය කොට; නුවණැතියවුන්, ඥනවන්තයන්; බලමිණ, අවලොකනය කොට; අලාරුද්දකයන, ආලාර උද්දකය කියන්නාවූ; දෙදෙන, උභයජනයෝතුමූ; පරවිපිලිවූබවදූන, කාලක්‍රියාකලබැව් අවබොධ කොට:—

165 පස්වගමහණු, පඤ්චවර්ගීය ශ්‍රමණයෝතුමූ; මට, මාහට පෙරසිට, පූර්වයෙහිපටන්; උපකාරිය, උපකාරඇත්තෝය; (එහෙයින්) ඔවුනට, ඔවුන්හට; දම්, ධර්මය; දෙසම්, දෙශනාකරමැයි; සිතා, චින්තනයකොට; ඉසිපතනාරාමයට, ඍෂිපතනාරාම මහාවිහාරයට: —

---

+ නැසේමින්මතු පින්වතපොත්. *දෙදෙනමරුමූව සැපත්බව දූන, පොත්.

166 ඇසළපුණුපෝ ද
දරමින් සිවුරුපහ ද
අතරමග තොර ද
දසටයොත්තක්ම වැඩඑක් ද

167
එවෙහෙරෙහි සුග තා
වැඩහිඳ සගුන් අම තා
දහම් සක් දෙස තා
†ඔව්හුවූ මගපලට සැප තා

168
විසේතිය ලත් ද
පස්වග සඟුන් සමු ද
කරවමිති එම ද
අනත්සුතදෙස්නෙන්පහා ද

169
රහත්කරවමි තා
නැවතත් මුනිඳු විසි තා
එයස කුල සුත තා
රහත්කරවා පැවිදි දෙමි තා

170
ඔහුගෙ සිවුපණ සක්
යහලුවන් නුවෙත සක්
සිවුමගපලප සක්
කරවමින්දිපැවිදිමුනි සක්

---

166 ඇසළපුණුපෝද,ආසළ්හිපුණ්ණමීඋපොසථ දිනයෙහි; පහද, ප්‍රසන්නව; සිව්රුදරමින්, චීවරධාරණයකොට; අතරමග, අන්තරමාර්ගයෙහි; තොරද, නොනැවතී; එකද, එකදිනයෙහිම; දසටයොත්තක්ම, යොදුන්දහඅටක්ම; වැඩ, වැඩමවා:–

167 සුගතා,සුගතයන්වහන්සේ; එවෙහෙරෙහි, ඒ විහාර යෙහි; වැඩහිඳ, වැඩහිඳගෙණ; සඟුන්, පස්වගමහණුන්; අමතා, ආමන්ත්‍රණයකොට; දහම්සක්, ධම්මචක්කසූත්‍රදෙශනාව; දෙසතා, දෙශනාකරණකල්හි; ඔවුහු, ඒපස්වගමහණුන්නාන්සේලා; මග පලට, මාර්ගඵලයන්ට; සැපතාවුහු, සම්ප්‍රාප්තවූවෝය.

168 විසේතියලත්ද, පස්වනතිපියලත්දිනයෙහි; පස්වග සඟුන්, පස්වගභික්ෂූන්; එමද, එදිනයෙහි; සමුදකරවමිති, එක්; කොට; අනත්සුතදෙස්නෙන්, අනාත්ත්සූත්‍ර දෙශනා කිරීමෙන්; පහද පහදවා:–

169 රහත්කරවමිතා, අර්හත්වයට පමුණුවමින්; (මූලකවහා සම්බන්ධයි) නැවතත්, සලිත්; මුනිඳුවිසිතා, මුනීන්ද්‍රයන්වහන්සේ විසින්; එයසකුලසුතතා, එයසකුලසිටුපුත්‍රයාණන්; රහත්කරවා; අර්හත්වයටපමුනුවා; පැවිදිදෙමිතා, ප්‍රව්‍රජ්‍යා දනයකරමින්:–

170 ඔහුගේ, ඒයසකුලපුත්‍රයාගේ; වෙනසක්නු, අන්‍යථාව යක් නැත්තාවූ; සිවුපණසක්යහලුවන්, චතුපණ්ණසසහායයන්ට (යහලුවන් පණස්හතරදෙනාට)සිවුමගපල,චතුර්විධමාර්ගඵලයන්, පසක්කරවමින්, ප්‍රත්‍යක්ෂකරවා; මුනියක්, සර්වඥඋත්තමයා; පැවි දිදී, ප්‍රව්‍රජ්‍යාවදනයකොටලා:—

---

‡බඹහුවුමගපලට සැපතා, පොත්. බ්‍රහ්මයෝ මාර්ගඵලයන් වපැමිණියෝයයි අරුත් කියයුතු.

171 විසුවස් මුනි දා
සමග එරහත් සමු දා
පවුරුණුකොටඑ දා
පතළමහකුළුණුසිතනුමු දා

172
රහතුන් එක්සැ ටක්
වූවෙන්තමහැරසැ ටක්
පාසාරට ර ටක්
ගමන්කරවමිණිසාරපිහි ටක්

173
පරවැඩෙහි පුරු දූ
දෙසුමෙන් සතන් පැහැ දූ
එකොසරසි බ දූ
නතිව උරුවෙල් වඩිතමුනි දූ

174
අතරමගවනය කා
බදවගකුමරුවන් දැ කා
පැවිදිකර නොවලැ කා
පිහිටුවාමග පලෙහිඑකිනෙ කා

175
ඔවුන් මන හඳ නා
මෙහෙයා නෙදිගඑදි නා
උරුවෙල් වැඩි දි නා
නොයෙක්පෙළහරපා පාසොදි

---

171 එරහත්සමුදාසමග; ඒඅහ්තුන්සමූහයාහාඑක්ව; වස්විසු, වස්වැසුවාවූ; මුනිදා, මුනීන්‍ද්‍රයන්වහන්සේ, එදා; එවක්හි; පවුරුණු කොට; මහාපවාරණයකොට, පතලා; ව්‍යාප්තවූ; මහකුළුණුසිත් මහාකරුණාචිත්තය; නුමුදා, මූකනනොකොට; (දුරුනොකොට)

172 රහතන්, අහ්තුන්; එක්සැටක්, සැටඑක්නමක්; වූවෙන්, වුහෙයින්; තමහැර, තමන්වහන්සේහැර; සැටක්, හැටනමක්; රටරටක්පාසා, රාෂ්ට්‍රයක්පාසා; (රටක්ගානේ) පිහිටක්කර, ප්‍රතිෂ්ඨාවක්කරණුපිණිස; ගමන්කරවමින්, චාරිකායෙහි හසුරුව මින්—

173 පරවැඩෙහි, පරාර්ථචර්යාවෙහි; පුරුදු, පරිචයඇත්තාවූ; දෙසුමෙන්, (ධර්ම) දේශනාවෙන්; සතන්, සත්ත්වයන්නොහොත්; සන්තානයන්, පැහැදා; ප්‍රසන්නකළාවූ, මුනිදු, මුනීන්ද්‍රයන්වහන් සේ, එකොසරසිබඳු, එකචරසිංහරාජයෙකුමෙන්; නතිව, හුදකළා ව; උරුවෙල්, උරුවෙලජනපදයට; වඩිත, වඩිනාකල්හි—

174 අතරමග, අන්තරමාර්ගයෙහිවූ; වනයෙක, ආරණ්‍ය යෙක්හි විසුවාවූ;බදවගකුමරුවන්,භද්‍රවර්ගියකුමාරවරුන්; දැක දර්ශනයකොට; නොවැලැත, වැළැක්මිරහිතව; පැවිදිකර, ප්‍රව්‍ර ජ්‍යාවට පමුණුවා; එකිනෙක, එකීනෙකා; මගපෙළෙහි, ඒ ඒ මාර්ගඵලයන්හි; පිහිටුවා; ප්‍රතෂ්ඨාපිතකරවා–

175 මනනඳනා, මනොනන්දනීයවූ; ඔවුන්, ඒ හදුවග්ගීකක්ෂුන්; එදිනා, එදවස්හිම; නෙදිග,අනෙකදිසාවන්හි; මෙහෙයා පිටත්කරවා; නොයෙක්පෙළහරපපා, අනේකප්‍රාතිහාර්‍ය්‍යප්‍රකා ශකරමින්; සෙදිනා, වහා; උරුවෙල්, උරුවේල නම් ජනපදයට; වැඩිදිනා, වැඩමවූ දවස්හි–

176 දහසක් ජටිල යන්
සහතුන් බෑජටිල යන්
වසනා කුටිල යන්
පැවදිදී ඉදිකොටකුටිලයන්

177
ගයාහිසවස්වා
අදිත් පිරිසුත අස්වා
රහත් පල රුස්වා
දෙමින් මුනිසඳ සේ තොල ස්වා

178
ඛිම්සර තිරිඳු හටු
දුන් පෙර පිළිත සිහිකොට
වැඩරජ ගහා වට
අසල් වැල්මීවෙනෙහිඋන්විට

179 උයන්ගොව් දූකලා
හොස් නරනිඳුට තෙපලා
වැඩියේදසබලා
කිම්ද ඉදිනේ නොවැඩ ඔබලා

---

176 වසනා,වාසයකරන්නාවූ;කුටිලයන්,කායවඞකාදිවූවඞක සහිතව; තුන්බෑජටිලයන් සහ, තෙභාතිකජටිලයන්සහිතවූ; දහසක්ජටිලයන්, සහශ්‍රසඞ්ඛ්‍යාතජටාධරයන්ට; පැවිදිදී, ප්‍රව්‍රජ්‍යාදානයකොට; කුටිලයන්, වංකවූවන්; ඉදිකොට, ඍජුකොටලා–

177 ගයාහිය, ගයාසීර්‍ෂයෙහි; වස්වා, වහසකරවා, අදිත්පිරිසුත, ආදිත්තපරියායසූත්‍රය; අස්වා, ශ්‍රවනයකරවා, (අස්සවා) රහත්පල, අර්හත්ඵලය; රුස්වට, රුචිකරවා; දෙමින්, දත්යකරමින්; මුනි, සර්‍වඥයන්වහන්සේ; සඳසේ, සිත්වූපරිද්දෙන්; නොලස්වා, අතුලස්ව–

178 ඛිම්සරතිරිඳුහට, බිම්සරනරේන්ද්‍රයාහට; පෙර, පූර්‍වයෙහි; දුන්පිළිත, දතයකරණලදප්‍රතිඥව;සිහිකොට, සමරණයකොටලා; රජගහාවට, රාජගෘහනම් නගරයට; වැඩ, වැඩමවා; අසල්, ඒ රාජගෘහනගරයට සමීපවූ; වැල්මීවෙනෙහි, මඩුලසීානම් උයනෙහි; උන්විට, වැඩඋන්කල්හි–

179 උයන්ගොව්, උද්‍යානගෝපකතෙමේ; දූකලා, උන්වහන්සේ දර්‍ශනය කොටලා; ගොස්, ගමනයකොට; නරනිඳුට, නරේන්ද්‍රයාහට; දසබලා, දශබලධාරිවූ සර්‍වඥයන්වහන්සේ; වැඩියේය, ඔබනුවරට වැඩිසේක්දැය; ඔබලා, උන්වහන්සේකරා; නොවැඩ, ගමනය නොකොට; ඉදිනේ, වහසකරන්නේ; කිම්ද, කිමෙක් දැයි; තෙපලා, කථනය කෙළේය.

180 අසා එතිරිඳු ව ර
සමඟින් සෙනඟ පිරිව ර
ගොස් දැක මුනි පව ර
නැමදසිරිපද පසෙක උන්ව ර

181
රැස්ව උන් සමු දු
මුනිඳුට කසුප් ගුරු දු
ඔහුට මුනී ගුරු දු
සිතුසිතදැන සෙදින් මුනි දු

182
ගයකින් කසුප් හ ට
දන්වත එබව මොනව ට
හෙදගයකින් එවි ට
මුනිඳු ගුරුයයි දැන්වී සබය ට

183
එබව දත් දන රැ ස
කෙසේ දැමුවෙද මෙතවු ස
මුනිඳුන් මහිම මි ස
ඇද්දමහිමෙක්මෙතුන්ලෝකුස

184
කියත මුනි හ මුවේ
ලෝවැඩෙහිසිතයො මුවේ
දැන් මතුද දැ මුවේ
පෙරත් මොහු මාවිසින් දැ මුවේ

---

180 එතීරිඳුවර, ඒ නරේන්‍ද්‍රොත්තමයා; අසා, ඒ ප්‍රවෘත්තිය ශ්‍රවනය කොට; පිරිවරසෙනඟසමඟින්, පරිවාරසේනාවන් හා ගොස්, ගමනයකොටලා; පවර, ප්‍රවරවූ; මුනි, සර්ඥයන්වහන්සේ; දැක, දර්ශනය කොටලා; සිරිපද, ශ්‍රීපාදයන්; නැමද; නමස්කාරකොට; පසෙක, එක්පාර්ශවයෙක්හි; උන්වර, උපවේසනය කළ කල්හි;

181 රැස්වඋන්, රාශීභූතතව සිටියාවූ; සමුදු, සේනාතොමෝ; මුනිඳුට, සර්ඥයන්වහන්සේට; කසුප්, කාශ්‍යපතෙම,ගුරුදු, ආචාර්‍ය්‍යහෝවේදැයි; මුනිඳු, සර්ඥයන්වහන්සේ, සිතු චින්තනය කළාවූ; සිත, චිත්තය; සෙදින්, වහා දැන අවබොධකොට;

182 ගයකින්, ගාථාවකින්; කසුප්හට, කාශ්‍යපයන්හට; එබව, ඒ කාරණය; මොනවට, මනාකොට; දන්වත,දැන්වූකල්හි; හෙද, උන්වහන්සේද; එවිට; ඒ ඇසිල්ලෙහි; ගයකින්, ගාථාවකින්; මුනිඳු, සර්ඥයන්වහන්සේ; ගුරුයයි, (සටකීය) ආචාර්‍ය්‍යයන් වහන්සේයයි; සබයට, සභාවට; දැන්වී, අවබොධකරවීය.

183 එබව, ඒභාවය; දත්, දැනගත්තාවූ;දනරැස දනසමූහයා මෙතවුස්, මේතාපසයන්; කෙසේ කවර ආකාරයකින් දැමුවෙද; දමනය කෙළේදැයි මුනි, සර්ඥයන්වහන්සේගේ මහිමමිස මහත්බැව්විනා, මෙතුල්ලෝකුස, මෙත්‍රිවිධලෝක කුක්ෂියෙහි; මිහිමෙක්, මහිමතාවයෙක්; ඇද්ද, ඇත්තේදැයි;

184 මුනිහමුවේ, සර්ඥයන් සමීපයෙහි; කියත, කියනා කල්හි; ලෝවැඩෙහි, ලෝකාභිවෘඩියෙහි; සිත, චිත්තය; සොමුවේ, (අතීතයදෙසනුපිණිස) යොමුවීය; දැමුවේ, මේකාස්බන්දනය කෙළේ; දැන්මතුද, දැන්පමණක්නොවෙයි; පෙරත්, අතීතයෙහිත්; මොහු, මේකාශ්‍යපයා; මවිසින්, මාවිසින්; දැමුවේ, දමනය කොළේයයි;—වදරා,

185 එම දක්වනු ස ද
මහනාරද කසුප් ද
දෙසමින් මුනි ස ද
පහළකෙළෙ සිවුසසුන් එම ද

186
පිරිවර සහ තොම ද
බිම්සර නිරිඳු මනන ද
ලැබ මගපල එස ද
පවරමින් සඟ සමඟ මුනි ස ද

187
බැති සිත් දිවුනුකො ට
මුදුනැඳිලි බැඳ සහතු ට
නැමද පැදකුණු කො ට
ගොසිත් අවසරරැගෙණ නුවර ට

188
එපුරවිසු හැම ද
අටලොස් කෙළක් සමු ද
යන ලෙස පුද ස ද
කිසවි මෙමෙහෙවර නොහැර පස ද

189
තුන් ගව් පමණ ම ග
පුර නික්මුනු එසෙ න ග
නිසාමුනි සඟ ස ග
නොහැකි වඩනට අරවමින් ම ග

---

185 එම දක්වනු සඳ, එම කාරණය දක්වීම පිණිස; මහනාරද කසුප් ද, මහානාරද කාශ්‍යප ජාතකය; මුනිසඳ, මුනිඳුතුමා; දෙසමින්, දෙශනාකරමින්; එමද, එදිනයෙහි; සිවුසසුන්, චතුස්සච්චධර්මයන්; පහළකෙළෙ, ප්‍රකාශකර වදාළසේක.

186 තොමද, බොහෝවූ; පිරිවරසහ, පරිවාර ජනයා සහිතවූ; බිම්සර නිරිඳු, බිම්බිසාරනරෙන්ද්‍රයා; මනනද, මනොනන්දනීයවූ; මගපල, මාර්ගඵලයන්; එසඳ, එකල්හි; ලැබ, ලබා; සෙද, වහා; සඟ සමඟ, සංඝයා සහිතවූ; මුනි, මුනිඳුතුමා; පවරමින්, (භික්ෂාව සඳහා) පවරා;

187 බැතිසිත්, භක්තිචිත්තය; දිවුනුකොට, විපුණකරලා; සහතුට, සන්තොෂයෙන්; මුදුනැ, මස්තකයෙහි; ඇඳිලිබැඳ, අඤ්ජලිබඳකොට; පැදකුණුකොට, ප්‍රදක්ෂිණාකොටලා; නැමද, නමස්කාරකොට; අවසරරැගෙණ, අවකාශග්‍රහණයකොට; නුවරට, නගරයට ගොසින්, ගමනයකොට;

188 හැමද, සියලු කල්හි; එපුර, ඒනගරයෙහි; විසු, වාසය කළාවූ; අටලොස්කෙළක්, අෂ්ටාදශකොටියක් පමණවූ; සමුද, සේනාවට; පුදසද, පූජාවන් සූදානම්කොටගෙණ; පසද, දෙවනිදින යෙහි; යනලෙස, යනපරිද්දෙන්; නොහැර, අත්නොහැරම; මෙමෙහෙව රකියැව්, පනිවිඩකියවූයේය;

186 තුන්ගව්පමණ මග, ගාවුතත්‍රයක් ප්‍රමාණවූ මාර්ගයෙහි; පුර, පිරී; නික්මුනු, නිෂ්ක්‍රාන්තවූ; එසෙනසනිසා, ඒ සමූහයානිසා; මුනිසඟ සර්වඥයන්වහන්සේ සහිතවූ; සඟ, මහාසංඝයාවන්; වඩනට, වැඩමවීමට; මගඅරවමින්, මාර්ගයපාද ගනිමින්; වඩනටනොහැකිව, වැඩමවීමට නොහැකිව සිටිනාඅතර;

190 පඬුපුල් සල එස ද
උණුවූහෙයින් සක් ර ද
මෙතෙව් වෙසකින් මෙස ද
අවුත් කොළහල නවතමින් තෙද

| 191 | | 193 | |
|---|---|---|---|
| තෙරුවන් ගුණ ව | නා | තෙරුවන් විනා | ම ට |
| පහකොට නරන්ගෙහෙ | නා | දිනකුත් නොහැකි විසු | ම ට |
| විසින් ඒ සුර | නා | නිති වැද පිදී | ම ට |
| කෙළේ වඩිනා ලෙසව මුනි | නා | වේලුවන නම් නුදුරයා | ම ට |

| 192 | | 194 | |
|---|---|---|---|
| බිම්සර රජු එවි | ට | කරුණාකොට සුග | ත |
| බුදුපාමොක් සඟනග | ට | උයන මයෙහෙකැයි පිළිග | ත |
| වළඳවා නිසිකො | ට | කියමින් පැහැද සි | ත |
| නැමද මෙලෙසින් කියයි මුනිඳු | ට | උයන පිළිගැන්වී පැණෙව අ | ත |

---

190 එසද, එකල්හි; පඬුපුල්සල, පාණ්ඩුකම්බලශෛලාසනය; උණුවූහෙයින්, උෂ්ණවූහෙයින්; සක්රද, ශක්‍රරාජයා; මෙසද, මහා; මෙතෙව්වෙසකින්, මාණවක වෙශයකින්; අවුත්, පැමිණ; තෙද, තමන්ගේ දිව්‍යතෙජසින්; කොළහල නවත්තමින්, කෝලාහල නවත්වා;

191 තෙරුවන්, රත්නත්‍රයෙහි; ගුණවණා, ගුණයන්වර්ණනා කොට; ගෙහෙනා, ගෘහපත්ව; නරන්, මිනිසුන්; පහකොට, අහක් කොට; ඒ සුරණ විසින්, ඒ ශක්‍රදේවෙන්ද්‍රයා විසින්; මුනිනා, සර්වඥයන්වහන්සේට; වඩිනාලෙසට, වැඩමවනපරිද්දෙන්; කෙළේ, ම ගීය කෙළේය;

192 එවිට, එකල්හි; බිම්සරරජ, බිම්බිසාර රජයා; බුදුපාමොක් සඟනගට, බුඩප්‍රමුඛභික්ෂුසංඝයාවහන්සේට; නිසිකොට, යොග්‍යආකාරයෙන්; වළඳවා, වළඳවාලා; මුනිඳුට, මුනීන්ද්‍රයන්ට; මෙලෙසින්, මෙයාකාරයෙන්; කියයි, ආයාචනා කෙරෙයි;

193 මට, මාහට; තෙරුවන්විනා, තුනුරුවන්ගෙන් තොරව; විසුම්ට, වාසයකිරීමට; දිනකුත්, දවසකුත්; නොහැකි, නොහැක්කේය; නිති, නිත්‍යයෙන්; වැදපිදීමට, වැඳුම් පිදුම්කිරීම පිණිස; යාමට, ගමන්කිරීමට; වේලුවනනම්, වේලුවනය නම්; නුදුර, දූර නොවන්නේය;

194 සුගත, සුගතයන්වහන්ස; කරුණාකොට, කුළුණුඋපදවා; උයන, උද්‍යානය; පිළිගත, ප්‍රතිග්‍රහණයකෙළේනම්; මයෙහෙකැයි; මැනවැයි; කියමින්, කථනයකරමින්; සිතපැහැද, චිත්ත ප්‍රසන්නව, අත, හස්තයෙහි; පැන්එව, පැන්වත්කොට; උයන, උද්‍යානය; පිළිගැන්වී, ප්‍රතිග්‍රහණය කරවූයේය.

195 පිළිගෙණ කැපලෙස ව
මහපොළොව කම්පාකො ව
උයනෙහ නිති ඒසුම ව
වැඩියෙය මහ සඟන පිරිවරයො ව

196

අගසැව් යුග පව ර
පිරුපෙරුමන් ඇති පෙ ර
b සමග තම පිරිව ර
c පැවිදි ලැබ අගපලට පත්ව ර

197

එඋයන හසල ක ර
සඟන තරු පිරිවර ක ර
d ලොව මොහඳුරු දුරු ර
දිලෙන වර මුනි පිරි තුසුරකා ර

198 සුදවුන් නරප ව ර
දකිනා රිසින් මුනි ව ර
මැතිඳ කුස පිරි ව ර
ගමන් කරවී පසිදු එනු ව ර

---

195 කැපලෙසට, කැපවූ පරිද්දෙන්; පිළිගෙණ, ප්‍රතිග්‍රහණය කොට; මහපොළොව, මහාපෘථිවිය; කම්පාකොට, වෙවුල්වා; උයනෙහ, උද්‍යානයෙහි; නිති, නිරන්තරයෙන්; ඒසුමට, වාසයකිරීමට; මහසඟන, මහාසඞ්ඝයාවහන්සේ; පිරිවරකොට, පරිවාරකොටගෙණ; වැඩියෙය, වැඩමවූසේක.

196 පෙර, පූර්වයෙහි; පිරුපෙරුමන්, පුරණලද පාරමිතාවන්; ඇති, ඇත්තාවූ; පවර, උතුම්වූ; අගසැව්යුග, අග්‍රශ්‍රාවක යුග්මය; තම පිරිවර සමග, තමන්වහන්සේලාගේ පරිවාර ජනයා හා; පැවිදි ලැබ, ප්‍රව්‍රජ්‍යාලාභිව; අගපලට, අග්‍රවූ ඵලයයි කියනලද නිර්වාණයට හෙවත් මාර්ගඵලයට; පත්වර, පැමිණි කල්හි;

197 ලකර, අලංකාරවූ; e එඋයනහස, ඒ උද්‍යානය නමැති ආකාශයෙහි; සඟන, සඞ්ඝයා නමැති; තරු, තාරකාවන්; පිරිවර කර, පරිවාරකොටගෙණ; ලොව, ලෝකවාසී ජනයාගේ; මොහඳුරු, මෝහාන්ධකාරය; දුරුර, දුරුකොටලා; මුනි, සර්වඥයන්වහන්සේ නමැති; පිරිතුසුරකර, පූර්ණ චන්ද්‍රයා; දිලෙනවර, බබලන කල්හි;

198 සුදවුන්, ශුද්ධෝදන නමැති; නරපවර, නරෝත්තමයා; මුනිවර, මුනි උතුමා; දකිනාරිසින්, දකිනු කැමැත්තෙන්; සපිරිවර, පරිවාර සහිතවූ; මැතිඳකු, මන්ත්‍රීන්ද්‍රයකු; පසිදු, ප්‍රසිද්ධවූ; එනුවර, ඒ නගරයට; ගමන් කරවී, යැවූයේය.

---

a වැඩිය මහසඟ පිරිවරතුටු, පොත්. b සමග තරු පිරිවර යි බොහෝ පොත්. c පැවිදි ලැබ මගපලට පත්වර. පොත්. d මොහ අඳුරු දුරුකර, මෝහ අඳුරු, මෝහාන්ධකාරය; දුරුකර, දූරීභූත කොට; මෙසේනම් පදයද මැනවි. එලියද සමවේ. නමුත් හැම පොත් වලම තිබුණ පිළිවෙල වෙනස් නොකෙළෙමු. e එ උයන අසල් කරකියා වැඩි පොතක දක්නා ලැබේ.

199 ගොස් එමැතිඳුප වර
දම් දෙසන වර මුනි වර
සිට පිරිස් කෙළ වර
අසා ලැබ මග පලද එම වර

200

හැවත මුනි රජුගෙ න
පැවිදි ඉල්ලුව හැමදෙ න
එව මහණ මෙහි ය න
තෙපලකින් ලැබ පැවිදි වෙනවෙ න

201

රහත්වූ තැන් සි ට
මැදහත් බැවින් හැමවි ට
කෙනෙක් වත් මුනිඳු ට
නොකී රජු කී අස්න සිහිකො ට

202

මෙලෙසින් නර ප වර
දහසදහසැති පිරි වර
නවදෙනෙකු මැති වර
ගමන් කරවූ සඳ වරින් වර

203

ඉන් ආ කෙනෙක්ව ත්
උන්ගෙන් ලත් බසෙක් ව ත්
නැත්තෙන් රජු මහ ත්
දුකින් ඉද මෙලෙසින් හැවත ත්

---

199 පවර, උතුම්වූ; එමැතිඳු, ඒ මන්ත්‍රීන්ද්‍රයා; ගොස්, ගමනය කොට; මුනිවර, මුනි උතුමා; දම්දෙසනවර, ධර්මදෙශනා කරණ කල්හි; පිරිස් කෙළවර සිට, පිරිසපරියන්තයෙහි සිටගෙණ; අසා, එම ධර්මශ්‍රවනයකොට; එමවර, එඇසිල්ලෙහි; මගපලද, මාර්ගඵල යන්ද; ලැබ, ලැබූ;

200 හැවත, යලින්; මුනිරජුගෙණ, සර්වඥරාජයාණන්ගෙන්; හැමදෙන, සියලුදෙනාම; පැවිදි, ප්‍රව්‍රජ්‍යාව; ඉල්ලුව, අයැදසිටිකල්හි; මහණ, ශ්‍රමණය; මෙහිඑවයනතෙපලකින්, මෙහි (මාකරා) එව්යයන වචනයකින්ම; වෙනවෙන, වෙන්වෙන්ව; පැවිදිලැබ, ප්‍රව්‍රජ්‍යාලාභිව;

201 රහත්වූ තැන්සිට, අර්හත්වයට පැමිණිතැන් පටන්; හැමවිට, සියලුකල්හිම; මැදහත්බැවින්, මධ්‍යස්ථවන බැවින්; කෙනෙක්වත්, පැමිණියවුන් අතුරෙන් කිසිවෙකුවත්; මුනිඳුට, මුනීන්ද්‍රයන් වහන්සේට; රජුකී, රජයාවිසින් කියනලද; අස්න, සන්දේශය; සිහිකොට, සමරණයකොට; නොකී, කථායනොකෙළේය.

202 මෙලෙසින්, මෙයාකාරයෙන්; නරපවර, නරෙන්ද්‍රොත්තමයාගේ; දහසදහසපිරිවරඇති, දහසක් දහසක් පිරවර ඇත්තාවූ; මැතිවර, මන්ත්‍රිඋත්තමයන්; නවදෙනෙකු, නවදෙනෙක්ම; වරින්වර, වාරයෙන් වාරයෙහි; ගමන්කරවූ සඳ, පිටත්කළකල්හිත්;

203 ඉන්, ඒ රාජගෘහනගරයෙන්; ආ කෙනෙක්වත්, පැමිණියාවූ කෙනෙක්වත්; උන්ගෙන්, ඔවුන්ගෙන්; ලත්, ලබනලද; බසෙක්වත්, පනිවිඩයක්වත්; නැත්තෙන්, නැතිහෙයින්; රජු, රජයා; මහත් දුකින්, බලවත් දුකඛයෙන්; ඉද, නිසීදනයකොට; හෙවත් (කල් ඉක්මවා) මෙලෙසින්, මෙයාකාරයෙන්; හැවතත්, යලින්;

204 වැලිකෙළියෙහි පව නා
මුනිඳුව ඉටු මිතුරුව නා
කාළුදායී ය නා
මැතිඳු හැර අනිකෙක් නැතැයි දූ නා

205
a ගෙන්වා තමාවෙත ට
පිය බසිනි සිත තුටුකො ට
දුසක් අඩුනොකො ට
ලවා පිරිවර යවයි එමවි ට

206
ගොස් රජගහාව ට
b මුනිඳුන් බණ දෙසන වි ට
පිරිස් කෙළවර සි ට
අසා පිරිවර සමග සතු ට

207 රහත් පල ලැබ ලා
මහණව වසන එහි ලා
හිමකල් ඉකම් ලා
c වසත් කල් පැමිණි බව දූක ලා

---

204 වැලිකෙළියෙහි පවත, වාලුකා ක්‍රීඩායෙහි සිටම; (කුඩා කාලයෙහි සිටම) මුනිඳුව, මුනීන්ද්‍රයන් වහන්සේට; ඉටුමිතුරුවත, ඉෂ්ටමිත්‍රවූ; කාළුදායීනම, කාළුදායි කියන්නාවූ; මැතිඳුහැර, මන්ත්‍රීන්ද්‍රයා හැර; අනිකෙක්, පොහොසත්වූ) අන් කිසිවෙක්; නැතැයි, නැත්තේයයි; දූත, අවබෝධකොට්ලා;

205 තමවෙතට, තමන් සමීපයට; ගෙන්වා, කැඳවා; පියබසිනි, ප්‍රියවූ වචනයෙන්; සිත, චිත්තය; තුටුකොට, තුෂ්ටකොට්ලා; දුස සක් අඩුනොකොට, සංග්‍රහයකින් ඌනනොකොට; පිරිවර, පරිවාර ජනයා; ලවා, සාදවා; එමවිට, එම ඇසිල්ලෙහි; යවයි, ගමන්කර වයි;

206 රජගහාවට, රාජගෘහනගරයට; ගොස්, ගමනයකොට; මුනිඳුන්, මුනීන්ද්‍රයන් වහන්සේ; බණදෙසනවිට, ධර්මදේශනාකරණ කල්හි; පිරිස් කෙළවර සිට, පර්ෂත් අන්තයෙහි සිට; පිරිවර සමග, පරිවාර ජනයා හා; සතුට, සන්තුෂ්ටව; අසා, ශ්‍රවණයකොට;

207 රහත්පල, අර්හත්ඵලය; ලැබලා, ලබා; එහිලා, එම විහාරයෙහිම; මහණව, ශ්‍රමණ භාවයට පැමිණ; වසන, වසනාකල්හි; හිම කල්, හේමන්තකාලය; ඉක්මිලා, අතික්‍රාන්තව; වසත්කල්, වසන්ත කාලය; පැමිණිබව, ප්‍රාප්තභාවය; දූකලා, දර්ශනයකොට;

---

a කෙන්වා ඔහුලගට-පොත්. b මුනිඳු බන දෙසනාවිට-පොත්.
c වසත්කල පැමිණිබව දූකලා.

208 කිඹුල්වත් පුරය ට
සුදොවුන් රජුගෙ යැදුම ට
කුළුණුකර එඩින ට
කල් මෙයයි දුන්වීය මුනිදු ට

| 209 | | 210 | |
|---|---|---|---|
| * දූඩි සිතද නැයි | වී යේ | කුලනුවරට වැඩ දස බ | ල |
| a වැඩි ගිමනුදු නොම | වී යේ | දුලබ දහම් වදහල ක | b ල |
| වැඩි සස් ඇති කල් | වී යේ | කුලකොත් තිරිඳුව මහක | ල |
| වඩිනට මනකල් | වී යේ | සළකව මතු වන වැඩ ප | ල |

211 අගපත් වන බවට එස ද
සිය කැත්කුලයට මේ ස ද
c බලවත් පිහිටක් වනලෙ ද
වැඩියොත් යෙහෙකැයි මුනිස ද

---

208 සුදොවුන්රජුගෙ, සුඬොදන රජයාගේ; යැදුමට, යාඥාවට; කිඹුල්වත්පුරයට, කපිලවස්තු නගරයට; කුළුණුකර, කරුණාකර; වඩිනටකල්, වැඩමවීමට කාලය; මෙයයි, මේයයි; මුනිඳුට, මුනීන්ද්‍රයන් වහන්සේට; දුන්විය, දුන්වූයේය.

209 දූඩි සිතද, දැඩිවූ සිතගුණයද; නැතිවීයේ, නැතිවීය; වැඩි ගිමනුදු, වැඩිවූ ඝර්මයකුදු; නොමවීයේ, නොවීය; වැඩිසස්කල්, අධිකවූ ශස්‍ය ඇති කාලයද; ඇතිවීයේ, විද්‍යමානවිය; (එහෙයින්) වඩිනට, (කිඹුල්වත්පුර) වඩිනු පිණිස; මනකල්වීයේ, මනොකල්‍යවීය; (යහපත්වීය)

210 දසබල, දශබලධාරිවූ සර්වඥයන් වහන්සේ; කුලනුවරට, කුලනගරයට; වැඩ, වැඩමවා; දුලබදහම්, දුර්ලභධර්මය; වදහලකල, වදාළකල්හි; මනකල, මනොකල්‍යවූ; කුලකොත්, ශාක්‍යකුලයට කොතුවක් වැනිවූ; තිරිඳුට, නරේන්ද්‍රයාහට; මතු, අනාගතයෙහි; වන, සිඞවන්නාවූ; වැඩපල, අභිවෘද්ධි ඵලය; සලකව, සැලකුව මැනවි;

211 සිය කැත්කුලයට, ස්වකීය ක්‍ෂත්‍රිය වංශයට; එසද, එකල්හි; අගපත්වනබවට, අග්‍රප්‍රාප්තවන බවට; මෙසද, මේ කාලයෙහි; බලවත් පිහිටක්වනලෙද, දෘඪප්‍රතිෂ්ඨාවක් වනමෙන්; මුනිසද, මුනීන්ද්‍ර චන්ද්‍රය; වැඩියොත්, වැඩියේවීනම්; යෙහෙකැයි, යහපතැයි; කීයේය.

---

* දූඩිවූ සිතද කියා හැම පොත්හිම දක්නාලැබේ. a දූඩිගිමනුදු b දුලසදහම් වදහළකල–පොත්. c සියකැත් කුලයට මේසද. බලවත් පිහිටක්වනසද. වැඩියොත් යෙහෙකී මුනිසද–මෙසේද පොත්.

212 සවණක් රැස් දුටු සවිස ත
මනසක් තුටුකෙරෙති සතු d ත
සගමොක් සිරි ලබනු නිය ත
e දිවසක් ලා බලව සුග ත

213

තුරුලිය කොළ සැලෙමින් ව න
දලු ලි ය සහලගුරෙව් ග න
උදු ලි ය හැමතැන වෙසෙසි න
ඉපි ලි ය දුටුවන් නෙත් ම න

214

E දුම දුම කිම සුපිපි මි ලී
ගුම ගුමයසි බිඟු නද ලී
බිම හැමතැන තණ ලිය ලී
මෙම ගමනට කලැසි බ ලී

---

212 සුගත, සුගතයන්වහන්ස; සවණක් රැස්, ෂඩ්වර්ණරශ්මීන්; දුටු, දර්ශනයකළාවූ; සවිසත, සකලසත්වයන්ගේ; සතත, ඒකාන්තයෙන්; මනසක්, මනෝචක්ෂූන්; (ඇස් සිත්) තුටුකෙරෙති, තුෂ්ටිකෙරෙත්, නියත, නිශ්චයෙන්; සගමොක් සිරි ලබනු, ස්වර්ගමොක්ෂශ්‍රීය ලැබීම; දිවසක්ලා, දිව්‍යචක්ෂූස්හෙලා;' බලව, බලාවිදලමැනව;

213 වන, වනයෙහිවූ; තුරුලිය, වෘක්ෂලතාවන්ගේ; කොල සැලෙමින්, පත්‍රපතිතවෙමින්; ගන, ඝනවූ; සහලගුරෙව්, ගිනිඅඟුරුමෙන්; දලුලිය, දලුලැවේය; හැමතැන, සියළු ස්ථානයම; උදුලිය, උජ්වලිතවීය; (බබලන්වවිය) දුටුවන්, දර්ශනය කළවුන්ගේ; මනනෙත්, මනොනෙත්‍රයන්; ඉපිලිය, උපුල්වීය.

214 දුමදුමකිම, වෘක්ෂයක්පාසාම; සුපිපි, සුපුෂ්පිතවූ; මලී, පුෂ්පයන්හි; ගුමගුමයසි, ගුම් ගුම් යන අනුකරණයෙන් යුක්තවූ; බිඟුනද, භෘඞ්ගනාදය; ලී, ඇවැත්තේය; බිම, භූමියෙහි; හැමතැන, සියළුතන්හි; තණ, තෘණයන්; ලියලී, දළුලැයේය; (එහෙයින්) මෙම, මේකාලය; ගමනට, (සිරිනුවර) වැඩමවීමට; බලි, බලවත්වූ; කලැසි, කාලයයසි

---

A දුලසදගම් වදගලකල. පොත් B යෙහෙකී. කෙරෙසි සතත C දිවසක්ලා නරඹ සුගත. D සිය කැත්කුලයට මේසද. මනසක් තුටුකරණ සද. බලවත් පිහිටක් වන සද. වැඩියොත් යෙහෙකී මුනිසද. මෙසේද පොත්. E දුම දුම, වෘක්ෂයක් පාසා; හිම, හිමයෙන් ගැවසීගත්තාවූ; සුපිපි, මනාව පිපුනාවූ; මලී, මල් ඇත්තාවූ කියාත් අපි කියහැක.

215 සිට මුනිවෙත නිවන් දෙනා
එව විට වැඳ තොසින් පිනා
තුටු වඩවන බසින් මනා
සැට ගයකින් ගමන් වනා

216

දිනිඳු උදවූ විලසට
නිරිඳු සඳ එනු නුවරට
තෙරිඳු උදයි මෙලෙසට
මුනිඳු යොදලී වඩිනට

217

අඟු මගදින් දස දහසක්
කපිල පුරෙන් දස දහසක්
a සඟ රහතුන් විසි දහසක්
පිරිවරමින් වැඩ මුනි සක්

218

තුටු රජගහ නුවරෙහි සිට
සැට යොදුනෙහි කපිල පුරට
සිට සිට යොදුනෙන් යොදුනට
සැට දවසක් විය වඩිනට

219

වඩිනට මුනි නික්මුනු දින
නිරිඳුට දන්වන දහසින
p අහසට නැගෙමින් තොලසින
රජගෙට තෙරිඳුන් වැඩිනැන

---

215 නිවන්දෙනා, නිර්වාණසුවය දානයකරන්නාවූ; මුනිවෙත, බුදුරදුන් ගමුවෙහි; සිට, සටිනව; තොසින්, සංතොෂයෙන්; පිනා, පීනනායව; විට විට, නැවත නැවතත්; වැඳ, නමස්කාරකොට; මනා, යහපත්වූ; තුටුවඩවන, තුෂ්ට වඩිනය කරවන්නාවූ; බසින්, වචනවලින් යුක්තවූ; සැටගයකින්, හැටක් පමණවූ ගාථාවලින්; ගමන්වණ, ගමන් විස්තරය වර්ණනාකොට.

216 දිනිඳු, දිනෙන්ද්‍රයා; උදවූ විලසව, උදගතවූ කලක්මෙන්; නිරිඳුසඳ, (පිය) නිරිඳුතිසා; නුවරට, නගරයට; එනු, වැඩමවීමට; උදයිතෙරිඳු, උදයි (කාලුදායි) උදයී ස්ථවිරෙන්ද්‍රයා; මෙලෙසට, මෙයාකාරයෙන්; මුනිඳු, මුනීන්ද්‍රයන්වහන්සේගේ; වඩිනට, වැඩම වීම පිණිස; යොදලී යොදවාලූයේය.

217 අඟුමගදින්; අංගමගධදෙරටින්; දසදහසක්, දශසහස්‍රයක්ද; කපිලපුරෙන් කිඹුල්වත් පුරයෙන්ද දසදහසක් දශසහස්‍රයක්ද; සඟරහතුන්, රහත් සංඝයා; විසිදහසක්, විංසති සහස්‍රයක් දසි; (යන මේතෙක්දෙනා වහන්සේ) මුනිසක්, සර්වඥඋත්තමයා; පිරිවරමින්, පිරිවරා; වැඩ, වැඩමවීමට ආරම්භකළසේක.

218 තුටු, තුෂ්ටවූ; රජගහනුවරෙහි සිට, රාජගෘහනගරයෙහි සිටලා; කපිලපුරට, කිඹුල්වත් නගරයට; සැටයොදුනෙක, ෂෂ්ටි යොජනයෙක; යොදුනෙන් යොදුනට, යොජනයෙක් යොජනයෙන්හි; සිටසිට, වැඩවසමින්; වඩිනට, වැඩමවීමට; සැටදවසක් විය, දවස් හැටක් ගතවූයේය.

219 මුනි, සර්වඥයන් වහන්සේ; වඩිනට, වැඩමවීම පිණිස; නික්මුනුදින, නික්මුනාවූ දවසෙහි; නිරිඳුට, (පිය) නරෙන්ද්‍රයාහට; දන්වන අදහසින, දන්වනඅධ්‍යාශයෙන්; තොලසින, වහා; අහසට, ආකාශයට; නැගෙමින්, පැණනැගී; තෙරිඳුන්, ස්ථවිරෙන්ද්‍රයා; රජගෙට, රාජගෘහයට; වැඩිනැන, වැඩමවූ කල්හි.

---

a රහත් සඟුන් කියාත් මහරහතුන් කියානවේ.
p අහසට වඩිමින් තොලසින පොත්.

220 හිඳු වා අස්නෙක නොල සේ
සඳ වා ලූ බුදින ලෙ සේ
a පුර වා පා පිඬු සක සේ
නොයවා කල් දුනිය නො සේ

221
පිළි ගෙ න පිඬු පා එස දේ
නැගිතැ න යන ලෙස යති දේ
වලඳ න මිස මෙහිම ඉ දේ
කිම තැ න කට වඩිනු අ දේ

222
d කුළුණෙන් නොපදකිනලෙසින
අදදූ න් නික්මුනි නොලසින
c එසෙයින් පිඬු මුනි වළඳ න
ලෙසදූ න් ගෙණයෙමි නිරිඳු න

223 එබ සට නරනිඳු සහ'තු ට
මෙපුරට වඩිනා අතර ට
මුනිඳු ට පිඬු වැළඳීම ට
b අද සිට දෙමි ගෙණ වඩින ට

---

220 තොලසේ, වගා; අස්නෙක, ආසනයෙක්හි; හිඳුවා, වැඩ ඉන්දවා; බුදිනලෙසේ (නමහා) අනුභවකරණ පරිද්දෙන්; සදවාලූ, සාදවාතිබූනාවූ; පිඬු, පිණ්ඩයෙන්; පා, පාත්‍රය; සකසේ, සකස්ව; පුරවා, පූර්ණයකරවා; කල්නොයවා, කාලය නොඉක්මවා; නොසේ, සතුටින්; දුනිය, පිළිගැන්වීය.

221 එසදේ, එකල්හි; පිඬුපා, පිණ්ඩපාතය හෝ පිඬු සහිත පාත්‍රය; පිළිගෙණ, ප්‍රතිග්‍රහණයකොට; යතිදේ, යතීන්ද්‍රයා; යනලෙස, වඩින පරිද්දෙන්; නැගිතැන, නැගීයල්හි; මෙහිම ඉදේ, මේ රාජ භවනයෙහිම වැඩහිඳගෙණ; වළඳනමිස, වළඳනවා විනා; අද, අද දිනයෙහි; තැනකට, අන් ස්ථානයකට; වඩිනු, වැඩමවීම; කිම, කිමෙක්ද.

222 නොප, යුෂ්මතුන්; දකිනලෙසින, දකිනමෙන්; කුළුණෙන්, කරුණාවෙන්; නොලසින, අනලස්ව; අද, අදදිනයෙහි; දූන්, මේ වර්තමානකාලයෙහි; නික්මුනි, නික්මුනුසේක; එසෙයින්, එසේහෙයින්; මුනි, මුනීන්ද්‍රයන්වහන්සේව; පිඬුවළඳනලෙස, පිණ්ඩයවළඳන ලෙසට; නිරිඳුන, නරේන්ද්‍රයානෙනි; දූන්, ඉතින්; ගෙණයෙමි, ගෙණයන්නෙමි;

223 නරනිඳු, නරේන්ද්‍රයා; එබසට, ඒවචනයට; සහතුට, සංතුෂ්ටව; මෙපුරට, මේ නගරයට; වඩිනාඅතරට, වැඩමවන කාලයතුල; මුනිඳුට, මුනීන්ද්‍රයන්වහන්සේට; පිඬු වැළඳීමට, පිණ්ඩය වැළඳීම පිණිස; අදසිට, අද පටන්; ගෙණ, ප්‍රතිග්‍රහණයකොට; වඩිනට, වැඩමවීමපිණිස; දෙමි, දානයකරමි.

---

a පුරවා පය පිඬු සකසේ පොත් d කුළුණෙන් නොප දකිමැයි යන. පොත් c එහෙයින් යනු බොහෝ සෙයින්ම මෙහි එහෙයින් කියාම පොත් කීපයකම තිබෙන බැවින් එසේම ලීවෙමු. මෙය ග කාරයට ස කාරා දෙසවුනැති මිා බොහෝදෙනා ව්‍යාඩවූවත් සිරිසල් හිරියල් වූනැත් මෙනි. වන පොත් මෙහි තෙණ්ණයන තැන්හි න කාරය මූර්ධජවියයුතුමුත් එලිවැටනියා දන්තජ ආදේශයයි සැලකිය යුතු. b අද සිටගෙණ දෙමි මෙබඳට පොත්.

224
තෙරිඳුන් වළඳවා නිරිඳු
කෙරෙමින් එම පා පිරිසුදු
වෙසෙසින් දිවබොජුනක් බඳු
අහරින් පුරවාදුනි මුදු

225
බලමින් සිරිමහ දනාට
වඩමින් බැතිපෙම් නිරිඳුට
හරිමින් පා පෙරදැරිකොට
නගිමින් තෙරිඳුද අහසට

226
බසිමින් මුනි වඩිත පෙරට
තොලසින් පිඬුදුනි බුදිනට
මෙලෙසින් වඩිනා අතරට
එරදුන් පිඬුවිය මුනිඳුට

227
නුවරට වඩිනවර
සතොසින් පෙර ගමන් කර
කැත්කුල නර පවර
මුනිඳු කැඳවා එමින් එනුවර

228
නුග අරම සොබනා
සදවා නොයෙක ලෙසිනා
†වස්වා මන පිනා
රහත් විසිදහස පිරිවරිනා

---

224 නිරිඳු, නරෙන්ද්‍රතෙම; තෙරිඳුන්, සථවිරෙන්ද්‍රයන්; වළඳවා, අනුභවකරවා; එමපා, එම පාත්‍රය; පිරිසිදු කෙරෙමින්, පිරිසිදු කොට; වෙසෙසින්, විශෙෂයෙන්; දිවබොජුනක් බඳු, දිව්‍ය භොජනයක් වැනිවූ; මුදු, මෘදුවූ; අහරින්, ආහාරයෙන්; පුරවාදුනි, සම්පූර්ණකොට පිළිගැන්වූයේය.

225 බලමින් සිටි, නිරීක්ෂණය කරමින් සිටියාවූ; මහදනහට, මහාජනයාගේද; නිරිඳුට, (සුද්ධොදන) නරෙන්ද්‍රයාගේද; බැතිපෙම්, භක්තිප්‍රෙමය; වඩමින්, වර්ධනයකෙරෙමින්; පා, පාත්‍රය; පෙරදැරිකොට, ඉදිරියෙහි කොටලා; හරිමින්, ප්‍රෙරණය කරමින්; තෙරිඳුද, සථවිරෙන්ද්‍රයාද; අහසට, ආකාශයට; නගිමින්, උල්ලංඝනයකරමින් (පැනනගිමින්)

226 මුනි, සර්වඥයන්වහන්සේ, වඩිත, වැඩමවන්නාවූ; පෙරට, ඉදිරියට; බසිමින්, බැසලා; තොලසින්, වහා; පිඬු පිණ්ඩය; බුදිනට, වැළඳීමපිණිස; දුනි, පිළිගැන්වීය; මෙලෙසින්, මෙයාකාරයෙන්; වඩිනා, වැඩමවන්නාවූ; අතරට, අනන්තරයට; (කාලයතුලම) මුනිඳුන්ට, මුනීන්ද්‍රයාණන්ට; එරදුන්, (ශුද්ධොදන)රාජයාගෙත්ම; පිඬු, පිණ්ඩය; [illegible] (සිඩ) වූයේය.

227 නුවරට, (ස්වකීය) නගරයට; වඩිනවර, වැඩමවනකල්හි; සතොසින්, සන්තොෂයෙන්; පෙරගමන්කර, පෙරගමන්කොට; කැත්කුල නර පවර, ක්ෂත්‍රියගොත්‍රයෙහිවූ සත්වයන්ට උත්තමවූ රජයා; මුනිඳු, මුනිඳුතුමා; එනුවර, ඒකපිලවස්තු නගරයට; කැඳවා එමින්, වැඩමවා ගෙණවුත්.

228 සොබනා, සොභමානවූ; නුගඅරම, න්‍යග්‍රොධාරාමය; නොයෙක ලෙසිනා, අනෙකාකාරයෙන්; සදවා, සජ්ජිතකරවා; රහත් විසිදහස පිරිවරිනා, විසිදහසක්පමණ රහතන් විසින් පිරිවරණ ලදුව; මනපිනා, මනොපිනනයකොට; වස්වා, වාසකරවා.

---

* වඩමින් බැතිපෙම් පිට පිට. පොත් † වස්වා නොයෙක සරිනා සදවා එගම නා පොත්.

229 ඉක්බිතිව කැත්කු ල
සිතත් මෙලෙසින් ආක ල
නපුරුද නොවැදි ක ල
කෙසේ උදිමුද ඔනු බාලක ල

230
රජ සැපත ආ ලය
නොනොකාව රකිතත් සී ලය
මෙතෙම සගබා ලය
කෙසේ වදිමුද ඉතුත් බා ලය

231
නැතත් කිසි උණ හය
මොහු නෑකමින් බැ හය
එයින් අපම. හය
කෙසේ වදිමුද නොවී මා හය

232
නෑකමින් සුහු රුය
බාලේ පටත් මිතු රුය
බුදුවුණෙත් ගු රුය
එසේවුවත් වැදුම් අග රුය

233
තිලොවට වැඩ ක රුය
මරණෙත් දිනු අබි රුය
එවිටත් මුනුබු රුය
වැන්දමෝ නම් ඉතා තිස රුය

---

229 ඉක්බිතිව, නැවතත්; කැත්කුල, ක්‍ෂත්‍රියවංශයෙහි වූයේ; මෙලෙසින්, මෙයාකාරයෙන්; සිතත්, චින්තනය කෙරෙත්; (කෙසේවූ සිහිවිල්ලෙක්දයත්) ආකල, (උත්වනත්සේ) වැඩමුකල්හි; නො වැදිකල, නොවැන්දේනම්; නපුරුද, දූෂ්‍යයෙක්වේද්ද; (නපුරෙක්) මොහු මේ ඥාතීන්වහන්සේ; බාලකල, (වයසින්) මඳකල්හි; කෙසේ, කවර කාරයකින්; වදිමුද, නමස්කාර කරමුද.

230 රජසැපත, රාජසම්පත්තියෙහි; ආලය නොනොකාව, සෑම් ණාවක් නොකොට; සීලයරකිතා, සිල් රක්‍ෂාකරන්නේවී නමුත්; මෙතෙම, මේ බුදුරජතෙමේ; සඟ, (අපේ) කොලුවන්වඩා; බාලය, ළදරු වෙයි; ඉතුන්බාලය, (අප) කොලුවන් වඩා බාලබැවින්; කෙසේ උදිමුද, කොයිආකාරයකින් වන්දනා කරමුද.

231 කිසිඋණය, කිසිමඅඩුවක්; නැතත්, නැත්තේවී නමුත්; මොහු, මේ ඥාතීන්වහන්සේ; නෑකමින්, ඥාතිසම්බන්ධයෙන්; බැනය, භාගිනෙය්‍යයෙක්; එයින්,එසේහෙයින්; අපමාතය, අවමානයෙක්ම වෙයි; මාතයනොවී; මාතනුපදවා; කෙසේ වදිමුද, කවර කාරයකින් නමස්කාර කරන්නමෝද.

232 නෑකමින්, ඥාතිසම්බන්ධයෙන්; සුහුරුය, මස්සිනාවෙයි; බාලේපටන්, ළදරුකාලයෙහිසිට; මිතුරුය, මිත්‍රවෙයි එසේදනමුත්; බුදුවුයෙන්, බුඩත්වයට පැමිණිහෙයින්; ගුරුය. ආචාර්‍යයදවෙයි) එසෙවුවත්, ඒ කෙසේවූයේ නමුත්; වැදුම්, වැදීමනම්; අගරුය, ගරුනොවේවය.

233 තිලොව, තුන්ලොකයටම; වැඩකරුය, වෘඩ්‍යාභිකාරීය; මරණෙත්, මරණෙනාව; දිනු, ජයග්‍රහණය කෙළෙත්; අබිරුය, අභීතසිලීය; එවිටත්, ඒ කෙසේවූයේ නමුත්; මුනුබුරුය, නප්තෘය; වැන්දමෝනම්, නමස්කාරකළමෝනම්; ඉතාතිසරුය, වැඩියක්ම නිඳුමැයි.

234 මෙලෙසින් ඔහු සි — තා
බාල කුමරුන් අම — තා
තෙපි වඳුව සුග — තා
ගොසින් සිටු අපි මදක් ඉව — තා

| 235 | | 237 | |
|---|---|---|---|
| තොපට පිරිපස ඉ | ද | අහසට වැඩ සුග | ත් |
| බණ අසමු ඔහු නොම වැ | ද | යමා පෙළහර දක්ව | ත් |
| කියා ගොස් එම ලෙ | ද | සුදොවුන් රජුගෙ සි | ත් |
| *සියල් කැත්කුල රජුන් උත්ස | ද | මහත් සතුටින් වෙමින් කුල්ම | ත් |

| 236 | | 238 | |
|---|---|---|---|
| බලා උන් අදහ | ස† | හිමි නුඹෙ පාතඹ | ර |
| දූත තතුලෙසින් එවිග | ස | කාලදේවල තව ස | ර |
| මත් බිද එරජ රැ | ස | සිරසෙහි පිහිටි ව | ර |
| වන්දම්යය සිතින් නොවල | ස | පළමුවෙන් වැන්දෙමි අදරක | ර |

---

234 ඔහු, එශාක්‍යරජහු; මෙලෙසින්, මෙයාකාරයෙන්; සිතා, චින්තනයකොට; බාල කුමරුන්, ළදරු කුමාරවරුන්; අමතා, ආමන්ත්‍රණයකොට; තෙපි, යුෂ්මත්හුතුමු; සුගතා, සුගතයන්වහන්සේ; වඳුව, නමස්කාරකරව්; අපි, අස්මත්හු; මදක්ඉවතා, මදක්දුරට; ගොසින්, ගමනයකොට; සිටු, සිටිමුයි (ක්‍රියා)

235 තොපට, යුෂ්මතුන්ලාගේ; පිරිපස, පෘෂ්ටිපාර්ශ්වයෙහි; ඉඳ, නිසීදනයකොට; ඔහු, එසුගතයන්වහන්සේත්; නොමවැඳ, නමස්කාරත්නොකොට, බණඅසමු, ධර්මශ්‍රවණයකරමුයි; කියාගොස්, කථනයකොට ගොසින්ලා; එමලෙද, එයාකාරයෙන්ම; සියල් කැත්කුල රජුන්, සකල ක්ෂත්‍රිය රාජයන්; උත්සද, උත්කල්හි.

236 ඔවුන් අදහස, ඔවුන්ගේ අධ්‍යාශය; බලා, සර්වඥතාඥානයෙන්දැක; එවිගස, එඇසිල්ලෙහිම; තතුලෙසින්, තත්වාකාරයෙන්ම; (ඇතිසැටියේම) දූත, අවබෝධකොට; එරජරැස, ඒරාජසමූහයාගේ; මත්, මානය; බිඳ, භින්නකොටලා; නොවලස, වහාම; වන්දවම්යන සිතින්, නමස්කාර කරවම්යන චිත්තයෙන්.

237 සුගත්, තථාගතයන්වහන්සේ; අහසට, ආකාශයට; වැඩ, වැඩවුවා; යමාපෙළහර, යමකමහා ප්‍රාතිහාර්යය; දක්වත්, දක්වාලනකල්හි; සුදොවුන්රජුගේ, සුද්ධෝදනරාජයාගේ; සිත්, චිත්තය; මහත් සතුටින්, මහත්වූ ප්‍රීතියෙන්; කුල්මත්වෙමින්, කුල්මත්ව.

238 හිමි, ස්වාමිනි; නුඹෙ, නුඹවහන්සේගේ; පාතඹර, පාදපද්මය; කාලදෙවලතවසර, කාලදෙවලනාම්තාපසයාගේ; සිරසෙහි, මස්තකයෙහි; පිහිටිවර, ප්‍රතිෂ්ඨිතකල්හි; පළමුවෙන්, ප්‍රථමයෙන්ම; අදරකර, ආදරකොට; වැන්දෙමි, නමස්කාරකෙළෙමි.

---

* සියල්සකකුලරජුන් උත්සද, පොත්.

† බලාඔවුනදහස, පොත්.

239 චප් මඟුලට එව ර
*ගියසඳෙහි කල පෙරහ ර
දුට සිත් පහන් ක ර
මෙසිරිපා වැන්දෙමි දෙවෙනිව ර

240

යමා මහ පෙළහ ර
දුටුයෙමි අද නුදුටු පෙ ර
බැතිසිතිනි පෙම්බ ර
මෙසිරිපා වඳිමි තුන්වෙනි ව ර

241

පවසා එතර ව ර
සිරිපා නැමද සිටි ව ර
දඩිමත් කැත්නි ක ර
†සිටිතිවැද දළසුත් සපුත්යු ර

242

නුබින්බැස මුනි ව ර
පැනවූ අස්න උන් ව ර
කැත්කුල නර ප ව ර
උන්නු එක්සිත්වෙමින් එම ව ර

243

අසිරිමත් පෙ ත් නා
පොකුරු වැසි වස්ව ත් නා
මුනිඳුගෙප ස ත් නා
මහිම උතුනාව කිවුලග ත් නා

---

239 එවර, ඒකාලයෙහි; චප්මඟුලට, චප්පමංගලයට; ගියසඳෙහි, ගමනයකලකල්හි; කලපෙරහර, කරණලද ප්‍රාතිහාර්‍ය්‍ය; දුට, දර්ශනයකොට; සිත්, චිත්තයත්; පහන්කර, ප්‍රසන්නකොට; දෙවෙනිවර, ද්විතීයඅවස්ථාවෙහි; මෙසිරිපා, මේ ශ්‍රීපාදයත්; වැන්දෙමි, නමස්කාරකෙලෙමි.

240 පෙර, පූර්වකාලයෙහි; නුදුටු, දර්ශනයනොකලාවූ; යමාමහපෙළහර, යමකමහාප්‍රාතිහාර්‍ය්‍ය; අද, අද්දිනයෙහි; දුටුයෙමි, දර්ශනයකෙළෙමියි; පෙම්බර, ප්‍රේමභරිතවූ; බැතිසිතිනි, භක්තිචිත්තයෙන් යුක්තව; මෙසිරිපා, මේශ්‍රීපාදයත්; තුන්වෙනිවර, තෘතීයවාරයෙහිත්; වඳිමි, නමස්කාරකරමි.

241 එතරවර, ඒතෙරෙපතිමයා; පවසා, ප්‍රකාශකොට; සිරිපා, ශ්‍රීපාදයුගලය; නැමද, නමස්කාරකොට; සිටිවර, සිටියකල්හි; දඩිමත්, දෘඪවූමානයෙන් යුක්තවූ; කැත්නිකර, ක්ෂත්‍රියසමූහයා; දලසුත්, ජිනනවුදංෂ්ට්‍රාඇති; සපුත්යුරා, සපිනත්මෙත්; සිටිති, සිටියෝය

242 මුනිවර, මුනිඋතුමා; නුබින්, ආකාශයෙන්; බැස, බැසලා; පැනවූඅස්න, ප්‍රඥප්තඅස්නයෙහි; උන්වර, වැඩඋන්කල්හි; කැත් කුල නරපවර, ක්ෂත්‍රියවංශයෙහිවූ රජහු; එමවර, එඇසිල්ලෙහි; එක්සිත්වෙමින්, එක්සිත්ව; උන්නු, උන්නෝය.

243 අසිරිමත්, ඓශ්වර්‍ය්‍යවත්භාවය; පෙත්නා, දර්ශනයකරවා; පොකුරුවැසි, පුෂ්කරවර්ෂාවන් (මල්වැසි) වස්වන්නා, වර්ෂාකරවත්නාවූ; මුනිඳුගෙ, මුනීන්ද්‍රයාණන්ගේ; පසත්නා, ප්‍රසන්නවූ; මහිම, මහත්භාවය; උන්උන්ට, ඔවුනොවුන්ට; ලගත්වා, සිත්ගිකාවදිනසේකොට; කිවූ, කථනයකළෝය

---

* යි. පොත්. † සිටිනයාවැද දළසුත් සපුත්යුර.

244" අසමින් එතර සී
දුන් මතු නොවෙයි මෙවැ සී
බවයෙන් සිටි වැ සී
එයින් නොදුනොයි නොපව එක සී*

245
කියමින් මහඟු සී
සකනිකරකර සතො සී
වෙසතුරුද දෙ සී
අසා සතොසින් ගියෝ නොල සී

246
සුදෙවුන් නිරිඳු ව ත්
නැත අන් මැති කෙනෙක් ව ත්
නුවර වැසියෙක් ව ත්
මුනිඳු පවරගිය කෙනෙක් නැ ත්

247
*නැයන් බෝ ගම ට
ගියා වැනියසි උව ම ට
කියන බස පෙර සි ට
†සැබෑකෙළෙ ඔහු එද මුනිඳු ට

248
පනද උදුස න
×පත්හා සිවුරු දරමි න
වැඩි නුවරට වදි න
වාසලේ එලිපතේසිටගෙ න

244 එතරසී, ඒනරෙරුතනමයා; අසමින්, ඒකථාව ශ්‍රවනයකර මින්; මෙවැසි, මේපොකුරුවැසි වශීකෙළේ; දුන් මතුනොවෙයි, දුන් පමණක් නොවෙයි; බවයෙන් වැසිසිටි, සංසාරයෙන් ජාදිතව සිටියේ; එයින්, එසේහෙයින්; නොපව, ශුෂ්වතුන්ලාට; එකසී, එකහෙලාම; නොදුනොයි, අවබොධනොවෙයි.

245 මහඟුසී, මහර්ෂිවූ තථාගතයන්වහන්සේ; කියමින්, වදර මින්; සකනිකර, සාක්‍යජනසමූහයා; සතොසීකර, සංතොෂකොට; වෙසතුරුද, වෙස්සනතරජාතකය; දෙසී, දෙශනාකළසේක; අසා, (ඒජාතකය) ශ්‍රවනයකොට; නොලසී, වහා; සතොසින්, සංතොෂ යෙන්; ගියෝ, ගමනයකළෝ.

246 සුදෙවුන් නිරිඳුවත්, සුඬොදන නරෙන්ද්‍රයාවත්; නැත, නැත්තේනම්; අන්, අන්‍යවූ; මැතිකෙනෙක්වත්, මන්ත්‍රිකෙනෙක් වත්; නුවරවැසියෙක්වත්, නාගරිකයෙක්වද්දුසියස (මෙතෙක්දෙනා අතුරෙන්) මුනිඳු, මුනීන්ද්‍රයන්වහන්සේට; පවරගිය කෙනෙක්, (පසුදිනසඳහා) නිමන්ත්‍රණයකොට ගිය කෙනෙක්; නැත්, නැත්තේය; (නොවීය)

247 පෙරසිට, පෙරපටන්; නැයන්බෝ, බොහෝ ඥාතීන් ඇත්තාවූ; ගමට, ග්‍රාමයකට; ගියාවැනියසි, ගියාසමානයසි; උවමට, උපමාපිණිස; කියනබස, කියන්නාවූවචනය; එද, ඒදිනයෙහි; ඔහු, ඒශක්‍රපදරුවෝ; මුනිඳුට, මුනීන්ද්‍රයන්ට; සැබෑකෙළෙ, සත්‍ය කෙළේය.

248 පනද, දෙවෙනි දිනයෙහි; උදුසන, ප්‍රාතඃකාලයෙහි; පත්හා, පාත්‍රයහා; සිවුරු, චීවර; දරමින, ධාරණයකොටගෙණ; වැඩ, වැඩමවා; නුවරට, නගරයට; වදින, ප්‍රවෙශවන්නාවූ; වාසලේ, වාසල්හිවූ; එලිපතේ, දෙහලියෙහි; සිටගෙණ, වැඩසිටලා.

*බොහෝ නැයන් ඇති ගමකට යමෙක් ගියේයම් ඒඒතැනින් කෑම ලැබෙන්නැතැයි සැළකිමෙන් බඩසයින් යන්නාවූබවක් මින් උගන්වයි.

*එකිසීපොත්. එකිවෙක්. †සැබෑකෙළෙඔහු එමුනිසඳහට පොත්. ×පත්පා, පත්මා, පොත්.

249 පෙර මුනිඳුන් නිසැ ක
කුලනුවරට පැමිණ බි ක
සපදන් දුහග රැ ක
සිඟුබව දිවසින් බලා දූ ක

| 250 | | 251 | |
|---|---|---|---|
| †මාවිසිනුත් මෙදි | න | දෙමහල් තුන්මහ | ල් |
| ගෙපිළිවෙළ නොමහරිමි | න | පාසාදවල සුවිපු | ල්‡ |
| පිඬු සිඟමින් යෙහෙ | න | හැර කවුලු දොරව | ල් |
| සමඟසඟ එනුවරට වත්නැ | න | සිටිති වඩිමින් බලාදැඹු | ල්× |

252 රාහුල මවු එස ද
එපවත් අසා විලිවැ ද
මේනුවර පෙර සො ඳ
ඉසුරැ විඳිමින් වැජඹි හැමස ද

---

249 පෙර, පූර්වකාලයෙහිවූ; මුනිඳුන්, මුනීන්ද්‍රයන්; නිසැක, සැකනැතිව; කුලනුවරට, කුලනගරයට; පැමිණ, ප්‍රාප්තව; බික, භික්ෂාවසඳහා; සපදන්දුහග, සපදාන ධූතාංගය; රැක, රක්‍ෂාකොට; සිඟුබව, භික්ෂාචිතාවයෙහි යෙදුනබව; දිවසින්, දිව්‍යචක්ෂුසින්; බලා, අවලෝකණයකොට; දූක, දර්ශනයකොට;

250 මෙදින, මේදිනයෙහි; මාවිසිනුත්, මවිසින්උවත්; ගෙපිළිවෙළ, ගෘහපටිපාටිය; නොමහරිමින, අත්නොහැර; යෙහෙන, යහපත්ව; පිඬුසිඟමින්, භික්ෂාටනයෙහි හැසිරෙමින්; සඟසමඟ, සංඝයාවහන්සේ සමග; එනුවරට, ඒනගරයට; වත්නැන, වැඩම්වූ කල්හි;

251 සුවිපුල්, අතිශයින් මහත්වූ; දෙමහල්, විභූමිකවූද; තුන් මහල්, ත්‍රිභූමිකවූද; පාසාදවල, ප්‍රාසාදයන්හි; කවුළුදොරවල්, කවුළු වාරයන්; හැර, විවෘතකොට; වඩිමින්, වැඩම්වමින් සිටින්නාවූ; දැඹුල්, දශබලධාරීන්වහන්සේ; බලා, අවලෝකනයකොට; සිටිති, සිටිත්ය;

252 එසඳ, එකල්හි; රාහුලමවු, රාහුලමාතෘතොමෝ; (යසෝධරා දේවිය) එපවත්අසා, ඒප්‍රවෘත්තිය ශ්‍රවනයකොට; විලිවැද, ලජ්ජාවට පැමිණ; පෙර, පූර්වකාලයෙහි; සොඳ, සුන්දරවූ; මේනුවර, මේනගරයෙහි; හැමසඳ, සියලුකල්හි; ඉසුරුවිඳිමින්, ඓශ්වර්‍ය්‍ය විඳිනාකෙරෙමින්; වැජඹි, විරාජමානවූ මෙතුමා)

---

† මාවිසිනුත් මෙවන පොත්; ‡ පාසාදවලසුවිසල්, සිටිති බලමින්වඩිනදැඹුල් පොත්; × හැටිබැලුකල කවුළුසිදුරෙණ පොත්;

253 කසවත් පෙරවගෙ	ණ*
ඉසමුඬුවද්දූත් පා ගෙ	ණ
මෙනුවර වැද සිඟ	ණ
හැටි හොබිදුයි බැළු කවුළුවෙ	ණ

254
සවණක් රැසින් පු	ර
එකළු කෙරමින් මුනිව	ර
වඩිනාවිලස් දූ	ර
දූක මනරසි නමින් මනග	ර

255
අවගයකින් පව	ර
රුසිරුවණ පුවත	ර
රාහුලමවු එව	ර
රජුට කිව් සිගනබව එනුව	ර

256
රජු කලකිරි යි	තිත්
†වාවං සළුව දූ	තිත්
යුහුවම ගොස් තැ	තිත්
නොසිහගිමි තිත්දය නිය	තිත්

257
කිම මෙවිතර හග	ව
දත්දෙත්ව නොහැකිද ම	ව
අපරජ පරපුර	ව
‡මෙබඳු තිත්දකරණු කුමක	ව

---

253 කසවත්, කාෂායවස්ත්‍රයන්; පෙරවගෙණ, පාරුපණය කොටගෙණ; දූත්, මේකාලයෙහි; ඉසමුඬුව, මුඬුකරණලදහිසඇතිව; පාගෙණ, පාත්‍රයක් අතින්ගෙණ; මෙනුවරවැද, මේනගරයටවැදී; සිගන, සිගන්නාවූ; හැටි, ආකාරය; හොබිදූයි, හොභමානදූයි; කවුළුවෙන, කවුළුවෙන්; බැලූ, අවලොකනයකළා.

254 මුනිවර, මුනිඋතුමා; සවණක්රැසින්,(නීලපීතාදී) ෂඩ්වර්ණ රශ්මියෙන්; පුර, නගරය; එකළුකෙරෙමින්, ඒකාලොක කෙරෙමින්; වඩිනා, වැඩමවන්නාවූ; විලස්, විලාශය; දූර, දූරුයෙහිදීම; දූකම, දශීනයකොටම; නරසිනමින්, නරසීහගාථානාමයෙන්; මනගර, සිත්පැහැරගත්තාසුලුවූ;

255 පවර, ප්‍රවරවූ (උතුම්වූ) අවගයකින්, ගාථාඅටකින්; පුවතර, ප්‍රසිඬවූ; රුසිරු, රූපශ්‍රීයාව; වණ, වර්ණනාකොට; එවර, එකල්හි; රාහුලමවූ, රාහුලමාතාව; එනුවර, එනගරයෙහි; සිගනබව, භික්ෂාටනයකරණබව; රජුට, රජහට; කිවූ, කථනයකළා.

256 රජු, (සුද්ධොදන) මහාරජයා; කලකිරිසිතින්, කලකිරුණාවූ චිත්තයෙන්යුක්තව; දූතින්, උභයහස්තයෙන්; සළුව, සාටකය; වාවා, දවවමින්, යුහුවම, ඉක්මන්වම; තැතින්, උත්‍රාසභයෙන්; ගොස්, ගමනයකොට; හිමි, ස්වාමීනි; නොසිහ, භික්ෂාටනයෙහි නොහැසිරෙව; නියතින්, නියතයෙන්ම; තින්දය, නින්දාවක්මය;

257 කිම, කිමෙක්ද; මෙවිතරහගව, මෙපමණක්හංසයාට; දත්දෙත්ව, භික්ෂාදානයට; මට, මාහට; නොහැකිද, හැක්නොවේද; අපරජපරපුරට, අපගේරාජපරම්පරාවට, මෙබඳු, මෙආකාරවූ; නින්ද කරනු, නින්දාකිරීම; කුමකට, කුමක්නිසාදූයි අ. සුවෙ.)

---

* දවවාසළුව. පොත්; † මෙඔබනිත්දකරනුකුමකට; පොත්.

258 එබසව මුනිඳු ස ද
අප පරපුර සිරිති ර ද
තොප පරපුර මුනි ද
මහාසම්මත පරපුරය වෙ ද

259
පටන් දිවකුරු මු නි
අවසන් කොට කසුප් මු නි
පරපුරය මේ මු නි
එමය අප පරපුරත් නිරිඳු නි

260
මෙකී හැම මුනි ව ර
පිඹුසිගු මෙන් මදව සැ ර
ලෝවැඩකොට නිතො ර
පැමිණ සැපවිඳියහ නිවන්පු ර

261 එපුර වේ මැද සි ව*
ගයකින් එනරනිඳු හ ව
දෙසන බණ එක වි ව
අසා ඔහු පැමිණ මගපලය ව

---

258 එබසව, ඒවචනයට; මුනිඳුසඳ, මුනීන්ද්‍රචන්ද්‍රයා; රද, රජය; අපපරපුර, අපගේපරම්පරායෙහි; සිරිති, (මේ) චාරිත්‍රයවෙයි; මුනිඳ, මුනීන්ද්‍රයන්වහන්ස; තොපපරපුර, ඔබවහන්සේගේ පරම්පරාවනම්; මහාසම්මත පරපුරයවෙද, මහාසම්මත පරම්පරාව නොවේද;

259 දිවකුරුමුනිපටන්, දීපඞ්කර සර්වඥයන්වහන්සේ ප්‍රථම කොට; කසුප්මුනිඅවසන්කොට, කාශ්‍යපසර්වඥයන්වහන්සේ පශ්චිම කොට; මේමුනිපරපුරය, මේසර්වඥපරම්පරාවවෙයි; නිරිඳුනි, නරේන්ද්‍රයානෙනි; අපපරපුරත්, අපගේපරම්පරාවත්; එමය, ඒ බුඩපරම්පරාවමය.

260 මෙකී, මේකියනලද්දාවූ; හැමමුනිවර, සකලබුද්ධවරයෝම; පිඹුසිගුමෙන්ම, භික්ෂාටනයෙන්ම; දවසැර, දිවසාතික්‍රමයකොට; නිතොර, නිරන්තරව; ලෝවැඩකොට, ලොකාභිවෘද්ධියසඳහා; නිවන්පුරපැමිණ, නිර්වාණපුරයටවැඩමවා; සැපවිඳියහ, නිවන්සුවවිඳිනය කළෝය.

261 එපුර, එනගරයෙහිවූ; වේමැද, වීථිමධ්‍යයෙහි; සිට, වැඩ සිටගෙණ; ගයකින්, ගාථාවකින්; එනරනිඳුහට, ඒනරේන්ද්‍රයාහට; එකවිට, එකැසිල්ලෙහි; බණදෙසන, ධර්මදෙශනාකරණකල්හි; අසා, (ඒධර්මය) ශ්‍රවනයකොට; ඔහු, ඒසුඩොදනරාජයා; මගපලයට, මාර්ගඵලයන්ට; පැමිණ, ප්‍රාප්තව.

---

* කියාවේ මැදසිට පොත්.

262 පවරා මුනිඳු හ ව
කැඳවා ගොසින් රජගෙ ව
සඟනහා එවී ව
වැළඳවී රස බොජුන් නිසිකො ව

263
ඇතුලු පුරයෙහි සි ව
අඟනෝ ඇවිත් මුනිඳු ව
වැඳසිටිති එකවි ව
රහල්මවු නාවාය එනන ව

264
පිරිවර ලද එවී ව
මුනිඳු වඳිනට යනුකො ව
කීසඳ එබිසව ව
කුමනබස් පවසව්ද තෙපි ම ව

265 වැඩිතෙක් පටන් සි ව
මගෙ ගුණදහම් මෙතොප ව
නොදූතෙද ඇති රග ව
මෙබඳුගුණ නොසිතේද මුනිඳු ව

---

262 මුනිඳුහට, මුනීන්ද්‍රයාහට; පවරා, නිමන්ත්‍රණයකොට; රජගෙට, රාජගෘහයට; කැඳවා ගොසින්, වැඩමවාගෙණගොස්; එවිට, එකල්හි; සඟනහා, සංඝසමූහයා සහිතවූ බුදුරජුන්; නිසිකොට, යොග්‍යකොටලා; රසබොජුන්, රසභොජනයන්; වැළඳවී, වැළඳවූයේය.

263 ඇතුලුපුරයෙහි සිට, අන්තඃපුරයෙහි සිටියාවූ; අඟනෝ, අංගණාවෝ; ඇවිත්, ආගමනයකොටලා; මුනිඳුට, මුනීන්ද්‍රයන්ට; වැඳසිටිති, නමස්කාරකොට සිටියෝවූනමුත්; එතනට, ඒස්ථානයට; රහල්මවු, රාහුල මාතාතොමෝ; නාවාය, නොපැමිණියා.

264 එවිට, එකල්හි; පිරිවරලද, පරිවාරසහිතවූ; මුනිඳු, මුනීන්ද්‍රයන්: වඳිනට, වඳිනුපිණිස; යනුකොට, යනුසඳහා; එබිසවට, ඒ මහේසිකාවට; කීසඳ, කීකල්හි: තෙපි, තීලා; කුමනබස්, කවර වචනයන්; පවසව්ද, ප්‍රකාශකරව්ද;

265 වැඩිතෙක් පටන් සිට, (උන්වහන්සේ) වැඩමවූතැන් පටන්; මගෙගුණදහම්, මාගේ ගුණධර්මයන්; මෙතොපට, මේතුඹලාට; ඇතිරගට, විද්‍යමානආකාරයෙන්; නොදූතෙද, අවබොධනොවව්ද; මෙබඳුගුණ (මාගේ) මෙයාකාර ගුණයන්; මුනිඳුට, මුනීන්ද්‍රයන්ට; නොසිතේද, සිහිනොවනසේක්ද;

266 ලොවට කරුණා කොට, ට
බුදුවූකල නියම කො ට
එබඳු කරුණා ම. ට
නොකොට ඉඳිනෙයි සිතෙද මෙතොප ට

267

ඉන් මුනිඳුම මෙය ට
වඩිනතුරු කරුණාකො ට
කලක් ඉවසුම ට
බැරිද ඉවසන්ට මඳකලක ට

268

වැඩිකලම මෙතන ට
වඳිනෙමි සිත සැමැත්ත ට
කියමින් නියමකො ට
රහල්මවු උන්සඳෙහි මෙලෙස ට

269

නැතත් කරුණා ම ට
පියසුත රහල් කුමරු ට
නමුත් කරුණාකො ට
වඩිනු නියතයි සිතෙයි මසිත ට

270

මුනිඳු සඳ එම වි ට
පාදදෙමින් නිරිඳු ට
රිවිසඳ කර දෙපි ට
ගමන්ගත් සුනෙරගිරි විලස ට

---

266 ලොවට, ලෝකයාහට; කරුණාකොට, කුළුණුඋපදවා; නියමකොට, නිශ්චයකොටලා; බුදුවූකල, බුද්ධත්වයට පැමිණිකල්හී; එබඳු, තාදෘශවූ; කරුණා, කරුණාව; මට, මාහට; නොකොට, නොකර; ඉඳිනෙයි, ඉඳීයයි; මෙතොපට, මේතුඹලාට; සිතෙද, චින්තනයේද;

267 ඉන්, එසේහෙයින්; මුනිඳුම, මුනීන්ද්‍රයාම; මෙයට, (මාවසන) මේ ස්ථානයට; කරුණාකොට, කුළුණු උපදවා; වඩිනතුරු, වැඩමවනතෙක්; කලක්, කාලයක් මුළුල්ලෙහි; ඉවසූ, ඉවසුවාවූ; මට, මාහට; මඳකලකට, මන්දකාලයකට; ඉවසන්ට බැරිද, ඉවසාගන්ට බැරිවේද;

268 මෙතනට, මේස්ථානයට; වැඩිකලම, වැඩමවූකල්හිම; සිත සැමැත්තට, සිතෙහි කැමතිවූ පරිදි; වඳිනෙමි, නමස්කාර කරන්නෙමියි; කියමින්, කථනයකොටලා; නියමකොට, නිශ්චය කොට; මෙලෙසට, මෙයාකාරයෙන්; රහල්මවු, රාහුලමාතාව(බිම්බා මහේසිකාව) උන්සඳෙහි, උන්කල්හි;

269 මට, මාහට; කරුණානැතත්, කරුණාවක් නැත්තේ නමුත්; පියසුත, ප්‍රියපුත්‍රවූ; රහල්කුමරුට නමුත්, රාහුල කුමාරයාහට නමුත්; කරුණාකොට, කුළුණුඋපදවා; වඩිනු, වැඩමවීම; නියතයි, නිශ්චයමයයි; මසිතට, මාගේචිත්තයට; සිතෙයි, චින්තනය වෙයි.

270 එමවිට, එඇසිල්ලෙහි; මුනිඳුසඳ, මුනිඳුතුමා; නිරිඳුට, නරෙන්ද්‍රයාහට; පාදදෙමින්, පාත්‍රාධාතුපදානයකොට; රිවිසඳ, සූර්ය්‍ය චන්ද්‍ර දෙදෙනා; දෙපිටකර, උභයපාර්ශ්වයෙහි කොටලා; ගමන්ගත්, ගමන්ගත්තාවූ; සුනෙරගිරිවිලසට, මහාමේරු පර්වතරාජයාමෙන්;

271 අග සව්වන් දෙදෙ න
පමණක්ම හැඳවා ගෙ න
රාහුල මවු වස න
සිරියගත්ගෙට එසඳ වැඩියෙ න

272
රජඳු බොහෝ කල
නොමඳ දුක් ඉවසූ බල්
එසින් අප දුටු කල
අඩා වැලපුම් බොහෝවේ බල

273
නවත්නාතුරු ව ම
නොනවතව තෙපි පළමු ම
පවසා අසම ස ම
මුනිඳු වැඩඋන් සඳෙහි එවිට ම

274 පිරිවර ලිය සම ග
කසාසළු හැඳ එකව ග
මුනිඳු සිරිපා යු ග
නොබා ගොස් වැඳනබා උතුම ග

---

271 අගසව්වන් දෙදෙන පමණක්ම, අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා දෙදෙනා පමණක්ම; හැඳවාගෙණ, අඩගසාගෙණ; රාහුල මවු වසන, යශෝධරාදෙවිය වසන්නාවූ; සිරියගත්ගෙට, ශ්‍රීයගත් ගබඩාවට; එසඳ, ඒකාලයෙහි; වැඩියෙන වැඩමවූයෙන්;

272 රජඳු, රාජධිනෘව; බොහෝකල, අනන්තකාලයක් මුලුල්ලෙහි; බල, බලවත්වූ; නොමඳ, අමන්දවූ; දුක්ඉවසූ, දුඃඛයන්ඉවසූවා; එසින්, එසේහෙයින්; අප, අෂ්මත්හු; දුටුකල, දර්ශනයකලකල්හි; බල, දෑඋවු; අඩාවැලපුම්, රෝදනවිලපනයන්; බොහෝවේ, බහුල වන්නේය.

273 තෙපි, යුෂ්මත්හු; නවත්නෑතුරුවම, වලක්නාතෙක්ම; පළමුව, ප්‍රථමයෙන්; නොනවතව, නොනවත්වව් කියා; පවසා, ප්‍රකාශකොටලා; අසමසම, (අසමවූ සම්මාසම්බුදුවරයන් වහන්සේලාට සමහෙයින්) අසමසම නම්වූ; මුනිඳු, මුනීන්ද්‍රයන් වහන්සේ; එවිටම, ඒ ඇසිල්ලෙහිම; වැඩඋන් සඳෙහි, නිසීදනයකර වදාළ කල්හි;

274 පිරිවර ලිය සමග, පරිවාර ස්ත්‍රීන්හා; එකවග, එකම වර්ගයෙහිවූ; කසාසළු, කෂායවර්ණසාටකයන්; හැඳ, අවඡාදනය කොට; මුනිඳු, මුනීන්ද්‍රයන්ගේ; සිරිපායුග, ශ්‍රීපාදයුග්මය; නොබා, අභිනව; ගොස්, ගමනයකොට; උතුමගනබා, උත්තමාංගය ස්ථාපනයකොට; වැඳ, නමස්කාරකොට.

275 සිරිපා සිඹ එල ද
වඳිනා වලස කෙලෙස ද
රාහුව බියෙන් න ද
සරණ සරණට වඳිනවැනි සඳ ද

276

වඳිනා ලද සොඳි න
සිරිපත්ල මුව තබමි න
රිවිදෙව් ගත් අති න
තඹර සරණට පුදනවැනි ර න

277

වැද සිරිපතුල් දෙ ක
හොත් ඇය සුනිල් යුගස ක
ගහරන් පෝරුවෙ ක
පුදන නිලුපුල්වැන්න දින මු ක

278

සුරත් පාතඹ රේ,
මුහුලස මිදී ඉසි . රේ
රන් මිරිවැඩි න රේ
සුනිල්පය්යක බහන අයු රේ

279

දගපිරි අතින් ගෙ න*
අඩමින් දුකින් නොමදි න
සත්හුන් පියවි යෙ න
පසෙක සිටිසඳ එළද බැතියෙ න

---

275 එළඳ, ඕකාන්තාව; සිරිපා, ශ්‍රීපාදයුග්මය; සිඹ, චුම්බනය කොට; වඳිනාවිලස, වඳින්නාවූ ආකාරය; කෙලෙසක, කවරාකාර දූයි කියත්හොත්; රාහුව, අසුරේන්ද්‍රයාහට; නද, දූඩිවූ; බියෙන්, භය කරණකොටගෙණ; සඳ, චන්ද්‍රයා; සරණ, පිහිටපිණිස; සරණ, චරණය; (පායුවල) වඳිනවැනි, වන්දනාකරන්නාක්මෙනි.

276 සිරිපත්ල, ශ්‍රීපාදතලයෙහි; සොඳිනා, මනාකොට; මුව තබමිණ, මුඛස්ථාපනයකොට; ලද, (ඕ) කාන්තාව; වඳිනා, නමස්කාරකලාවූ ආකාරය කෙසේදයත්; රිවිදෙව්, සූර්‍ය්‍යදිව්‍යරාජයා; අතිනගත්, හස්තයෙන්ග්‍රහණයකලාවූ; රණතඹර, ස්වර්ණතාමරසය; සරණට, (මුනිඳුහුමාගේ) චරණයට; පුදනවැනි, පූජාකරන්නාක් වැන්න.

277 සිරිපතුල්දෙක, ශ්‍රීපාදයුග්මය; වැද, නමස්කාරකොට; හොත්, සයනයකලාවූ; ඇය, ඇගේ; සුනිල්, අතිනීලවූ; යුගසක, අක්ෂියුග්මය; (කෙසේවීදයත්) ගහරන්පෝරුවෙක, ස්වර්ණමය ඵලකයෙක්හි; දිනමුක, දිවසම්බන්ධයෙහි; (උදෑසන) පුදන, පූජාකරණු ලබන්නාවූ; නිලුපුල්වැන්න, නීලොත්පලමෙන්වී; (නිල්මානිල්)

278 සුරත්, අතිරක්තවූ; පාතඹරේ, පාදතාමරසයෙහි; (රතු නෙළුම්මල) මුහුලස, කෙසකලාපය; මිදී, මුක්තව; ඉසිරේ, ඉසිරි පවත්නාකල්හි; නරේ, රශ්මිවත්වූ; රන්මිරිවැඩි, ස්වර්ණපාදුකාවන්; සුනිල්, අතිනීලවූ; පය්යක, පර්‍ය්‍යඞ්කයෙක්හි; බහනඅයුරේ, බහාලන්නාක් මෙනි.

279 පිරි, පූර්ණවූ; දග, ජඩභාවන්; අතින්, හස්තයෙන්; ගෙණ, ග්‍රහණයකොට; නොමදින, බොහෝවූ; දුකින්, දුඃඛයෙන්; අඩමින්, රෝදනයකරමින්; සත්හුන්, සංසිඳුනාවූ; පියවියෙන, ප්‍රකෘතියෙන් යුක්තව; එළද, ඕකාන්තාව; බැතියෙන, භක්තියෙන්; පසෙක, එක් පාර්ශ්වයෙක්හි; සිටිසඳ, සිටිකල්හි;

---

*මෙහි එළිවැටනිසා දන්තජ ආදේශවූබැව් සැලකියයුතු.

280 සුදොවුන් රජ එ — සඳ
මුනිසඳ මගෙ යෙහෙළි — සඳ
නුඹකස දරූ — සඳ
තොමොද කසවත්දරූ එම — සඳ

| 281 | | 282 | |
| --- | --- | --- | --- |
| හරිමින් විකල් බ | තා | උසසුන් මග අ | සුන් |
| එක්වේලේම වළඳ | තා | අසා හැරියෙයි යන | සුන් |
| යනු අසමින් සුග | තා | හැර තොමොද එ අ | සුන් |
| තොමොදවුඑලෙසඑක්වරෙ බ | තා | නිබඳ විසුවාවේද නිස | සුන්* |

283 මල් සුවඳ විලවු — තා
නොගත්තා බව අසමි — තා
තොමොද මල් සුවඳි — තා
තොරව විසුවාවේද ඇම දි — තා

280 එසඳ, එකල්හි; සුදොවුන්රජ, සුද්ධෝදනරාජයා; (මෙසේ කියයි) මුනිසඳ, මුනීන්ද්‍රවූ ඥාතියානෙනි; මගෙ යෙහෙළිසඳ, මාගේ යෙහිළිවූ උතුම කාන්තාව; නුඹ, ඔබවහන්සේ; කස, කෂාය වස්ත්‍රයන්; දරූසඳ, ධාරණයකළකල්හි; තොමොද, තොමෝත්; එමසඳ, එකල්හි; කසවත්, කෂායවස්ත්‍රයන්; දරූ, ධාරණයකළා.

281 විකල්බත, අකාලභොජනය; හරිමින්, වර්ජනයකරමින්; සුගත, සුගතයන්වහන්සේ; එක්වේලේම, එක්වේලක්ම† වළඳත යනු, වළඳත්ය කියන්නාවූ වචනය; අසමින්, ශ්‍රවණය කොට; තොමොද, තොමෝත්; එලෙස, එආකාරයෙන්ම; එක්වරෙබත්වූ, එකභක්තිකාවූවා.

282 උසසුන් මහඅසුන්, උච්චාසයන මහාසයනයන්; හැරියෙයියන අසුන්, දුරුකෙළේයයි කියන්නාවූ අස්න; අසා, ශ්‍රවණය කොට; තෝමොද, තොමෝත්; එඅසුන්, ඒ අසනයන්; හැර, දුරුකොට; නිබඳ, නිරන්තරව; නිසසුන්, නීචාසනයන්හිම; විසුවා වේද, වාසයකළාවේමය.

283 මල්සුවඳවිලවුන, (ඔබවහන්සේ, මාලාගන්ධවිලෙපනයන්; නොගත්තාබව, ප්‍රතිග්‍රහණය නොකරණබව; අසමිණ, ශ්‍රවණය කරමින්; තොමොද, තොමෝත්; මල්සුවඳින, මාලාගන්ධයන් ගෙන; ඇමදින, සියලුදවස්වලම; තොරව, වෙනවම; විසුවාවේද, වාසය කළාවේමය.

* එක්වේලෙ වැළඳීමනම්, උදයසිට ඉර මුදුනට එනතුරු දස වරක් වැළඳුවත් එක්වේලේ වැළඳීමයයි කියත්.

† හැරතොමෝපෙරසුන්. පොත්.

284 ඔබ මහණවූ ස ද
ඇසූ රජදරුවේ සෙ ද
මාහැඟි පඬුරු බැ ද
එවුසද නොගෙණ දුමුවාවෙ ද

285
ඔබකෙරෙ සෙනෙහ සිත්
වැත්දඹුදුකක් මෙලෙ සිත්
විත්දනොකම සිත්
මෙලෙසගුණඇද්දහිමි දිගැ සිත්

286
එපවත් අසා මු නි
මහිමද මෙදූත් නිරිඳු නි
තිරිසත් අත් බැවි නි
සිවත් නොපැතුවෙ වෙනිත් කෙනෙකු නි

287 නොපවීසිනි රකි නා
මිනිසත් බවෙහි සිටි නා
නුවණින් යුතු ම නා
මොවුන්ගැණනොපිවණනුනොම් නා

---

284 ඔබ, ඔබවහන්සේ; මහණවූසද, පැවිදිවූකල්හි; ඇසූ, (එපුවත) ඇසූවාවූ; රජදරුවේ, රජහුතමූ; සෙද, වහා; මාහැඟි, මහත්අගකීවූ; පඬුරු, ප්‍රාභෘතයන්; බැද, බඳිනායකොට; එවුසද, එවිකල්හි; නොගෙණ, පිළිනොගෙණ; දුමුවාවෙද, ඉවතලූවාවේද;

285 ඔබකෙරෙ, ඔබවහන්සේකෙරෙහි; සෙනෙහසිත්, සෙනහාධ්‍යාශයෙන්; මෙලෙසින්, මෙයාකාරයෙන්; වැත්දඹුදුකක්, සවාමීත්ගෙන්වෙන්ව විසීමෙන්වන දුඃඛයන්; නොකමසිත්, අකමැත්තේම; විත්ද, අනුභවකළා; හිමි, ස්වාමිනි; දිගැසින්, දීඝ්‍රාක්ෂකාවන්ගේ; මෙලෙස ගුණඇද්ද, මෙසේත් ගුණඇත්තේද.

286 මුනි, සර්වඥයන්වහන්සේ; එපවත්, ඒප්‍රවෘත්තිය; අසා, ශ්‍රවනයකොට; නිරිඳුනි, නරේන්ද්‍රයානෙනි; මෙදූත්, මේ වර්තමාන කාලයෙහිවූකාරණය; මහිමද, මහිමයෙක්ද; (පුදුමයක්ද) තිරිසත් අත්බැවිනි, තිරශ්චීනආත්මභාවයෙහි; සිවත්, සිටද; වෙනිත්කෙනෙකුනි, අන්‍යකෙනෙක්; නොපැතුවෙ, ප්‍රාර්ථනානොකළාය.

287 නොපවීසිනි, යුෂ්මතුන්විසින්; රකිනා, රක්ෂාකරන්නාවූ; මිනිසත්බැවෙහි, මනුෂ්‍යආත්මභාවයෙහි; සිටිනා, සිටින්නාවූ; මනා, යහපත්වූ; නුවණින්යුතු, ඥානයෙන් යුක්තවූ; නොපි, යුෂ්මතුන්ගේ; මොවුන්ගුණ, මැගේගුණයන්; වණනු, වර්ණනා කිරීම; නොම්නා, නොයෙදේ.

288 අසමින් නිරිඳු ස ද
තොදනෙයි අපට මුනිර ද
පහල කෙරෙමින් සෙ ද
වදලොත් යෙහෙකි එපවත් අ ද

289
පියනිරිඳුන් බ සිත්
යදුනාලදුව නොල සියේ
ඉකුත්වත් මෙලෙ සිත්
ගෙණැරදක්වාමුනිදුවෙසෙ සිත්

290
බරණැස් නුවර පෙ ර
බඹදත් රජෙක් පුවත ර
රජසිරි විඳින ව ර
පිරූ බෝසත් පෙරුම් මනහ ර

291
සඳකිඳුරු ජම්මෙ ක
ඉපිද හිමවත් පෙදෙස ක
සමඟ කිඳුරඟණ ක
වෙසේ ඔහු නිත්රිදි පව්වෙ ක

292
ග න රත් කුළුදිලිගිරි මුදුන තා
පි න මින් සිතසුරඟණනිතිපතා
දෙන කත්කලුගී නැටුමෙන් ඉතා
ම න සත්තොසවෙයිදුටුඑවනතා

---

288 නිරිඳුසඳ, නරෙන්‍ද්‍රචන්‍ද්‍රයා; අසමින්, (එය) ශ්‍රවනයකර මින්; මුනිරද, සර්වඥරජය; අපට, අපහට; නොදනෙයි, (එකාරණය) අවබොධනොවෙයි; සෙද, වහා; පහලකෙරෙමින්, ප්‍රකාශ කොට; එපවත්, ඒප්‍රවෘත්තිය; අද, අදදිනයෙහි; වදලොත්, පිළිලේ නම්; යෙහෙකි, යහපත්වෙයි.

289 පියනිරිඳුන්, පිතෘනරෙන්‍ද්‍රයාගේ; බසින්, වචනයෙන්; යදුනාලදුව, යාඥාකරණලදුව; නොලසින්, වහා; ඉකුත්වත්, අති ක්‍රාන්තවස්තුව; මෙලෙසින්, මෙයාකාරයෙන්; මුනිදු, මුනීන්ද්‍රයන් වහන්සේ; වෙසෙසින්, විශෙෂයෙන්; ගෙණැරදක්වා, ගෙණහැර දක්වාවදාලසේක.

290 පෙර, අතීතකාලයෙහි; බරණැස්නුවර, බාරාණසීනගර යෙහි; පුවතර, ප්‍රසිඬවූ; බඹදත්රජෙක්, බ්‍රහ්මදත්තනම්රාජයෙක්; රජසිරි, රාජශ්‍රීය; විඳිනවර, අනුභවකරණකල්හි; මනහර, මනොහරවූ; (සිත්පැහැරගත්තාවූ) පෙරුම්, පාරමිතාවන්; පිරූ, පූරණය කලාවූ; බෝසත්, මහාසත්වතෙම.

291 සඳකිඳුරුජම්මෙක, චන්ද්‍රකින්නරජාතියෙක්හි; හිමවත්පෙදෙසක, හිමාලයවනප්‍රදෙශයෙක්හි; ඉපිද,උත්පාදිතව; කිඳුරඟණක සමඟ, කින්නරාංගනාවක්හා; ඔහු, එබෝසත්තෙම; නිති, නිත්‍යයෙන්; රිදීපව්වෙක, රජතමයපර්වතයෙක්හි; වෙසේ, වාසයකෙරේ.

292 ගන, ඝනවූ; රත්කුළු, සවර්ණකූටයන්ගෙන්; දිලි, බබලන්නාවූ; ගිරිමුදුනතා, පර්වතමස්තකයන්හි; සිතපිණමින්, චිත්තපිණණයවෙමින්; සුරඟණ, දිව්‍යාංගණාවෝ; නිතිපතා, නිරන්තරයෙන්; දෙන, දනයකරන්නාවූ; කත්කලු, කණ්ණරසායනවූ; ගීනැටුමෙන්, ගීතිකාවෙන්හා නෘත්‍යයෙන්; ඉතා, වැඩියක්ම; එවනතා, එවන ප්‍රදෙශය; දුටු, දර්ශනයකලවුන්ගේ; මන, චිත්තය; සත්තොසවෙයි, සන්තුෂ්ටවන්නේමය.

293 හෙල-රත්සඳුන් අමුකපුරු   රුක්
කළ-ගුරු කොකුම්තුවරලවූ   රුක්
දුල-මුහුල නා සපු කුසුම   රුක්
දල-කලු එලුක්ඇති දිගු පු   රුක්

294

ගොත මින් තණඅඳිමින් ඉරඟු රු
සි ත නොදෙමින්පවකටඅවසරු
ව ත පිළිවෙත කරසිල් පුර පුරු
ඇ ත එවනෙහි ඉඳිනාතව ස රු

295

ව න-ගිරිහිසින්එන ගඟුලැ ලී
දෙ න-සැපපහස් මඳපව නැ ලී
තැ න-තැනකුසුම්රොන්ඇඳහැලී
ග න-කමලුපුල් සැදි වන වි ලී

290 ර ඟ-දෙ න කුලින්කුල නිල්ගෙ ලී
පැ න-ය න තුරින් තුරමුව වි ලි
න ද-දෙ න මලින් මල මිහිලො ලි
පොර-ඇ න තැනින්තැන ගවරැ ලි

---

293 හෙල, සුදුසඳුන්ය; රත්සඳුන්, රක්තචන්දනය; අමුකපුරු රුක්, අමු කර්පූරවෘක්ෂය; කළගුරු, කාළාගුරුය; (කලුඅගිල්) කොකුම්, කුංකුමය; තුවරල, තගරය; තුරුක්, තුරුක්කය; දුල, බබලන්නාවූ; මුහුල, මුහුමල්ය; නා, නාගවෘක්ෂය; සපු, චම්පකය; යන කුසුමරුක්, මලින්ගැවසීගත්තාවූ වෘක්ෂද; දල, මහත්වූ; කලු, කාලවර්ණවූද; එල, සෙවතවර්ණිවූ; දිගු, දීර්ඝවූ; පුරුක්ඇති, පර්වයන්ගෙන් යුක්තවූ; උක්, ඉක්ෂුවර්ගද; (ඇත්තේය)

294 තණ, තෘණයන්; ඉරඟුරු, හීරහීරකොට; ගොතමින්, ග්‍රන්ථනයකොට; අඳිමින්, අවඥාදනය කොටලා; සිත, චිත්තය පවකට, පාපයකට; අවසරා, අවකාශයක්; නොදෙමින්, දනය නොකොට; වතපිළිවෙත, විනතපිළිවෙතනයන් කරමින්; සිල්පුරපුරා, සීලපූරණය කොටකොට; එවනෙහි, එවනයෙහි; ඉඳිනා, වාසය කරන්නාවූ; තවසරා, තපෝවාරිහුද; ඇත, ඇත්තාහ.

295 වන, වනයෙහිවූ; ගිරිහිසින්, පර්වතශීර්ෂයෙන්; එන, ගලාබස්නාවූ; ගඟුලැලි, ගංගානිර්ඣරයන්ද; සැපපහස්දෙන, සුඛස්පර්ශ දනයකරන්නාවූ; මඳපවනැලී, මන්දමාරුතයද; (සිහින්හුළඟද) තැනතැන, ඒ ඒ තන්හි; කුසුම්රොන්, පුෂ්පරේණුයන්; ඇඳහැලී, ඇඳහැලූනාවූ; ගන, ඝනවූ; කමලුපුල්, කමලෝත්පලයන් ගෙන්; සැදි, සජ්ජිතවූ; වනවිලී, වනතඩාගයන්ද ඇත්තාහ.

296 කුලින්කුල, පර්වතයක්පාසා; රඟදෙන, නෘත්‍යදනයකරන් නාවූ; නිල්ගෙලී, නීලකණ්ඨයන්ද; (මොනරුන්ද) තුරින්තුර, වෘක්ෂයක්පාසා; පැනයන, පැනයන්නාවූ; විලිමුව, වලීමුඛයන්ද; (රිලවුන්ද) මලින්මල, පුෂ්පයක්පාසා; නදදෙන, නාදකරන්නාවූ; මිහිලොලි, මධුලොලයන්ද; (මීමැස්සන්ද) තැනින්තැන, ඒ ඒ තන්හි; පොරඇන, පොරඅනිමින් හැසිරෙන්නාවූ; ගවරැලි, ගවසමූහයා ගෙන්ද යුක්තවූහ.

297 සැ දි-ගොමුවලි ත් පිපිගිරි නි ලී*
රැ දි-පල වැ ලි ත් දිලිතුරු ම ලී
බැ දි-අස නි ලි ත් දිසි කස ම ලී
ඉ දි-මිදි දෙ ලි ත් එවනය දි ලී

298 | 299
--- | ---
දුරද-කිමිත් මිනිසුත් එතර ගා | වෙල, මිත් සිවුපාවුත්මහමෙනේ
කුර-අදිමිත් හඬමින් කරන ගා | තල, මිත් මඩිමිත් සෙදබුදිමි නේ
වන-මිහිවුත් දුටුවොත් එතරගා | මල, වුත් විලසිත්ගොත්තැනතැ
කොර-හුනුමෙත්වෙසියුගපාදගා | වෙල, මිත්යනුබැරිපිඹුරත්වනේ

300 මහ ස ත් උසකිව පවසත් තේ
යහ ප ත් අස්පොව්වෙකු වැත් තේ
බල ව ත් හැටි එකි දිවියත් තේ
දුටු වොත් එවිටම දිවියත් තේ

---

297 ගොමුවලිත්, ලැහැබ්වලින්; සැදි, සැරසුනාවූ; පිපි, පුෂ්පිතවූ; ගරිනිලී, ගිනෙනරිය පුෂ්පයන් ගෙන්ද; රැඳි, රඤ්ජමානවූ; පලවැලින්, † පලවැලයන් ගෙන්ද; දිලි, බබලන්නාවූ; තුරුමලී, පුෂ්පවෘක්ෂයන් ගෙන්ද; බැදිඅස, වනසමීපයෙහි; නිලිත්, නීලවර්ණයෙන්; දිසි, දෘශ්‍යමානවූ; කස්මලී, වැලිකසාපුෂ්පයන්ගෙන්ද; ඉඳි, ඛර්ජුරය; (ඉඳිය) මිදි, මුද්‍රිකය; දෙලින්, ලබුජයන මෙසින්ද; එවනය, ඒවනාන්තරය; දිලි, බැබලීය.

298 දුර, දුරයෙහිදීම; මිනිසුත් එතරගා. මනුෂ්‍යයන් එන ආකාරය; දකිමින්, දශීනයකොට; කරනගා, ග්‍රීවයඋනානනකොට; කුර, කුරයන්; අදිමින්, අදිමින්ද; හඬමින්, ශබ්දකරමින්ද; වන මිහිවූත්, වනමහිසයන්; (මීගොන්) එතරගා, ආගමනය කරණ ආකාරය; දුටුවොත්, දශීනයකෙළේනම්; යුගපාදගා, පාදජඞ්ඝායුග්මය; කොරහුනුමෙන්, කොරවූවාක්මෙන්; වෙසි, වන්නේමය.

299 මහමෙනේ, සිත්වූපරිද්දෙන්; සිවුපාවුන්,චතුෂ්පදිකයන්; වෙලමින්, වෙඨනයකෙරෙමින්; තලමින්, තාඩනයකෙරෙමින්ද; මඩිමින්, පොඩිකරමින්ද; සෙද, වහා; බුදිමින්, අනුභවකොට; ගොත්තැනතැනේ, සයකායකළකළනන්හ; මලවුත්විලසින්. මලාවුත්මෙන්; වෙලමින්, වෙඨනයකොටගෙණ සිටින්නාවූ; පිඹුරන්, අජගරසර්පයන්නිසා; වනෙ, (ඒ) වනයෙහි; යනුබැරි, ගමන්කරීමට නොහැක්කේය.

300 මහසත්, බොධිසත්වයන්ගේ; උස, උසප්‍රමාණය; කිමපවසන්නේ, කෙසේප්‍රකාශකෙරෙම්ද; යහපත්, මනාවූ; අස්පොව්වෙකු වැන්නේ, අශ්වපොතකයෙක්වැන්නේය; එකි, ඒවනයෙහි; දිවියන්නේ, දිපීන්ගේ; බලවත්හැටි, සහාහිප්‍රමාණය; දුටුවොත්, දශීනයකෙළේනම්; එවිටම, එඇසල්ලෙහිම; දිවියන්නේ, ජීවිතයෙන්තොරවන්නේය.

---

* වැලෙලසීපල. පලවැල. පදපෙරැලිසි.
† සැදිගොලුමලින්, සැදිගොලුවලින්. කියාත්පොත්.

301 තදි-නා හුඹස් බිද නොවී ලස්*
බුදි-නා අහස්මි ඉඳ ව ලස්
ඉදි-නා පොරෝගෙණ නිල් පල ස්
සෙදි-නා රැපැයිනාකින් වි ලස්

302 | 303
---|---
මි-රත් මැපි තවරා තොලුප තේ | ලිය-ලාතුරුවල් සෙවනැලිබ දේ
සා-රත් තටවත් සඳදෙරණ තේ | ලිය-ගීකියමින් සැතපි ඉ දේ
ඌ-රත් සැපිදුටුවොත්එවනතේ | ලිය-ඹිවිලිකෙලනා මන්න දේ
මෝ-රත්තටවෙයි බියවැදසි තේ | ලිය-කිඳුරෝ ඇත එවනෙහි සො දේ

304 මත්-ගජරලින්රල බලව තේ
දෙත්-දිගුදළින්දල නොනැව තේ
යුත්-මුව මුලින් මුල කෙළිම තේ
බොත්-දිය දෙලින්දෙල එවන තේ

---

301 තදිනා, දැඩිව; ලස්නොවී, ආලශ්‍යනොව; හුඹස්බිද, හුඹස්කඩා; අහස්මි, ආකාශයෙහිවුම්ධුන්; (ගස්උඩබෙනවලබැඳිම් අහස්මියයි කියත්) බුදිනා, අනුභවකරන්නාවූ; වලස්, අව්ජයෝ කෙසේවීදයත්; නිල්, නීලවණ්වූ; පලස්, කම්බලයණ්; පොරෝගෙණ ඉදිනා, පාරුපනයකොට ඉන්නාහු; සෙදිනා, දුටුඇසිල්ලෙහිම; නාකින්විලස්, මහල්ලන්ගේවිලාශය; ඇරපැයි, ගෙණහැර දක්වී.

302 තොලුපතේ, මුඛවාරයෙහි; මිරත්මැපි, අභ්‍රකසහිතවූ මෘතිකාවත්; තවරා, ආලෙපකොටගෙණ; දෙරණතේ, ධරණීතලය; (පොළොව) සාරත්තටවත්සඳ, සැරීමට පටන්ගත්තාවූ; එවනතේ, ඒවනප්‍රදෙශයෙහි; ඌරත්සැපි, ශූකරයන්ගේආකාරය, දුටුවොත්, දශීනයකෙළේනම්; සිතේ, චිත්තයෙහි; බියවැද, භයට පැමිණ; මෝරත්තටවෙයි, පරිපාකයට පැමිණෙයි.

303 ලියලා, දලුලෑමෙන්; බදේ, එකාබද්ධවූ; තුරුසෙවනැලිවල, වෘක්ෂච්ඡායාවන්හි; ලියගී, ලයාන්විතගීතිකාවන්; කියමින්, කථනයකරමින්; සැතපීඉදේ, සනතර්පිතවඉද; මනනදේ, මනොනන්දනයව; (සිත්අඹුව) ලියඹිවිලිකෙලනා, ලතාවුන්සිල්ලාවන්හි; ක්‍රීඩනයකරන්නාවූ; එවනෙහි, එඅරණ්‍යයෙහි; සොදේ, සුන්දරවූ; ලියකිඳුරෝ, ලතාකින්නරයෝ; ඇත, ඇත්තාහ.

304 බලවතේ, ශක්තිසම්පන්නවූ; මත්ගජ, මත්තහස්තිහු; රලින්රල, සමූහසමූහව; දිගු, දීඝීවූ; දළින්දළ, දංෂ්ට්‍රාවලින්; නොනැවතේ, නොවැලකීම; දෙත්, (ප්‍රහාර) දෙනයකරන්නාහ. කෙළිමතේයුත්, ක්‍රීඩාමතයෙන්යුක්තවූ; මුව, මෘගයෝතුමූ; මුලින්මුල, සමූහසමූහව; එවනතේ, එවනයෙහි; දෙලින්දෙල, දෙලක් පාසා ගොස්; දියබොත්, ජලපානයකෙරෙත්ය.

---

* තදිනා හුඹස් බිදනොවවලස්. තෑමවලය්. මෙසේද පොත්.

305 කළ-ඳෙරත්කුළුවල නොම දිනේ
සුරි-ඳෝ කෙළ ඇවිදිති හැම දිනේ
එහි-දේ වැද එවනය වොරු දිනේ
නෙත-දේ සිත ඉන් තිති පහ දිනේ

306
දඟ-ගසා ඉඳින නයි පොළඟු නුත්
සිත්-බයානකව මහ පිඹුර නුත්
තද-රොසාවගිති විසකර වලු ත්
දුට-බයානකව වෙව්ලයි ගත ත්

307
*සබ-රුත් වල්ගනිතැයි බිය ගෙනේ
සෙම-රුත් සැඟවුනු තැන් නොම පෙනේ
ගව-රුත් සිටිසැටිදුට ඒ ව නේ
කවු-රුත්වදසිතබියනොවදිනේ

308 දහ-සිත්වත් කීවත් අනත ගී
වෙසෙ-සිත් පැවසුම් බැරි නොවල ගී
විල-සිත් ගත් සිරිහඳුනු යන ගී
කෙලෙ-සිත් පවසම් සිරි එවනෙ ගී

---

305 නොමදිනේ, බොහෝවූ; කළඳෙරත්කුළුවල, කලධෞත සවර්ණමයපර්වතකූටයන්හි; (රත්රිදිපර්වතමුදුන්හි) හැමදිනේ, සියලු දවස්හි; සුරිඳෝ, දිව්‍යරාජයෝතුමූ; ඇවිදිති, සංචාරණයකෙරෙත්; (එකල්හි එහිදේ, එමආලෝකය; වැද, සපැමිණීමෙන්; එවනය, ඒ ආරණ්‍යය; වොරුදිනේ, විරාජමානවනකල්හි; ඉන්, එහෙයින්; නෙතදේ, නේත්‍රපමණක්නොවෙයි; සිත, චිත්තයත්; නිති, නිත්‍යයෙන්; පහදිනේ, ප්‍රසාදවත්වේය.

306 දඟගසාඉඳින, එක්ව ඇඹරී ඉන්නාවූ; නයිපොළඟුනුත්, නාගගෝනසයන්ද; සිත, චිත්තයෙහි; බයානකව, භයානකවූ; (බිය උපදවන්නාවූ) මහපිඹුරනුත්, මහාඅජගරයන්ද; තද, සම්බද්ධවූ; රොසාව, කෝපවූකල්හි; ගිතිවිස, චෘතියටබඳුවිෂ ඇත්තාවූ; කර වලුත්, එනම් සර්පයන්ද; දුට, දර්ශනයකළකල්හි; බයානකව, මහත් භයට පැමිණීමෙන්; ගතත්, ශරීරයත්; වෙව්ලයි, කම්පාවන්නේමය.

307 සබරුත්, වැද්දන්විසින්; වල්ගනිතැයි, වාලධිග්‍රහණය කරණුලබත්යයි; බියගෙණ, භයගෙණ; සෙමරුත්, චමරීහු; සැඟවුනුතැනේ, නිලීනවූස්ථානයත්; නොමපෙනේ, නොදක්නේය; එවනේ, ඒවනයෙහි; ගවරුත්, එනම්මෘගයන්; සිටිසැටි, උන් ආකාරය; දුට, දර්ශනකෙළේනම්; කවුරුත්, කවුරුන්ගේඋවත්; සිත, චිත්තයෙහි; බියනොවදිනේවද, භයනුපදවන්නේද; උපද නේයයනු භාවයි.

308 අනතගී, අනන්තනම්නාගරජයා; වත්දහසින්කීවත්, මුඛ දහක් (මවා) කියේවිනමුත්; වෙසෙසින්, විශේෂයෙන්; නොවලගී, නොසහවා; පැවසුම්බැරි, ප්‍රකාශකිරීමදුෂ්කරවෙයි; හඳුන්උයනගී, නන්දනෝද්‍යානයෙහි; සිරිගත්විලසින්, ශ්‍රීයා ග්‍රහණයකළාක්වැනිවූ; එවනෙහි, ඒ(සඳක්දුරන්වහසකරන්නාවූ) වනයෙහි; සිරි, ශෝභාව; කෙලෙසින්, කවරආකාරයකින්; පවසම්, ප්‍රකාශකරම්ද.

---

*මේකවිය ඉතා ආකූලවතිබුණෙන් අමාරුවෙන් සුධකරගතිමු.

309 එකල බරණැස් ර ද
ගෙන්නා මැතිවරන් සෙ ද
කියා දඩයන ලෙ ද
රජය පාවාදෙමින් එම් ස ද

| 310 | | 311 | |
|---|---|---|---|
| කලුදූපිලී ඇ | ද | මෙකී පසඳවායු | ද* |
| දුන් තදයකඩමුගුර | ද | ගනිමින් හිංවනට වැ | ද |
| තියුනු අඩයටිය | ද | මුවදඬෙහි ලොබ් බැ | ද |
| කඩුව සහ පාරුවලල්ල | ද | ඇවිද මුවහසර බලමින් සෙ | ද |

312 කලඑේ එපවි වැ සි
නොයෙක් සඳකිඳුරෝ වැ සි
සෑරමස අත් කි සි
තැනක නොගොසින් නිති එහිම වැ සි

---

309 එකල, තත්කාලයෙහි; බරණැස්රද, බාරාණසීරජයා; සෙද, වගා; මැතිවරන්, මන්ත්‍රිවරයන්; ගෙන්නා, කැඳවා; දඩයන ලෙද, දඩයම්පිණිස යනබව; (යනආකාරය) කියා, කථනයකොට; එම්සද, එකල්හි; රජයපාවාදෙමින්, රාජ්‍යයභාරකොටදී.

310 කලුපිලීදූඇද. කාලවර්ණ වස්ත්‍රජාතීන් අවජාදනයකොට; දුන්නද, ධනුවද; යකඩමුගුරද, අයෝමයමුද්ගරයද; තියුනු, තීක්ෂණවූ; අඩයටියද, අර්ධයෂ්ටියද; කඩුවසහ, ඛඩ්ගයහා; පාරාවලල්ලද, එනම් ආයුධයද; යන මෙකී, මෙහි කියනලද්දවූ; පසඳවායුද, ආයුධපඤ්චකයද.

311 ගනිමින්, ගෙණ; හිමවනට, හිමාලයවනප්‍රදෙශයට්; වැද, ප්‍රවිෂ්ටව; මුවදඬෙහි, මුවන් දඩයම්කිරීමෙහි; ලොබ්බැද, ලොභ බන්ධනයකොට; (ලොභකොට) සෙද, සීඝ්‍රව; මුවහසරබලමින්, මෘග සංචාරය අවලොකනය කෙරෙමින්; (මුවන් යන එනමග බලමින්) ඇවිද, ඇවිදලා.

312 කලඑේඑපවිවැසි, එමරිදීපවීවෙහි වසන්නාවූ; නොයෙක් සඳකිඳුරෝ, අනෙකචන්ද්‍රකින්නරයෝතුමූ; වැසිසාරමස, වර්ෂාඍතුවෙහිවූ සාරමාසය මුලුල්ලෙහි; අත්කිසිතැනක, අන්‍යකිසිස්ථානයකට; නොගොසින්, ගමනයනොකොටලා; නිති, නිතරම; එහිම, ඒ (කළඑළුපවීත) යෙහිම; වැසි, වාසය කරන්නෝය.

---

* මෙකී පස් ආයුද.

313 ගිම් සාරමස බැ ස
කෙළ ඇවිදිති එපවී අ ස
බෝසතුද එදව ස
කිඳුරගණ සමගින් එයින් බැ ස

314

බිඳිමින් සඳුන් ග ර
හා අමුකපුරු එක්ක ර
දෙදන්න ඔහු පෙම්බ ර
සියල් තුනුගල් වාසිසිල් ක ර

316

දිසිහොයල වැ ල් ලේ
සඳුන් තුරු සෙවනැ ල් ලේ
මඳනල සිහි ල් ලේ
ඉඳිති කෙළකෙළ කුසුම්හි ල් ලේ

315

හැඳ පෙරව මල් ප ට
ලිහෝ විලිකෙළිනා වි ට
පටන්ගෙණ මොනව ට
කියත් ලිය ගීතද මිහිරිකො ට

317

කිනිහිරියගිරි නි ල්
පෙත්තෙත් ගොතා සුනිම ල්
පැලඳි දම් මහක ල්
වැත්ත මාහැගිබරණ ඉඳුනි ල්

---

313 ගිම්සාරමස, ග්‍රීෂ්මඍතුවෙහිවූසාරමාසයෙහි; බැස,(ඒපර්‍වත යෙන්) බැහැලා; එපවීඅස, එපර්‍වතයසමීපයෙහිම; කෙළඇවිදිති, ක්‍රීඩාකරමින් ඇවිදිත්ය; බෝසතුද, මහාසත්වයාද; එදවස, එදින යෙහි; කිඳුරගණසමගින්. කින්නරාංගනාවගා; එයින්, ඒපර්‍වතය කෙරෙන්; බැස, බැහැලා.

314 සඳුන්ගර, චන්දනසාරය; (සඳුන්අරටු) බිඳිමින්, පොඩිකර මින්; අමුකපුරුඑක්කර, අමුකර්පූරහායොගකොට; (එකතුකොට) පෙම්බර, ප්‍රේමහරිතවූ; ඔහුදෙදන්න, ඒඅඹුසැමිදෙදෙනා; සියල්තුනු, සකලශරීරයෙහි; ගල්වා, ලෙපකොටලා; සිහිල්කර, සීතලකොට;

315 මල්පට, පුෂ්පපට්ටයන්; හැඳපෙරව, අවඡාදනපාරුපනය කොට; ලිහෝවිලි, ලතාඋත්සිල්ලාවත්හි; කෙළිනාවිට, ක්‍රීඩාකරණ කල්හි; මොනවට, මනාකොට; ලියගීතද, ලතාන්විතගීතිකාසාදය පටන්ගෙණ,ආරබ්ධකොට; මිහිරිකොට, මධුරස්වරඥානතොහොත් මධුරකොට; කියත්, කථනයකෙරෙත්.

316 දිසි, දෘෂ්‍යමානවූ; හොයල, ඔයසමීපයෙහිවූ; වැල්ලේ, වැලිතලායෙහි; සඳුන්තුරු, චන්දනවෘක්ෂයන්ගේ; සෙවනැල්ලේ, ඡායාවෙහිද; මඳනල, මන්දමාරුතයෙන්; සිහිල්ලෙ, සිහිල්වූ; කුසුම් හිල්ලේ, මල්ඇතිරියෙහි; කෙළකෙළ, ක්‍රීඩාකොටකොට; ඉඳිති, නිසීදනය කෙරෙත්.

317 කිනිහිරිය,කනිකාරය; ගිරිනිල්,ගින්නේරියයන; සුනිමල්, අතිශයින් නිර්මලවූ; පෙත්තෙත්. මල්පෙතිවලින්; ගොතා, ග්‍රන්ථ නයකොට; පැලඳි, පිලන්ධනයකරණලද; දම්, මාලාදමකෙසේදයත්; මාහැගි, මහානර්‍ඝවූ; ඉඳුනිල්අබරණවැත්ත, ඉන්ද්‍රනීලමාණික්‍යයෙන් කරණලද ආභරණ වැත්තාහ.

318 ගොතා සපු පෙ ත් තෙ ත්
දෙඹකැකුළුලා මි ත් තෙ ත්
ගෙලෙ පැළඳ ග ත් තෙ ත්
දිලෙයි මුතුඅබරණෙහවු නි ත් තෙ ත්

| 319 | | 321 | |
|---|---|---|---|
| අඹමුකුළු සල් ම | ල් | නැවත හැඳ මල් ප | ට |
| කඩා අමුනා පැහැදු | ල් | රිදී පටවත් වැලි පි | ට |
| උදක් මුතුහර තු | ල් | වස්කුළලක් අත | ට |
| පැළඳමල්දම් දෙදෙන මතක | ල් | රැගෙණ මහබෝසත් මහාකො | ට |
| **320** | | **322** | |
| පැමිණ හෝවල ක | ට | පිඹිමින් මහාකො | ට |
| උස් වැලිගොඩක්පිට සි | ට | ගීකියමින් සතුටුකො | ට |
| පැනපැන දිය වල | ට | එසඳ කිඳුරඟන | ට |
| කෙළිති මල්දම්දමා සහතු | ට | එසඳ කීවෙසෙසිත්ම රැඟුම | ට |

---

318 සපුපෙත්තෙත්, චම්පකපුෂ්පපත්‍රවලින්; මත්තෙත්, මතුයෙහි; දෙඹකැකුළුලා, පුන්නාගකුඩ්මලයන්බඟා; (දෙඹමොට්වූ) ගොතා, ග්‍රන්ථනයකොට; ගෙලෙ, ග්‍රීවයෙහි; පැළඳගත්තෙත්, පිලන්ධනයකළහෙයින්; මුතුඅබරණෙව්, මුක්තාභරණමෙත්; නිත්තෙත්, නිත්‍යයෙන්ම; දිලෙයි, බබලයි.

319 අඹමුකුළු, ආම්‍රකුඩ්මලය; (අඹමල්කැකුළු) සල්මල්, සාලපුෂ්පය යනමේ; කඩා, ඡින්දනයකොට ගෙණ; අමුනා, අමුනාගෙණ; පැහැදුල්, ප්‍රභාවොජ්වලිතවූ; (පැහැයෙන් බබලන්නාවූ) උදක්, එකම; මුතුහරතුල්, මුක්තාදාමවැනිවූ; මතකල්, මනොඥකල්‍යවූ; මල්දම්, මාලාදාමයන්; දෙදෙනා, අඹුසැමිදෙදෙනාම; පැළඳ, පිලන්ධනය කොටලා.

320 හෝවලකට, ගංගාවෙක්තිබූආවාටයකට; පැමිණ, ප්‍රාප්තව; උස්, උච්චවූ; වැලිගොඩක්පිට, වැලිගෙඩක් මතුයෙහි; සිට, සිටගෙණ; දියවලට, උදකාවාටයට; පැනපැන, ඝම්පනයකොටකොට, (පනිමින්පනිමින්) සහතුව, සංතුෂ්ටව; මල්දම්, මාලාදාමයන්; දමා, ලුවතලා; කෙළිති, ක්‍රීඩනයකෙරෙත්.

321 නැවත, යලින්; මල්පට, පුෂ්පපට්ටය; හැඳ, ඇඳගෙණ; රිදීපටවත්, රජතපට්ටයක්වැනිවූ; වැලිපිට, වාළුකාමතුයෙහිසිටගෙණ; මහබෝසත්, මහාසත්වතෙම; මහාකොට, යහපත්වම; වස්කුළලක්, බටයෙන්කරණලදතලාවක්; අතටරැගෙණ, හස්තග්‍රහණයකොටලා.

322 මහාකොට, යහපත්වම; පිඹිමින්, ධමනයකරමින්ද; ගීකියමින්, ගීතිකාකථනයකරමින්ද; සතුටුකොට, සංතුෂ්ට කොටලා; එසඳකිඳුරඟණව, ඒවනදකින්නරාංගනාවට; එසඳ, එකල්හි; වෙසෙසිත්ම, විශෙෂයෙන්ම; රැඟුමට, නැටීමපිණිස; කී. කථනයකෙළේය.

323 ඔහු ඉදිරියෙහි සි ව
මහරි මල්දම් විලස ව
මොලොක්අත් විට වි ව
හෙලානගමින්නටයි තුටුකො ව

| 324 | | 325 | |
| --- | --- | --- | --- |
| වස්කුලල් | නා දේ | ලෙලවා රතත් ත | ල |
| එක්කොට ගීත | නා දේ | රඟනරඟ දුටු සුරකැ | ල |
| කියන එකි | නා දේ | වඩවති සිතේ ලො | ල |
| අසනරිසි ඉන් වැඩිව | නා දේ | එසිත් වින්දේය නෙත්ලත් ප | ල |

326 මුහුලිඳු වරින් බ ර
බැබලුනු තුනු සිරින් ක ර
සැදිපිය වුරින් වු ර
රුවට ඇය සුරඟණ දුරින් දු ර

---

323 ඔහු, ඒමහාසත්වයාත්; ඉදිරියෙහිසිට, ඉදිරිපාර්ශවයෙහි සිටගෙණ; මහරිමල්දම්විලසට, මාරුමාලාදමයෙයින්; මොලොක්, මෘදුවූ; (මොලොක්වූ) අත්, හස්තයන්; විටවිට, වරින්විට; හෙලා, පහත්කරමින්ද; නගමින්, උස්කරමින්ද; (උස්පහත්කරමින්) තුටුකොට, තුෂ්ටකොටලා; නටයි, නෘත්‍යකෙරෙයි.

324 වස්කුලල්නාදේ, සුසිරනාදයහා; ගීතනාදේ, ගීතිකානාදය; එක්කොට, එකීභූතකොට; එකිනාදේ, සුසිරගීතිකායන නාදයන්; කියන, කියනාකල්හි; ඉන්, ඒ උභයනාදයන්අතුරෙන්; වැඩිව නාදේ, අධිකනාදයම; අසන, ශ්‍රවණයකරණකල්හි; රිසි, රුචිය උපදනේය.

325 රත්අත්තල, රක්තහස්තතලයන්; (රතුවූඅතුල්) ලෙලවා, ලීලෝපේතකොට; (සොලවමින්) රඟන, නෘත්‍යකරන්නාවූ; රඟ, ආකාරය; දුටු, දර්ශනයකලාවූ; සුරකැල, දිව්‍යසමූහයා; සිතේ, චිත්තයෙහි; ලොල, ආශාව; වඩවති, වර්ධනයකෙරෙත්; එසිත්, ඒහේතුවෙන්; නෙත්ලත්පල, නේත්‍රප්‍රතිලාභයාගේඵලය; වින්දේය, අනුභව කළේය.

326 ඉඳුවරින්, ඉන්දීවරයන්ගෙන් (මානිල්මලින්) බර, භාරවූ; මුහුල, ධම්මිල්ලයක් ඇත්තාවූ; (කෙසකලාපයක්) තුනුසිරින්, ශරීරශ්‍රීයෙන්; බැබලුනු, භ්‍රාජමානවූ; (බබලන්නාවූ) කර, ග්‍රීවයක් ඇත්තාවූ; පියවුරින්, පයෝධරයන්ගෙන්; (තනවලින්) සැදි, සජ්ජිතවූ; වුර, වක්ෂයක්ඇත්තාවූ; (පපුවක්) ඇය, එකිඳුරඟණගේ; රුවට, රූපයට; සුරඟණ, දෙවඟණෝ; දුරින්දුර, දුරින්ම දුරුවූවෝය.

327 නෙත් නිලුපුල් පෙ    තී
ලවන බඳුවද සුර    තී
මුතුවැල වන් ද    තී
මොවුන්දුට ලොබ කවුරු නොවෙ ති

| 328 | | 330 | |
|---|---|---|---|
| වත සුපිපි පියුමෙ | කි | අසමින් නද තෙප | ල |
| නෙත සුනිල් මිනියුවලෙ | කි | අනිකක නොකොට මනදෙ | ල |
| ගත ගතරන් රුවෙ | කි | නොගසාම කත්ත | ල |
| නතණ වණමුත් කවුරු වෙති හැ | කි | *සිටිති සිටිවනම වන ඇත් රැ | ල |

| 329 | | 331 | |
|---|---|---|---|
| කියන ගී නා | දේ | සවන් උඩු කෙරෙ | මින් |
| තබමින් අනුව පා | දේ | මුවෙන් ගත් තණ හෙළ | මින් |
| නටයි දූන බේ | දේ | කඳුලු නෙත් පුර | මින් |
| ගුරුන් නැතුවත් සිල්ප පෑ | දේ | සිටිති මුවමුලු එනද අස | මින් |

327 නිල්උපුල්පෙති, නීලොත්පලපත්‍රවැනිවූ; නෙත්, නෙත්‍රයන් ඇත්තාවූ; බඳුවද, බන්ධජීවපුෂ්පයන්මෙන්; සුරතී අතිරක්තවූ; (ඉතාරතුපැහැය) ලවන, අධරයුග්මයක් ඇත්තාවූ (තොල්දෙකක්) මුතුවැලවන්, මුක්තාවලියකටබඳුවූ; දතී, දන්තපන්තියක්ඇත්තාවූ; මොවුන්දුට, මොවුන්දුටුයේනම්; කවුරු, කවරනම්කෙනෙක්; ලොබ නොවෙති, ලොභ නොවේද්ද.

328 වත, වක්ත්‍රය; (මුහු) සුපිපි, සුපුෂ්පිතවූ; (පිපුනාවූ) පියුමෙකි, පද්මයක්වැනිවෙයි; නෙත. නෙත්‍රයුග්මය; (ඇස්දෙක) සුනිල් මිනියුවලෙකි, අති නීලමානික්‍යයුගලයක් වැනිවෙයි; ගත, ශරීරය; ගත රන්රුවෙකි, ඝන සුවර්ණමයරූපයක් වැනිවෙයි; (එකිඳුරගණ) නතන, අනන්තනම්නාරජු; වණමුත්, වර්ණනාකරන්මුත්; කවුරු, අන්‍යවූකවරෙක්; හැකිවෙති, ප්‍රභුවේද.

329 ගීනාදේඅනුව, ගීතිකානාදයට අනුකූලව; පාතබමින්, පාදස්ථාපනයකරමින්; කියන, ගීකියන කල්හි; බේදේදූන, භෙදය ජනනයකොට; නටයි,නෘත්‍යයකෙරෙයි; ගුරුන් නැතුවත්, ආචාර්‍යවරයන් නැත්තේවීනමුත්; සිල්පපෑදේ, සිල්පසිඞියවත්තේය.

330 නදතෙපල,නාදයභාවචනයන්; අසමින්, ශ්‍රවනයකරමින්; අනිකක, අනික්කරුණක්හි; මනදෙල, චිත්තදෙහල්ය; (සිතෙහි ආසා) නොකොට, නොකර; කත්තල, කර්ණතලයන්; නොගසාම, ප්‍රහාරනොදීම; වන, (වන) වනයෙහිවූ; ඇත්රැල, හස්තිසමූහයෝ; සිටිවනම, සිටිසීටිනැත්වලම, සිටිති, සිටිත්ය

331 සවන්, කර්ණයන්; උඩුකෙරෙමින්, ඌර්ධ්වගතකෙරෙමින්; මුවෙන්,මුඛයෙන්; ගත්,ග්‍රහණයකලාවූ; තණ,තෘණයන්; හෙළමින්, පතිතකෙරෙමින්; නෙත්, නෙත්‍රයන්හි; කඳුලුපුරමින්, කඳුළුපුරා ගෙණ; මුවමුලු, මෘගසමූහයෝ; එනදඅසමින්, ඒගීතනාදය ශ්‍රවනය කෙරෙමින්; සිටිති, සපිතවෙත්.

*සපත් ඒවන නොයෙක් ඇත්රැල පොත්.

332 *පැටියන් බඩ බැ දේ
සාමුව අවුත් එස දේ
තුරුසාවල ඉ දේ
අසති නිසලව එනද පැහැ දේ

| 333 | | 334 | |
|---|---|---|---|
| පියාසර කොට ගෙ | ණ | ගං හෝවල අස | ල |
| ලිහිණිගන අහසින් ය | න | කෙළිනා නොයෙක් මින්කැ | ල |
| මියුරු නද අස මි | ණ | අසමින් නද එක | ල |
| සිටිති අහසමපියාවිදමි | ණ | වරල් ඔසවා සිටිති පිල පි | ල |

335 බරතය වුරඟ ව
රඟන කෙනෙකුන් විලස ව
ගීනදව එක්කො ව
රඟන සඳකිඳුරඟණ මෙලෙස ව

---

332 පැටියන්, පොතිකාවන්; බඩබැදේ, උදරබන්ධනයකොට ගෙණ; සාමුව, සාඛාමෘගයෝ; (රිලව්නහෝවඳුරෝ) අවුත්, ආගමනය කොට; එසදේ, එකල්හී; තුරුසාවල, වෘක්ෂශාඛාවන්හි; ඉඳේ, නිසීදනයකොට; එනද, ඒනාදය; පැහැදේ, ප්‍රසන්නව; නිසලව, නිශ්චලවඉඳගෙණ; අසති, ශ්‍රවණයකෙරෙති.

333 පියාසරකොටගෙණ, පක්ෂපත්‍රවිහිදුවාගෙණ; අහසින්යන, ආකාශයෙන් ගමන්කරන්නාවූ; ලිහිණිගන, පක්ෂිසමූහයෝ; මියුරු නද, මධුරවූනාදය; අසමිණ, ශ්‍රවනයකරමින්; අහසම, ආකාශයෙහිම; පියාවිදමිණ, පියාපත්විහිදවාගෙණම; සිටිති. සිටින්ය.

334 ගංහෝවල අසල, ගංගා ඕඝවල්හී; කෙළිනා, ක්‍රීඩාකරන්නාවූ; නොයෙක් මින්කැල, අනෙක මත්ස්‍යසමූහයෝ; කල, කරණලද; එනද, ඒනාදය; අසමින්, ශ්‍රවණයකොට; ඉපිලඉපිල, මතුමතුවෙවී; වරල්ඔසවා, ඔසවනලදවරලින්යුක්තව; සිටිති, සිටින්ය.

335 බරතයවුරඟව. භාරතඍෂීනුගේ ශාස්ත්‍රයෙහිවූආකාරයට; රඟන, නෘත්‍යකරන්නාවූ; කෙනෙකුන්විලසට, කෙනෙකුමෙන්; ගීනදව, ගීතනාදයට; එක්කොට, සමකොට; මෙලෙසට, මෙයාකාරයට; රඟණ, නෘත්‍යකරන්නාවූ; සඳකිඳුරඟණ, චන්ද්‍රකින්නරාංගනාව.

---

* පැටවුන්බඩබැදේ.

336 බරණැස් තිරිඳු ස ද
අසමින් ඒම්සුරු න ද
දනසුන් මෙව්න මැ ද
කවරකෙනෙකුත්ගේද මේ න ද

337

සිතමින් සෙමින් සි ට
පියසත්නොකොට පට පි ට
බලමින් ගොස් ළඟ ට
මෙසේඋන් රඟණරඟ දක සි ට

338

අසිරිමත් නැටුමෙ කි
අසමානවූ රුසිරෙ කි
සුමිහිරි කටහඬෙ කි
කවරදවසෙක ලැබුම්වේ හැ කි

339

සිත ඔහුගේ ම ත් වී
අනුරාග බලව ත් වී
ගුණදම් ඉව ත් වී
එසින් බෝසතු මරණ සි ත් වී

3 0

ගියක් ගෙණ අත ට
ඇඳඇරබමා තිය පි ට
දුතිවර කවා සි ට
විදපි ඇද උරපුර තදකො ට*

---

336 බරණැස්තිරිඳුසඳ, බාරාණසීනගරෙහි උත්තමයා; ඒම්සුරු නද, ඒමධුරනාදය; අසමින්, ශ්‍රවණයකොට; දනසුන්, ජනසුන්‍යවූ; (මිනිසුන්නැති) මෙව්නමැද, මෙව්නමධ්‍යයෙහි; මේනද, මේනාදය; කවරකෙනෙකුත්ගේද, කවරනම්කෙනෙකුගේදැයි.

337 සිතමින්, චින්තනයකරමින්; සෙමින්, ඉක්මන්නොව; සිට, සිටිතැන; පටපිට, හාත්පස; පියසත්නොකොට, පදසංඥ නොකොට; බලමින්, අවලෝකනයකොට; ළඟටගොස්, සමීපයට පැමිණ; මෙසේ, මෙයාකාරයෙන්; රඟණ, නෘත්‍ය කරන්නාවූ; රඟදක, නෘත්‍යදර්ශනයකොට; සිටඋන්, සිටිනවූඋන්නේය.

338 අසිරිමත්, ආශ්චර්‍ය්‍යමත්වූ; නැටුමෙකි, නෘත්‍යයෙක; අසමානවූ, කිසිවෙකුටත් සමානනුවූ; රුසිරෙකි, රූපශ්‍රීයාවෙක; සුමිහිරි, ඉතාමිහිරිවූ; කටහඬෙකි, මුඛශබ්දයෙක්ය; (මෙයාකාරවූ කිඳුරඟණ) කවරදවසෙක, කිනම්දවසෙක්හි; ලැබුම්හැකිවේ, ලැබීමට පුළුවන්වේදැ. (හැකිවේදැ)

339 ඔහුගේ, ඒරාජයාගේ; සිත, චිත්තය; මත්වී, (රාගයෙන්) උමතුවීය; අනුරාග, අනුරාගය; (රාගයෙන්රත්වීම) බලවත්වී, බලවත්වීය; ගුණදම්, ගුණධර්මය; ඉවත්වී, දුරුවීය; එසින්, එසේ හෙයින්; බෝසතු, මහාසත්වයන්; මරණසිත්වී, මැරීමට සිත් පහළවීය.

340 අතට, හස්තයට; ගියක්ගෙණ, ධනුසක්ගෙණලා; ඇඳඇරද, සැජ්ජකොට; තියපිට, තබමතුයෙහි; බමා, කරකවා; දුති, දූත්; කරකවාසිට, භ්‍රමනයකොටලා; තදකොට, දැඩිකොට; උරපුර, තැන්කවා; ඇද, ඇදලා; විදපි, විද්දේය.

---

* තරකොට. පොත්.

341 හිය වැද බෝස ත්
දුක්වේදනා බලව ත්
ඉවසියහැකි නොහෙ ත්
එසින් මෙලෙසින් අඬාවිලපි ත්

342
සබඳ පිය බ දිනේ
ආයු ඇතිවේද හො දිනේ
හි පහර ත දිනේ
අකල් මරණෙක්වීය මෙ දිනේ

343
සොඳුර ඉන් මෙක ළේ
මසිත කෙළියෙහි නෑ ලේ
වණයෙන් වැහෙන ලේ
*ගලනවැනි උල්පතින් සිලි ලේ

344 කකියාගිය තෙලෙ ක
ලූතණ සෙයින් විගස ක
දිවි නොතිබෙයි නිසැ ක
ඉඳුව නෝ දුක්නොවී පණ රැ ක

---

341 හියවැද, ඊයවැදී; බෝසත්, මහාසත්වතෙම; බලවත්, දැඩිවූ; දුක්වේදනා, දුඃඛවේදනාවන්; ඉවසියහැකි නොහෙත්, ඉවසියනොහැකිවීය; එසින්, එසේහෙයින්; මෙලෙසින්, මේආකාරයෙන්; අඬා, රොදනයකොට; විලපිත්, විලාපද කීයහ.

342 පියබඳිනේ, ප්‍රියභාවයෙන්බැඳුනාවූ; සබඳ, (මාගේ) ප්‍රිය සුන්දරිය; හොඳිනේ, යහපත්ව; ආයුඇතිවෙද, ආයුෂ ඇතිවන්නේද; තදිනේ, දැඩිව; හීපහර, ශරප්‍රහාරය හේතුකොටගෙණ; මෙදිනේ, මේදිනයෙහි; අකල්මරණෙක්, අකාලමරණයෙක්; වීය, වූයේය.

343 සොඳුර, සුන්දරිය; ඉන්, එසේහෙයින්; මෙකළේ, මේකාලයෙහි; මසිත, මාගේචිත්තය; කෙළියෙහි, ක්‍රීඩායෙහි; නෑලේ, ආසක්තනොවන්නේය; වණයෙන්, ව්‍රණයෙන්; වැහෙන, පිටවන්නාවූ; (ගලන්නාවූ) ලේ, ලෝහිතය; උල්පතින්, උල්පයකින්; සිලිලේ, ජලය; ගලනවැනි, ගලාවැහෙන්නාමෙනි.

344 කකියාගිය. හුණුවගියාවූ; තෙලෙක, තෛලයෙක්හි; ලූ, බහනලද; තණසෙයින්, තෘණපරිද්දෙන්; විගසෙක, ඉක්මන් වම; දිවිනොතිබෙයි, ජීවිතය නොපවතියි; නිසැක, සැකරහිතව; නෝ, නුඹද; දුක්නොවී, නිදුක්ව; පණරැක, ප්‍රාණය රක්ෂාකොටලා; ඉඳුව, නිසිදනයකරව. (වාසකරව)

---

* දමනවැනි උල්පතින් සිලිලේ.

345 සිහිනැත මදින් ම ද
බල අඩුවෙයි සෙදින් බ ද
වියොදුක් තදින් ත ද
ඉතින් පණ යැගෙයි ලෙදින් ලෙ ද

346
උදක් පණ ලොබි නී
අඬනෙයි නොසිත නොදූ නී
මතුමගෙ වියො වි නී
දුකුත් සැලකෝ මෙනොප විසි නී

347
මාහා සමග පෙ ර
කෙළ ඇවිදිනැත් වනතු ර
දූක තිගෙසිත කව ර
ලෙසක සනහාගනුද දවසැ ර

348 අඬමින් දුකින් හො ත්
සිවුමැලි එමහබෝ ස ත්
සිහි මුලාවෙන් සි ත්
*අනික් ඇලයෙන්ද පෙරලි ඔ ත්

---

345 මදින්මද, මඳමඳව; සිහිනැත, සමෘතිරහිතවෙයි; සෙදින්, ඉක්මන්වම; බඳ, ශරීරයෙහි; බල, ශක්තිය; අඩුවෙයි, ඌනවෙයි; වියොදුක්, අපදෙදෙනාගේ වෙන්වීමෙන් ගුවගත්තා දුඃඛය; තදින් තද, අතිශයින්ම දැඩිවෙයි; ඉතින්, ඉක්බිතිව; ලෙදින්ලෙද, ඉක්මන්වම; පණසැගවෙයි, ප්‍රාණය මුවහවෙයි.

346 උදක්, එකම; පණලොබින්, ප්‍රාණලොභයෙන්; නොදූනී, නොදූන; අඬනෙයි, අඬනැයි; නොසිත, නොසිතව; මතු, අනාගතයෙහි; මගෙවියොවිනි, මාගේ වෙන්වීමෙන්; මෙනොපවිසිනී, මෙයුෂ්මතිය එසින්; දුකුත්සැලකෝ, දුක්සැලිකීමක්ද ඇතිවනු ලබන්නීය.

347 පෙර, ඉකුත්කල; මාහාසමග, මාහාකැටිව; වනතුර, වනාන්තරයෙහි; කෙළ, ක්‍රීඩාකරමින්; ඇවිදිනැත්, සංචාරයකල ස්ථානයන්; දූක, දූකලා; තිගේ, තීගේ; සිත, චිත්තය; කවර ලෙසක, කවරආකාරයකින්; දවසැර, දිවශාතික්‍රමනය කරමින්; සනහාගනුද, සංසිඳුවාගන්නෙහිද; (එහෙයින්ම දුක්වෙම්යනුභාවයි)

348 අඬමින්, රොදනයකරමින්ද; දුකින්, දුඃඛයෙන්ද; හොත්, සයනයකලාවූ; සිවුමැලි, සුකුමාලවූ; සිත්, චිත්‍රවූ; (ශරීරයක් ඇති) එමහබෝසත්, ඒ මහාබොධිසත්වතෙම; සිහිමුලාවෙන්, සති සංමෝහයෙන්; අනික් ඇලයෙන්ද, අන්‍ය අංසයෙන්ද; පෙරලි, පරිවර්තිතයව; ඔත්, සයනයකොළේය.

---

* අනිත්ඇලයට පොලෙමින්ඔත්. පොත්.

349 කිඳුරගණ බෝස ත්
චිත්කැතියා නොදනි ත්
නොලා ඔහුදෙස නෙ ත්
නටා කෙළියෙහි ලොබින් බලව ත්

350

ගීනද බිය ප මා
කාරණ කිමැයි නග මා
හොත් ඔහු ලගව් මා
ගොසින් මුසපත්විය විස මා

351

දකිමින් වැහෙන ලේ
*හදවත දුකින් වෙව් ලේ
මිනිසුන් නැති ව ලේ
මෙදුක් කාගෙන්විද මෙක ලේ

352

මෙබඳු දුකකුත් ව න
කෙනෙකුත් නැත පිහිට ව න
දෙකක් කරමින් ව න
අඬාවනසෝ කියන්නට ව න

353

හැඟවීසිටි එර ද
කිඳුරා මලේයයි සෙ ද
එලිබසිමින් එස ද
මෙසේ පැවසියනෙපුල් මනන ද

---

349 කිඳුරගණ, කින්නරාංගණාතොමෝ; බෝසත්, මහාසත්වයා; චිත්කැතියා, ඊපහරකෑබව; නොදනිත්, නොදන්නී; ඔහුදෙස, ඔහුදිශාවට; නෙත්, නෙත්‍රයන්; නොලා, නොබහා; බලවත්, දැඩිවූ; කෙළියෙහිලොබින්, ක්‍රීඩාලොභයෙන්; නටා, නෘත්‍යකොටලා.

350 ගීනද, ගීතනාදය; පමාවිය, ප්‍රමාදවිය; නගමා, නොසතුටුවිමට; කාරණකිමැයි, කරුණකවරේදැයි; හොත්, සයනයකළාවූ; ඔහුලගටමා, ඔහුසමීපයට; ගොසින්, ගමනයකොට; විසමා, විෂමාකාරයෙන්; මුසපත්විය, මොහප්‍රාප්තවිය.

351 වැහෙන, වැහෙන්නාවූ; ලේ, ලොහිතය; දකිමින්, දර්ශනයකොටලා; හදවත, හෘදයවස්තුව; දුකින්, දුඃඛයෙන්; වෙව්ලේ, කම්පාවී; මිනිසුන්නැති, මිනුෂ්‍යයන් නැත්තාවූ; වලේ, වනයෙහි; මෙකලේ, මෙකල්හි; මෙදුක්, මේදුඃඛයන්; කාගෙන්විද, කවර කෙනෙකුගෙන්විඳදැයි.

352 මෙබඳු, මෙයාකාරවූ; දුකකුත්, දුඃඛයකුත්; වන, වූයේය; පිහිටවන, ප්‍රතිෂ්ඨාවිමපිණිස; කෙනෙකුත්නැත, අන්කෙනෙකුත් නැත්තේයයි; වන, වනය; දෙකක්කරමින්, දෙකක්කොටලා; අඬා, රොදනයකරමින්; වනසෝ, සිඩවූශොකය; කියන්නටවන, කථනයට පටන්ගත්තිය.

353 හැඟවීසිටි, නිලීනවසිටියාවූ; එරද, එරාජයා; කිඳුරා, කින්නරයා; සෙද, වහා; මලේයයි, මරණයටපත්වූයේයයි; එසද, එකල්හි; එලිබසිමින්, එළියටඅවුත්; මෙසේ, මෙයාකාරයෙන්; මනනඳනෙපුල්, මනොනන්දනීයවූ වචනයන්; පැවසිය, ප්‍රකාශකෙළේය.

---

* හදවත දුකින්තැවිලේ. පොත්.

354 නොයෙදෙයි අඩත්ත ව
මලවුත් උපදවත්ත ව
බැරියයි කපිත් ක ව
කියතිලොව පුළුවත්ද දුත් ති ව

| 355 | | 356 | |
|---|---|---|---|
| දඬයමෙහි ලොබ | ලා | සොළොස්දහසක් ම | ව |
| ආවාමිසක් මෙව | ලා | පුරඟන ඇත නියමකො, | ව |
| බරණැස මතක | ලා | උත්හැමට මුල් කො | ට |
| රජකරත්තේ මමය මෙක | ලා | තබමිඅගමෙහෙසුන්බිසෝකොට | |

357 නොකොට ඉත් සෝ ක ය*
පවතිනතෙක්ම මේ ක ය
සපැමිණබිසේ ක ය
විඳිමු රජසැප මිනිස් ලෝ ක ය

---

354 අඩත්තට, රෙදනයට; නොයෙදෙයි, සුදුසුනොවෙයි; මලවුත්, මියගියවුත්; උපදවත්තට බැරියයි, උපදවීමට නොහැක්කේයයි; ලොව, ලොකවාසීහු; කපිත්කට, මුඛයක්පාසා; කියති, කථනයකෙරෙති; (එසේකල්හි) දුත්, මේකාලයෙහි; තිට, තුෂ්මතියට; පුලුවත්ද, (උපදවීමට) හැකිවුවාද.

355 දඬයමෙහි, දඬයම්කිරීමෙහි; ලොබලා, ලොභකොට; මෙවලා මේවනයට; ආවාමිසක්, ආයෙවීතමුත්; මතකලා, මනොකලඝවු; බරණැස, බාරාණසීනගරයෙහි; මෙකලා, මේකාලයෙහි; රජකරත්තේ, රාජ්‍යයකරත්තේ නම්; මමය, මම්මවෙම්දැයි.

356 මට, මාහට; සොළොස්දහසක් පුරඟණ, සොඩසසහස්‍ර සංඛ්‍යාතවු පුරාංගණාවෝ; නියමකොට, නිශ්චයෙන්ම? ඇත, ඇත්තාහ; උත්හැමට, ඔවුන් සියලුදෙනාටම; මුල්කොට, මූලිකවු; අගමෙහෙසුන් බිසෝකොට, අග්‍රමහේෂිකා ස්ථානාන්තරයෙහි; තබමි, ස්ථාපිත කරන්නෙමි.

357 ඉත්, එසේහෙයින්; සෝකයනොකොට, සෝකනුපදවා; මේකය, මෙ ශරීරය; පවතිනතෙක්ම, පවත්නාතුරම; අබිසේකය, අභිෂේකයට; සපැමිණ, සම්ප්‍රාප්තව; මිනිස්ලෝකය, මනුෂ්‍යලොකයෙහි; රජසැප, රාජ්‍යසුඛය; විඳිමු, විඳනයකරමු.

---

*මේකට හැමපොතකම ඉතා ආකුලව තිබී මහත් උත්සාහයෙන් පිළියෙල කෙළෙමු. පරීක්ෂාකෙරෙත්වා.

358 අසමින් සිදුරග — න
රජුදෙස බලා බියගෙ — න
නෑත මෙහි කෙනෙක් වෙ — න
මහිමි විද්දේ මේසොරා ව — න

| 359 | | 360 | |
|---|---|---|---|
| සිතමින් ගොස් නොසි | ව | නිවරැදි මහිමි ස | ද |
| නැගීසිට ගිරි මුදුන | ව | තියුනු හියෙන් තෝ අ | ද |
| සිත බියහැර එවි | ව | *විද්දේ කිසිල් මැ | ද |
| පටන්ගතු මෙලෙසින් අඩන්න | ව | කවර නගෙ වරදෙක්ද පෙරබ | ද |

361 කිමිසඳ මා නි — සා
†මැරීනන් තෝ සහ — සා
ඒදෙස් නොවල — සා
තාත්තගෙ අඹුවනුත් වන — සා

358 සිදුරගත, සිනතරංගණාව; අසමින්, (ඒකපාව) අසා; රජුදෙස, රජහු උන්දිශාව; බලා, නිරීක්ෂණයකොටලා; බියගෙණ, භයග්‍රහණයකොට; මෙහි, මේස්ථානයෙහි; වෙනකෙනෙක්, අන්‍යවූ සත්වකෙනෙක්; නෑත, නැත්තාහුය; (එසේහෙයින්) මහිමිවිද්දේ, මාගේ ස්වාමියාවිද්දේනම්; මේසොරුවන, මේචෞරයාමවන්නේයයි.

359 සිතමින්, චින්තනයකරමින්; නොසිව, (එහි) නොසිට; ගොස්, ගමනයකොට; ගිරිමුදුනට, පර්වතමස්තකයට; නැගීසිට, නැගීලා; එවිට, එකල්හි; සිත, චිත්තයෙහි; බියහැර, භයදුරුකොට්ලා; මෙලෙසින්, මෙයාකාරයෙන්; අඩන්නට, රොදනයට; පටන්ගතු, ආරම්භකළා.

360 නිවරැදි, නිරවද්‍යවූ; මහිමිසඳ, මාගේස්වාමි උත්තමයා; තෝ, තුම්බත්තෙම; අද, අද්දිනයෙහි; තියුණුහියෙන්, තීක්ෂණවූ සැරයෙන්; කිසිලිමැද, කක්ෂමධ්‍යයෙහි; විද්දේ, විද්දෙහිය; පෙරබද, පූර්වයෙහිබඳනාලද; නගෙ, තුම්බතාගේ; කවරවරදෙක්ද, කිනම් දෝෂයෙක්ද.

361 කිමිසඳ, (මාගේ) ස්වාමිපුත්‍රයා; මානිසා, මාකරණකොට ගෙණ; තෝ, තුම්මත්; සහසා, වහා; මැරීණන්, ඝාතනයකෙළේ නම්; ඒලෙස, ඒදෙසය; නොවලසා, වහා; තාත්, තුම්මතාත්; තගෙ අඹුවනුත්, තුම්මතාගේ අම්බිකාවනුත්; වනසා, විනාශ කෙරෙයි.

* විද්දේය වනමැද. පොත්.
† මැරීනන් තෝ නොලසා. පොත්

362 තගෙ මවු බිසෝ ල ද
තා නොදුකම දුකින් ත ද
මියගොස් නිරු වැ ද
පැසේවා කප්දහස් දුක් වි ද

363
පව්වු කරනි ත් ද
*නොබැලිය ලොව නි ත් ද
කල දුකු ම ත් දී
†නිරුවදිවා සහ බිරි ත් ද

364
ප්‍රියපුතන තා ගේ
පිහිටක් නැතුව කා ගේ
ගොසින් යමයා ගේ
×පුරටවත්නොත්යෙහෙකිවේගේ

365 සොළොස්දහසක් පු ර
අඟනන් සමග එක ව ර
මියගොස් රජා හැ ර
නොයත් විඳුවයි නිරා කරද ර

---

362 තගෙ, යුෂ්මිතාගේ; මවුබිසෝලද්, මාතෘමහෙසිකාකාත් තාව; තොනොදුකම, යුෂ්මත්දශිතයතෙතකොටම; තදදුකින්, දඩිවූ දුඃඛයෙන්; මියගොස්, මරණප්‍රාප්තව; නිරුවැද, නරකප්‍රාප්තව; කප්දහස්, කල්පසහශ්‍රයන්හි; දුක්විඳ, දුක්අනුභවකොට; පැසේවා, පරිපාකයට පැමිණේවා.

363 පව්වු, පාපිෂ්ටවූ; නරනිත්ද, නරේන්ද්‍රය; ලොව, ලොකයෙහි; නින්ද, අවමානය; නොබැලීය, (යුෂ්මත්) නොබැලුයෙහි; කළද, (මේ) කරණලද දෙය; කුමන්ද, කිමෙක්ද; බිරින්දසහ, භාර්‍ය්‍යාවසහිතවූ (යුෂ්මත්;) නිරා, නරකයෙහි; වදිවා, ප්‍රවිශ්‍යවේවා.

364 තාගේ, යුෂ්මතාගේ; පිගපුතන, ප්‍රියපුත්‍රයෝද; කාගේ, කිසිවෙකුගේවත්; පිහිටක් නැතුව, ප්‍රතිෂ්ඨා රහිතව; ගොසින්, ගමනයකොට; යමයාගේපුරට, යමපුරයට; වේගේ, වේගවත්වම් වත්නොත්, වැදූතේනම්; යෙහෙකි, මනාවේසි.

365 සොළොස්දහසක්, දශසහස්‍රයක් පමණවූ; පුරඅඟනන් සමග, පුරාඞ්ගනාවන්හා; එකවර, එකවිරම; රජහැර, රාජ්‍යය දුරුකොට; මියගොස්, මරණයටපැමිණ; නොයත්, යුෂ්මතාත්; නිරා කරදර, නරකයෙහිවූ දුඃඛයන්; විඳුවයි, අනුභවකරුවයි කියා.

---

*නොබැලිය ලොවෙහි නින්ද. †නිරුවදුවයි සහ බිරින්ද පොත්
× සෙනෙවිලාගේ. පොත්.

366 කිඳුරඟණ තොල සිත්
පියරුහුණුවක පිල සිත්
පිංහුණු වරල සිත්
ඇවිලි අවමින් අඬසි මෙමෙල . සිත්

| 367 | | 368 | |
|---|---|---|---|
| අස්වැසි ලියබ | සිත් | සඳිසි ඉඳුවර පෙ | නි* |
| එතිරිඳු කියසි මෙමෙල | සිත් | දිගුපුලුලැති සුනිල්නෙත | නි |
| කිඳුරගණ වෙමෙස | සිත් | වත සඳමඬල යු | නි |
| අසව මකියනතෙපුල්සතො | සිත් | අගමෙහෙසිනිකමට යහප | නි |

369 රජසැපත බලව නි
අඩුවක් කිසිවකුත් නැ නි
දෙදෙනම සමඟ වෙ නි
විඳිමුසැප ආයුඇතිතෙක් නි නි

---

366 කිඳුරගණ, කින්නරාංගනාව; තොලසින්, වතා; පියරුහුනුවක, උමතුවුවකගේ; පිලසින්, පීලාශයෙන්; පිංහුණු, පිංවයි බහනලද; වරලසින්, ධම්මිල්ලයෙන් යුකතව; (කෙශකලාපය) ඇවිලිඅවමින්, සාපබස් දෙඩමින්; මෙමෙලසින්, මෙයාකාරයෙන්; අඬසි, රුදනයකෙරෙයි.

367 එතිරිඳු, එනරේන්ද්‍රතෙම; අස්වැසිලියබසින්, සැනසිලි වචනවලින්; මෙමෙලසින්, මෙයාකාරයෙන්; කියසි, කථනය කෙරෙයි; කිඳුරගණ, කින්නරාඞ්ගණාවෙනි; වෙමෙසසින්, විශෙෂයෙන්; මකියනතෙපුල්, මාවිසින්කියනලද වචනයන්; සතොසින්, සන්තොෂයෙන්; අසව, ශ්‍රවනයකරව.

368 ඉඳුවරපෙති සඳිසි, ඉන්දීවරපත්‍ර වැනිවූ; (නිල්මානිල්මල් පෙති වැනිවූ) දිගු, දීඝවූද; පුලුල්ලැති, පෘථුලවූද; සුනිල්, අතිනීල වර්ණවූ; නෙති, නෙත්‍රයුග්මයක් ඇත්තාවූ; වත, වක්ත්‍රාඛ්‍ය කාරණ කොටගෙණ; (මූනුනා) සඳම්ඬලයුහුන්, චන්ද්‍රමණ්ඩලයවැනිවූ; (නී) අග මෙහෙසිනිකමට, අග්‍රමහේෂිකාබවට; යහපති, මනාවෙයි; (යහපත් වෙයි.)

369 රජසැපත, රාජසම්පත්තිය; බලවති, බලවත්බැවින්; කිසිවකුත්, කිසිගම්දෙයකිනු; අඩුවක්නැයි, උනතාවයක් නො මැත්තෙය; දෙදෙනම, උභයජනයෝතුමු; සමගවෙති, සාමග්‍රිධර්මය පවතින්නම්; ආයුඇතිතෙක්, ආයුෂ්‍ය ඇතිතාක්; නිති, නිත්‍යයෙන්; සැපවිඳිමු, සුවඅනුභවකරන්නෙමු.

---

* වලසඉඳිවරපෙති. වතසඳම්ඬලවෙති. අගමෙමෙහෙසිනිකමටබලවයි අගමෙහෙසිනිකමට තොමෙවයි. පොත්.

370 කිඳුරඟන එපව ත්
අසමින් දුක්ව බලව ත්
මියන පමණක් මු ත්
තනෙවන සැපවිඳ ඉඳීමෙක් නැ ත්

371
අසා එතිරිඳු ස ද
කිඳුරඟණ කීබස් න ද
ඇසෙන සිත පිළිබි ඳ
ඇරපි අතදවන බඳුනක් ලෙ ද

372
කත්තලවි නොයෙ කී
සීවා කණව නොවැ කී
තිරිසන් ගිය එ කී
පැතු ඒමමද තිරිසෙන කී

373 තාලිස් තුවර ලා
හොඳුරට කමින් නොව ලා
ඉඳිනු මිස මෙව ලා
කුමන සැපයක් විඳිද මෙක ලා

---

370 කිඳුරඟණ, කින්නරාංගනාව; එපවත්, ඒප්‍රවෘත්තිය; අසමින්, ශ්‍රවණයකරමින්; බලවත්, දැඩිවූ; දුක්ව, දුඃඛයටපැමිණ; මියන පමණක්මුත්, මරනයට පැමිණෙන්නේවීනමුත්; තනෙවන, නුඹකෙරෙහි; සැපවිඳ, පස්කම්සුව අනුභවකරමින්; ඉඳීමෙක් නැත්, වාසයෙක් නම් නොමැත්තේය.

371 එතිරිඳුසද, ඒනරේන්ද්‍රවශ්‍යයා; කිඳුරඟණකී, කින්නරාංගනාව විසින් කියනලද; නදබස්, දැඩිවූවචනයක්; අසා, ශ්‍රවණයකොට; ඇසෙවන, ඇසෙකෙරෙහි පැවතුනාවූ; පිළිබඳසිත, ප්‍රතිබද්ධචිත්තය; අතදවන, හස්තයදවන්නාවූ; බඳුනක්ලෙද, භාජනයක් මෙන්; ඇරපි, අත්හැරියේය.

372 නොයෙකී, අනෙකවූ; කත්තලවි, සැලවචනයන්; සීවා, කථනකලාවූ; (මාගේබස්) කණව, කණින්ටම; නොවැකී, නොවැකුනාවූ; (ප්‍රවෙශනුවූ) තිරිසන්ගියඑකී, තිරශ්චීනගතසත්‍වයා; පැතූ, ප්‍රාර්ථනාකළාවූ; ඒමමද, එආකාරවූ මමත්; තිරිසෙනකී, තිරිසන් ගති ඇත්තෙක්මවිමි.

373 තාලිස්, තලිස්පතුරැහා; තුවරලා, තගරයන්ද; නොවලා, අමඳව; හොඳුරට( හොඳවාරයපිණිස; කමින්, අනුභවකරමින්; මෙවලා, මේවහාගෙහිම; ඉඳිනුමිස, ඉඳීමමිසක්; මෙකලා, මේකාලයෙහි; කුමනසැපක්, කිනම්සුවයක්; විඳිද, අනුභවකෙරේද.

374 තිරිසන් ජාති ඇ ති
එකකු සමගව නොසිඳි ති
වඩමින් සිතේ රැ ති
*ඉඳුව දිවිහිමි වසීමෙක් නැ ති

| 375 | 376 |
| --- | --- |
| කියා බස් නි ත් ද | එවිටම කිඳුරඟ න |
| අවනත නුවූ ස ත් ද | †රජු ලොබහැර ගියා දූ න |
| සිතේ ලොබ සි ත් ද | ගිරි මුදුනෙන් යෙහෙ න |
| ගිමය් නොසිටම එතර නි ත් ද | ඇවිත් මහබෝසත් වැළඳගෙ න |

377 අඬා ඉකි බිඳ බි ඳ
ඔසවා ඔහුගෙ මලක ඳ
ගෙණගොස් ලෙදිත් ලෙ ඳ
තබාගෙණ ගිරිමුදුනෙහි ඉ ඳ

---

374 තිරිසන් ජාති ඇති, තිරශ්චීන ජාති ඇත්තාවූ; එකකු, එකියක්හා; සමගව, එක්ව; නොසිඳිති, වාසයකිරීමෙක් නැත්තේ යයි; සිතේ, චිත්තයෙහි; රැතිවඩමින්, රැතිය වඩිනය කෙරෙමින්; ඉඳුව, වසනසකරව; (නිහා) දිවිහිමි, ජීවිතාන්තයවනතුරු; වසීමෙක්, වාසයෙක්; නැත්, නැත්තේය.

375 නිත්දබස්කියා, නිඤුවචන කියාත්; අවනත නුවූසත්ද, නොනැමුනමෙනසින්; සිතේ, චිත්තයෙහි; ලොබ, ලොභය; සිත්ද, දුරුකොට; (සුප්කොට) එතරනිත්ද, එතෙරකළුය; නොසිටම, නොනැවතීම; ගිමය, ගමනයකෙළේය.

376 එවිටම, එඇසිල්ලෙහිම; කිඳුරඟන, කින්නරාංගනාව; රජු, රජයා; ලොබහැර, ලොභයදුරුකොට; ගියා, ගියබව; දූන, ජානනයකොට; යෙහෙන, යහපත්ව; ගිරිමුදුනෙන්, පර්වතමස්තකයෙන්; ඇවිත්, ආගමනයකොට; මහබෝසත්, මහාබොධිසත්වයන්; වැළඳගෙණ, ආලිංගනයකොටගෙණ.

377 ඉකිබිඳබිඳ, හික්කානසමින්; අඬා, රොදනයකොට; ඔහුගෙ, ඒමහාසත්වයන්ගේ; මලකඳ, මෘතකලෙබරය; ඔසවා, උස්සා; ගෙණගොස්, ග්‍රහණයකොට ගොසින්ලා; ලෙදින්ලෙද, වරින්වර; තබාගෙණ, තබාගෙණ; ගිරිමුදුනෙහි, පර්වතමස්තකයෙහි; ඉඳ, හිඳිනයකොට.

---

* ඉඳුව දිවිවිතර කැකුළුමෙක් නැති.
† ඔහු ලොබහැර ගියාදූන. නොහොත්,

378 සෝකයෙන් තැවෙ — මින්
*ලෝපල් සුරන් යදි — මින්
ඉඳ දසත වැතෙ — මින්
අඬයි දුක් මෙලෙසින් කිය — මින්

379 ඇ ද ග ත් — තදින් විදිහැර නොවැරදී වැ — ද
හි ය ප ත් — මුවෙන් වැම්මෙන ලේ හැලි නොම — ද
බ ල ව ත් — දුකින් වැළපෙමි හිමි නුඹ වැළ — ද
මගෙහොත් — දියෙන් සේදී ගත ගියේ වෙ — ද

380 සිප බ ද — කොමලතින් මුව මි පොවා — පියා
සැපවි ද — කලක් සමගිව මන පිනා — පියා
ලප ස ද — ලෙසින් උන් මෙහෙසිම් මරු — පියා
අප අ ද — කුමට වෙන්කරපිද පා — පියා

---

378 සෝකයෙන්, දුකින්; තැවෙමින්, තාපනයවෙමින්; ලෝපල්සුරන්, ලොකපාලදෙවතාවන්ට; යදිමින්, යාඥාකරමින්; දසත, දසදිශාවටම; වැතෙමින්, වංචලවෙමින්; ඉඳ, නිසීදනයකොට; දුක්, දුඃඛවේදනාව; මෙලෙසින්, මෙම ආකාරයෙන්; කියමින්, කථනයකරමින්; අඬයි, රෝදනයකෙරෙයි.

379 තදින් ඇදගත්, දැඩිව ඇදගෙණ; විදිහැර, විදිනාලදර්ය; නොවැරදී, නොවැළකම්; වැද, සම්භව; හියපත් මුවෙන්, සරප්‍රාපත මුඛයෙන්; (ඊතලඇතුල්වුවඅගයෙන්) නොමද, නොබෙහෙවින්; වැම්මෙන, වැමෙනත්නාවූ; ලේහැලි, ලොහිත නිර්ඣරයෙන් යුක්තවූ; හිමි, ස්වාමිනි; නුඹ, නුඹවහන්සේ; වැළද, අලිංගනයකොටගෙණ; බලවත්දුකින්, දුඃඛවේදනාවෙන්; වැළපෙමි, විලාපකියමි; මගෙ හොත්, (එහෙත්වූ මාගේ නෙත්‍රයෙන්; දියෙන්, අශ්‍රුධාරාවෙන්; සේදී ගණ ගියේවෙද, ධෞතයකොටගෙණ ගියේවෙද.

380 සිප, (මුඛ) චුම්බනයකොට; බද, ශරීරය; කොමලතින්, කොමලභාවයෙන්; (මොළොක් සුවපහස් ඇති අයින්;) මුවම්, මුඛයෙන්; පොවාපියා, පානයකරවා; කලක්, කාලයක්මුලුල්ලෙහි; සමගිව, එක්වී; මනපිනාපියා, චිත්තපිණනයෙන්යුක්තව; සැපවිද, (පස්කම්සුව) අනුභවකොටලා; සඳලපලෙසින්, චන්ද්‍රයාගේ සලාංඡනය මෙන්; උන්, (සමගිව) උන්නාවූ; මෙහෙසිම්, මහේෂිවූ මා; මරුපියා, ඝාතනයකොටලා; අද, අදදවස්හි; අප, අඦවූ පුතුනු; පාපියා, පාපිවූරජහු; කුමට, කුමක්නිසා; වෙන්කරපිද, වෙනස්කොළේද.

---

* ප්‍රසිද්ධ සුරන් යදිමින් පොත්,

381 දිසි ගඟුලැල් ලේය කෙළ සිසිලැ ල් ලේයා
තුරුසෙවනැල් ලේය මදපව නැ ල් ලේයා
තුඹ සහ වැල් ලේය මල්පෙති හි ල් ලේයා
උත් මට ලොල් ලේය දූත් ලතැවු ල් ලේයා

382 උපුල් කඬාගෙණ කණලා සුපු ල් වන
ලකල් කුසුම්දම්කරලා එක ල් වන
නිමල් මෙනුඹ සහ විඳිනැප විපු ල් වන
සිගිල් සෙවන උත් මව මේ තැවු ල් වන

383 සඳුන් අරවු බිඳ හලගා කල ල් වන
හඳුන් අඹුකපුරලා එහි සිගි ල් වන
එඳුන් ගනිත් සමගත්විඳ මගු ල් වන
වැදුන් අපට අද මේ කිම තැවු ල් වන

---

381 සිගිලැල්ලේයා, සිගිල්ගුණය ඇත්තාවූ; ගඟුලැල්ලේය, ගංගාතිර්ඨායන්ගෙන් දෘශ්‍යමානවූ; මදපවනැල්ලේයා, මන්දමාරුතයෙන් යුක්තවූ; තුරුසෙවනැල්ලේය, වෘක්ෂච්ඡායාවන්හි; මල්පෙතිහිල්ලේයා, පුෂ්පපත්‍රයන් ආස්තරණයකොට ඇති; වැල්ලේයා, වාලුකාස්ථලයන්හි; තුඹසහ, තුඹවහන්සේසමග; ලොල්ලේයා ආශාවෙන්; කෙළ, ක්‍රීඩාකරමින්; උත්, උන්නාවූ; මට, මාහට; දූත්, මේකාලයෙහි; ලතැවුල්ලේයා, චින්තාසන්තාපයෙක්වූයේය; (සිතෙහි තැවුලියක් වූයේය යනු භාවයි)

382 සුපුල්වන, මනාත්ප්‍රඵුල්ලවූ; (මනාවපිපුනාවූ) උපුල්, උත්පලයන්; (මානිල්) කඬාගෙණ, නෙලානිමින්; කණලා, කණිවයන්හි බහා; එකල්වන, තත්කාලයෙහි ප්‍රබුද්ධවූ; (එවේලෙහි පිපුනාවූ) ලකල්, අලඞ්කාරවූ; කුසුම්දම්, මාලාදාමයන්; කරලා, ග්‍රීවායන්හි කොට; නිමල්, නිර්මලවූ; මෙනුඹසහ, මේ නුඹවහන්සේගා සමග; විපුල්වන, ඉතාවිශාලසේ; විඳිනැප, සුව අනුභවකරමින්; සිගිල් සෙවනලුත්, සිගිල්සෙවනෙහි උන්නාවූ; මට, මාහට; මේතැවුල්වන, මේ තැවිල්ලක්වූයේය.

383 සඳුන්අරවු, චන්දනසාරයන්; බිඳ, හැනාකොට; (කඩා) කලල්වන, මඩමෙන්වනතුරු; හලගා, පාෂාණයෙක්හි ඝර්ෂණයකොට; (හලකා අතුල්ලා) එහි, ඒචන්දනකල්කයෙහි; සිගිල්වන, (වැඩියක්) සීතලවනුපිණිස; හඳුන්, හඳුනිතවූ; අඹුකපුරලා, අඹුකර්පූරයන්බහා; එඳුන්ගනිත්, ඒ චන්දනකල්කයෙන් ගාත්‍රයන්; මඟුල්වන, මංගලසම්මතවූ; සමගත්විඳ, පඤ්චකාමානුභවයකොට; වැදුලුත්, (එතැනට) වැදුලුන්නාවූ; අපට, අපහටදෙදෙනාහට; අද, අද දිනයෙහි; තැවුල්වන, චින්තාසන්තාපයක්වූයේය; කිම, කෙසේද (අහේතුක කම්යෙක්ද)

384 *නිදුකින් සමග පෙම්බැඳ සැපවිඳ සො දිනේ
බයකින් විතර වෙනසක් නොව ඉදින දිනේ
දියකින් නැගුණු ගින්නක්මෙන්, වීය මෙ දිනේ
ඉතිකින් කෙසේ වෑවෙම්දෝ හිමි ස දිනේ

385. ගමන සුවඳ සිසිලස ලිය මඹුලු වලා
ගිමන නිබඳ සතපා උනිමු ලොබ වලා
†එවන මෙසඳ තැවිලිය ලැව් ගිනි සෙ වලා
කුමන සැපද විත්දෝ හිමි සමග වලා

386 සුද්දේ උබයකුල ශුද්ධඅග පසි ද්දේ
වද්දේ විනාශනොකරති ලොව නොව ද්දේ
බැද්දේ ඇවිදිනා දඩයමෙහි එ ද්දේ
වෑද්දේ කීයනු මිස මොහු රජකු ව ද්දේ

---

384 නිදුකින්, දුකක් නැතිව; සමග, සාමග්‍රියෙන් යුක්තව; පෙම්බැඳ, ප්‍රෙමබන්ධනයකොට; සොදිනේ, මනාකොට; සැපවිඳ, පස්කම්සුව වලඳමින්; බයකින් විතර, වචනයකින් පමණවත්; වෙනසක් නොව, අන්‍යථාභාවයක් නැතිව; (නොවෙනස්ව) නදිනේ, චිත්ත සන්තානයෙන්; ඉද, වාසයකලාවූ අපහට; මෙදිනේ, දූන්; දියකින් නැගුණ, ජලයෙන් උත්ගතවූ; ගින්නක්මෙන්, වන්නියක්පරිද්දෙන්; වීය, වූයේය; හිමිසඳිනේ, ස්වාමීන්ද්‍රයාණෙනි; ඉතිකින්, ඉන් ඔබ්බෙහි; කෙසේ, කවරාකාරයකින්; වෑවෙම්දෝ, හැනැසී ඉන්නෙම්ද.

385 ලියමඹුලුවලා, ලතාමණ්ඩපයන්කෙරෙන්; සිසිලස, සිසිල් ගුණය ඇතිකරමින්; ගමනසුවඳ, වහනයවන්නාවූ සුගන්ධයෙන්; නිබඳ, නිරන්තරයෙන්; ගිමන, ග්‍රීෂ්මය; සතපා, සන්තර්පණයකොට; ලොබවලා, ආසාකොටලා; උනිමු, උන්නම්හ; එවන, එසේවූවනය; මෙසඳ, මෙකල්හි; ලැව්ගිනිසෙවලා, දවාගිනියක්මෙන්ව; තැවිලිය, තැවුල්ඇතිවීය; (චිත්තසන්තාපඇතිවිය) හිමි, ස්වාමීනි; සමගවලා, සාමග්‍රියෙන් යුක්තවලා; විත්දෝ, අනුභවකොළේ; කුමනසැපද, කිනම සුවයක්ද.

386 පසිද්දේ, ප්‍රසිද්ධවූ; සුද්දේ උබයකුල ශුද්ධඅග, උභයකුල පරිශුද්ධවූ රජතුමූ; ලොව, ලෝවැසියාහට; වද්දේවිනා, වැරැද්දක් මුත්; නොවද්දේ, නිරවද්‍යවූ දෙයක් යම් නොකරති, නොකරන්මය; බැද්දේඇවිදිනා, වනයෙහි ඇවිදින්නාවූ; දඩයමෙහි, දඩයම් කිරීමෙහි කෲරවූ දගත් ඇති නොනොත් ලොමහාබිඩු; මොහු, මේ රජයාහට; වෑද්දේකියනු මිස, ව්‍යාධයෙක්යයි කියනුවිනා; රජකුවද්දේ. රාජයෙක්තම්වන්නේද; (නොවන්නේයනු භාවයි)

---

*එදනිහිතේ, එදසෙබන. කියා නකාරය අනතුවද පෙනේ පොත්

†එවනනිබඳ. පොත් මනනදිනේයනු තදිනී.කියාත් පොත්.

387 නොවී දුකක් සම්හිව ඉඳ මන න දිනේ
පෙ වී මුවනඹර මට නිබඳ නොම දිනේ
නැ වී අද වියෝගින්නෙත් ලමු න දිනේ
ගෙ වී ගියේදෝ ඉරණම හිමි ස දිනේ

388 අඹ දඹ කෙසෙල් පලවැල රසවිඳ නිබ ද
පිඹ වස්කුලල් ලිය ගී කිය කියා සො ද
*සිඹ මුව කමල් දෙදෙනම නිසි ගෙල වැළ ද
නුඹ හැර මෙකල් ලමු සැකසේද හිමි ස ද

389 ලි ය කිඳුරෝ දෙදෙනෙක් වල පෙර දව ස
ඔ ය වතුරෙන් එක රැයකට වෙන්ව වැ ස
සි ය කුල ඇඹුකල උන් සත්සියක් ව ස
†ගි ය පණ හිමි නුඹහැර වැවෙනු කෙලෙ ස

---

387 දුකක්නොවී, නිදුක්ව; මන නඳිනේ, චිත්තානන්දනයෙන්; සම්හිව, එක්ව; ඉඳ, නිසිදනයකොට; නොම්දිනේ, බොහෝවූ; මුවනඹර, මුඛනැමැති තාම්රසයෙකිවූ; මී, මධුන්; නිබඳ, අනුබඳව; පෙවී, පානයකරවිය; අද, අද්‍යකාලයෙහි; වියෝගින්නෙත්, වියොගදුඃඛනැමැති වහ්නියෙන්; ලමු, චිත්තසන්තානය; නැදිනේ, දැඩිව; නැවී, තාපිතවීය; හිමිසඳිනේ, ස්වාමිචන්ද්‍රයාණෙනි; ඉරණම, ශ්‍රීසම්පත්ඇති කාලය; ගෙවීගියේදෝ, ඉක්මගියාද්දෝ.

388 අඹ, අම්බය; දඹ, ජම්බුය; (මාදම්ගෙඩි කිරල) කෙසෙල්, කදලීඵලය; පලවැලරස, පලවැලරසයන්; විඳ, අනුභවකොට; නිබද, නිරන්තරයෙන්; වස්කුලල්, වංශකුලාලයන්; (කලාවිශෙෂ) පිඹ, ධමනයකොට; සොඳ, සුන්දරවූ; ලියගී, ලයාන්විතගීතිකාවන්; කියකියා, කථනයකොටකොට; දෙදෙනම, උභයජනයෝම; නිසි, යොග්‍යාකාරයෙන්; මුවකමල්, මුඛපද්මයන්; සිඹ, චුම්බනයකොට; ගෙලවැළද, ග්‍රීවාලිංගනයකොටගෙණ; හිමිසඳ, ස්වාමිචන්ද්‍රයාණෙනි; නුඹහැර, නුඹවහන්සේගෙන් තොරව; මෙකල්, මේකාලයෙහි; ලමු, චිත්තසන්තානය; සැකසේද, සැනසීම්සවමෙද.

389 වල, වනයෙහිවූ; ලියකිඳුරෝදෙදෙනෙක්, ලතාකින්නරනර දෙදෙනෙක්වූ; පෙරදවස, අතීතයෙහි එක්කාලෙක; ඔය වතුරෙන්, ගංගාප්‍රවාහයෙන්; එකරැයකට, එකාමරාත්‍රියක්; වෙන්ව, වෙන්වී; වැස, වසනයකොට; උන්, උන්නාවූ; සියකුල, ස්වකීය කුලයෙහිවූවන්; සත්සියක්වස, සත්සියයක් මුළුල්ලෙහි; ඇඹුකල, ඇඹුරුකල්හි; පණහිම, ප්‍රාණනාථවූ; හිමි, ස්වාමීනි; නුඹහැර, නුඹවහන්සේගෙන් තොරව; කෙලෙස, කවරාකාරයකින්; වැවෙනු, වැවෙම්දෝ. (නුවැම්දෝ)

---

* සිඹ මුවකමල් දෙදෙනම ගෙල වැළදඉඳ පොත්. †ගියකල මහිමි
ඇර දුන්වැවෙම් කෙලෙස. පොත්.
× දෙසක් නැතුව අතර කාව්‍ය පණයන්ඩ.

390 *වෙසක් නොවී සමගිව සැපවිඳ ඉ න්ඩ
දුසක් ආයුඇත අප සඳකිඳුර න්ඩ
දෙසක් නොවී අතර කවිය මිය ය න්ඩ†
මේසක් නුදුටුකල කියනෙම් කවුරු න්ඩ

391 විගසක කල මදක් පෙර අකුසලෙක් වී ද
අහසක සමුදුරෙක ගිරිලෙණක විසුව ද
×නොවැලක පලදෙතී කී තෙපුල මුනිස ද
අද සැක හලෙම් අත්පිට බොරු නොවන ලෙ ද

392 උ සේ කුලින්කුල බැස නැගෙමින් මෙව ලා§
තෙසේ වඩා කෙළිමින් ඇවිද පෙර ක ලා
මෙ සේ වියෝදුක් උසුලන්ඩවූ ක ලා
කෙසේ තිබෙද්දී හිමිසඳිනි පණ න ලා

---

390 වෙසක්නොවී, අවිභෙධිතව; සමගිව, සාමග්‍රිභාවයෙන්; සැපවිඳ, සුඛ විඳගෙනයකොට; ඉන්ඩ. ජීවත්ව ඉඳීමට; අපසඳකිඳුර න්ඩ, චන්ද්‍රකින්නරජාතියෙහි උපන් අපහට; දුසක්, සහස්‍රයක් ප්‍රමාණවූ; ආයුඇත, ආයුෂයඇත්තේය; දෙසක්නොවී, ස්වකීයම් දෙෂයක් සිඩනොව; අතරක්, අන්තරයෙක්හිදීම; මියයන්ඩවීග, මරණ ප්‍රාප්තවන්ටසිඩවීය; මේ, මේසිඩවූ‍දෙය; සක්, (සහස්‍රවසක්‍රුවූ) සක්‍රයාවන්; නුදුටුකල, දශිනයනොකළ කල්හි; කවුරුන්ඩ, කවරනම් කෙනෙකුන්ට; කියනෙම්, කථනය කරන්නෙම්ද.

391 පෙර, පූර්වජාතියෙහි; විගසකකල, ඉක්මන්ව කරණලද; මදක්, ස්වල්පවූද; අකුසලෙක්විද,අකුශලකර්මයක්විද; (එහිවිපාකය) අහසක, ආකාශයෙහිහෝ; සමුදුරෙක, සමුද්‍රයෙහිහෝ; ගිරිලෙනක, පර්වතගුහාවකහෝ; විසුවද, වාසයකෙලේවී නමුත්; නොවැලක, වැලකීමක් නැතුවම; (එකාන්තයෙන්ම) පලදෙතී, විපාකදෙන්නේය; මුනිසඳ, මුනීන්ද්‍රචන්ද්‍රයන්වහන්සේ; කීතෙපුල, වදාළවචනයක්වේද; (එවචනය) අද, අදම; අත්පිට, අත්පිටම; (ඉදිරියෙහිම) බොරුනොවනලෙද, මෘෂාවාදනොවන ලෙස; සැකහලෙම්, සාකාඳුරු කෙළෙම්.

392 පෙරකල, පූර්වකාලයෙහි; මෙවලා, මේවනයෙහි; උසේ, උස්වූ; කුලින්කුල, පර්වතයෙන් පර්වතයට; බැස, බසිමින්ද; නැගෙමින්, (උඩට) නැගෙමින්ද; තොසේවඩා, තුෂ්ටවර්ධනය කොටලා; කෙළිමින්, ක්‍රීඩනයකරමින්; ඇවිද, ඇවිද්දවූමාහට; මෙසේ, මෙයාකාරවූ; වියෝදුක්, (සැමියාගෙන්වෙන්ව වසිමයයිකියනලද) වියෝග දුඃඛය; උසුලන්ඩවූකලා, උද්වහනයට සිඩවූකල්හි; හිමිසඳිනි, සවාමිඋත්තමයානෙනි; පණනලා, ජීවිතය; කෙසේ තිබේද්ද, කොයිලෙස කින් පවතීද්ද.

---

*වෙසක්නැතුව සමගිව සැපවිඳ ඉන්ඩ. පොත්. †සිදුසක්නැතුව අතරකවිය පණයන්ඩ. × නොවී සැකපල දෙතී. පොත්.
§ නැගෙමින් තොබලා. පොත්.

393 ලපසඳ ලෙසින් වෙන්නොව ඉඳ සමග වලා
හැමසඳ කෙළින සෙවනැලි ලියඹුලු වලා
*සිඹිසඳ නුදුටුකල එකතැනකුත් මෙ වලා
කෙලෙසඳ මසිතු වැවෙනු කියවත නි වලා

394 අතක් බෝසතුන් ලෙහි තබමින් විම සා
මදක් සැළි සැළී පණනල තිබෙන නි සා
පසක් තෙදැති දෙවියන් යදිමින් තොල සා
නැතක් කන්නලව් බස් තෙපලයි මෙලෙ සා

395 පැයකුත් වියෝවක්නු අප දෙන්නා ට
බලවත් වියෝදුක්විය කියනෙම් කා ට
†මැදහත් වෙමින් සිටිනා ලොව දනයා ට
මිහිකත් තමා නොවේද පිහිටක් මී ට

393 ලපසඳලෙසින්, සසල ලාඤ්ඡනයහා චන්ද්‍රයාමෙන්; සමගවලා, සාමග්‍රියෙන් යුක්තව; වෙන්නොව, වියොනොව; ඉඳ, නිසීදනය කොට; සෙවනැලි, ඡායාසම්පන්නවූ; ලියඹුලුවලා, ලතාමණ්ඩල යන්හි; හැමසඳ, සියලුකල්හි; කෙළින, ක්‍රීඩනය කරන්නාවූ; සිඹිසඳ, සඹ.මිඳුනා; මෙවලා, මේවනයෙහි; එකතැනකුත්, එක් ස්ථානයෙක්හිවත්; නුදුටුකල, දර්ශනය නොකලකල්හි; තනිවලා, එකිවවසන්නාවූ; මසිතු, මාගේචිත්තය; කෙලෙසඳ, කවරාකාරය කින් වැවෙනු, ඉවසම්දුයි; කියව, කථනයකරව.

394 බෝසතුන්, මහාසත්වයන්ගේ; ලෙහි, හෘදයෙහි; අතක් තබමින්, අතතබා; විමසා, විමංසනයකොට; මදක්, ස්වල්පයක්; සැළි සැළී, කම්පාවෙවී; පණනල, ප්‍රාණය; තිබෙනනිසා, තිබෙන බැවින්; පසක්තෙදැති, ප්‍රත්‍යක්ෂතේජස්ඇත්තාවූ; දෙවියන්, දෙවතාවන්ට; තොලසා, වසා; යදිමින්, යාඥාකරමින්; නැතක් කන්නලව්බස්, අනේක යාඥාවන්ගෙන්යුක්තවූ වචනයන්;(ඉල්ලීම්) මෙලෙසා, මෙයාකාරයෙන්; තෙපලයි, කියයි.

395 පැයකුත්, ඝටිකාවක්පමණකුත්; වියෝවක්නු, වියෝග දුඃඛයක්නුනාවූ; අපදෙන්නාට, අපදෙදෙනාහට; බලවත්, දෘඪවූ; වියෝදුක්, වියෝගදුඃඛයක්; (ස්ත්‍රී පුරුෂයන්ගේ වෙන්ව වසීමෙන් හටගන්නා දුක වියෝගදුඃඛයනුමවේ)විය, වූයේය; කාටකියනෙම්, එය කාහට කියම්ද; ලොව, ලෝකයෙහි; මැදහත්වෙමින් සිටිනා, මධ්‍යස්ථ වන්නාවූ; ජනයා, ජනයාහට; මිහිකත්, මහීකාන්තා දේවී; තමා, තොමෝම; මීට, මේවියෝගයට; පිහිටක්නොවේද, ප්‍රතිෂ්ඨාවක් නොවන්නේද.

* සිඹසඳ නුදුටුවෙරින් තැනකමෙවලා. පොත්.
† මැදහත්වෙලාසිටිනා ලොව දනයාට, මැදහත්වසිටිනා ලොව හැම දනයාට. මෙසේ පොත්.

396 ඇ ස ක් සදිසි පියකරු මගෙ හිමි ය න් ඩ
*දෙ ස ක් නැතුව මෙලෙසින් විය මිය ය න් බ
ප ස ක් තෙදැති මැදහත් ඉරිදෙවි ඟ න් ඩ
මි ස ක් බැරිය මෙදුකට පිහිටක් ව න් ඩ

397 †වි ත ර විනම් දුක් උසුලන්ඩ හැකි ව තේ
ස ත ර වරම් දෙවියෝ නුදුටු ඒ අ තේ
×කා ත ර නොයම් මෙතනම ඉඳ විගස කි තේ
ප ත ර කරම් මගෙගුණ ලොවට වෙසෙසි තේ

398 ම න පි ණ මි තේ සුරගණ සමග නිසැ කි තේ
තැ න තැ න වෙතේ තුර තුර වසන නිදු කි තේ
ව න දෙ වි ය නේ මටවූ මේ වියෝ දු කි තේ
සැ න සෙ මි අ තේ තොපගෙන් ලත් පිහිට කි තේ

---

396 ඇසක්සදිසි, අක්ෂියක්වැනිවූ; පියකරු, ප්‍රියඞකරවූ; මගෙහිමියන්ඩ, මාගේ ස්වාමියාහට; දෙසක්නැතුව, කිසියම් දෝෂයක් නොමැතිව; මෙලෙසින්, මෙයාකාරයෙන්; මියයන්ඩවිය, මරණයට පැමිණීමට සිඬවීය; පසක්තෙදැති, ප්‍රත්‍යක්ෂයෙන්ම තෙජස් ඇත්තාවූ; මැදහත්, (සියල්ලවුන් කෙරෙහි) මධ්‍යස්තවූ; ඉරිදෙවියන්ඩ මිසක්, සූර්‍ය්‍යදිව්‍යරාජයාට විනා; මෙදුකට, මේදුඃඛයට; පිහිටක්වන්ඩ, ප්‍රතිෂ්ඨාවක්වීමට; බැරිය, (අන්‍යවූවක්හට) නොහැක්කේය.

397 විතරවිනම්, ප්‍රමාණයකටවත් වූයේනම්; දුක්, මේ වියෝග දුඃඛයන්; උසුලන්ඩ, ඉසිලීමට; හැකිවේතේ, හැකිවන්නේය; ඒ, එබව; සතරවරම්දෙවියෝ, චාතුර්මහාරාජික දෙවියෝවත්; නුදුටුද, දකිනය නොහැකිහුද; අතේ, ඛෙදයකි; කාතරනොයම්, දුරස්ථානයකට නොයන්නෙමි; මෙතනම, මේස්ථානයෙහිම; ඉඳ, නිසීදනය කොට; විගසකිතේ, වහාම; මගෙගුණ, මාගේගුණයන්; ලොවට, ලෝකයාහට; වෙසෙසිතේ, විශෙෂයෙන්ම; පතරකරම්, ප්‍රසිඬකරන්නෙමි.

398 මනපිණමිතේ, චිත්තපිණනයව; සුරගණසමග, දිව්‍යාංගනාවන්හා; නිසැකිතේ, සැකරහිතව; වෙතේ, වනයෙහි; තැනතැන, ඒඒ තන්හි; නිදුකිතේ, නිදුක්ව; තුරතුර, වෘක්ෂයක්පාසා; වසන, වාසයකරන්නාවූ; වනදෙවියනේ, වනදෙවතාවරුනි; මටවූ, මාහටසිඬවූ; මේවියෝදුකිතේ, මේ වියෝගදුඃඛයෙන්; තොපගෙන් ලත්, ඔබවහන්සේලාගෙන් ලබනලද; පිහිටකිතේ, ප්‍රතිෂ්ඨාවකින්; සැනසෙමි, සැනසී ඉන්නෙමිද; අතේ, ඛෙදයකි.

---

* දෙසක් නැතුව අතර කාව්‍ය පංක්තියන්ඩ පොත්.
† දුක්උසුලන්ඩ බැරිඅතේ. පොත්.
× සතරවරම්දෙවියෝ නුදුටුඒනැතේ. පොත්; හැකිවේතේ.

399 රතේ රසමෙතේ දවසැර පෙර දව සේ
සෙතේ වඩම්තේ පැසී රසපග සේ
වෙතේ නොමදීතේ දුක්වූකල මෙලෙ සේ
අතේ දෙවියතේ සැනහෙම් දූත් කෙලෙ සේ

400 සුරගණ සදිසි වරගණ ඇතුව තම පු ර
අපගණ සවග වැස සැපවිඳිම්හි නිත ර
සිතමිණ මහිමිාවිද මැරුවා දූක මෙව ර
බියගෙණ ගියේදෝ දෙවියෝ-මෙවන හැ ර

401 වහසිත් නෙත් කඳුලු හැලි නොනවති ත් තේ
මෙලෙසින් විඳින දුක් හැරියොත් මෙතැ ත් තේ
*අහසිත් යනෙන නත්සිඳු විදු දර ත් තේ
†වෙනෙසින් මෙහිම ඇතිබව මින් දූනෙ ත් තේ

---

399 පෙරදවස, අතීතකාලයෙහි; රතේරසමෙතේ, සවර්ණාභාපාරදයමෙන්; (රසදියමෙන්) දවසැර, දිවශාන්ක්‍රමනයකොට; රස, පස්කම්රසයගුන් යුක්තවූ; පගසේ, සපම්යෙන්; සෙතේ වඩම්තේ, සෙතනය වඩිනයකොට; පැසී, එක්ව; වෙතේ, චිත්තයෙහි; නොමදීතේ, නොබැහවීත්; මෙලෙසෙ, මෙයාකාරයෙන්; දුක්වූකල, දුක් ඇතිවූකල්හි; දෙවියතේ, දෙවතාවරුනි; දූත්, මේ කාලයෙහි; කෙලෙසේ, කවරආකාරයකින්; සැනහෙම්, සැනහෙම්ද; අතේ, ඛේදයකි.

400 තමපුර, සවකීයනගරයෙහි; සුරගණසදිසි, දෙවගණන් වැනිවූ; ‡වරගණ, වරගුණාවත්; (කුලජාතීන්) ඇතිවත්, විද්‍යමාන වූන්; අපගණ, (තිරිසන්ජාතිකවූ) අශ්වත්හු ග්‍රහණයකොට; සවග වැස, එක්වවාගයකොට; නිතර, නිරන්තරවම; සැපවිඳිම්හි, (පස්කම) සුවවිඳිමැයි; සිතමිණ, චින්තනයකරමින්; මෙවර, මේකාලයෙහි; මහිමි, මාගේස්වාමියා; විද, ව්‍යාධනයකොට; මැරුවා, ඝාතනයකළා; දූක, දූශ්‍රිතයකොට; දෙවියෝ, දෙවතාවෝතුමු; මෙවනහැර, මේවනය වර්ජනයකොට; බියගෙණ, භයටපැමිණ; ගියේදෝ, (පැන) ගියාහුවත්දෝ

401 වහසිත්නෙත්, වැගිරෙන්නාවූ; කඳුලුහැලි, වාස්පනිර්ඣරයන්; (කඳුලුධාරාවූන්) නොනවතින්නේ, නොවැළකීම; මෙලෙසින්, මෙයාකාරයෙන්; මෙතැන්හේ, මේස්ථානයෙහි; විඳින, අනුභව කරන්නාවූ; දුක්, දුඃඛවේදනාවන්; හැරියොත්, දුරුකෙළේනම්; අහසින්, ආකාශයෙන්; යනෙන, ගමනාගමනයකරන්නාවූ; නත් සිඳුවිදුදරන්නේ, අනෙකවිධවිද්‍යාධරයන්ගේ; වෙනෙසින්, විශේෂයෙන්; මෙහිම, මෙවනයෙහිම; ඇතිබව, විද්‍යමානභාවය; මින්, මේකාරණයෙන්ම; දූනෙනු ඇත්, අවබොධවන්නේය.

---

* නොසසිඳු විදු දරුන්නේ. පොත්. † මහිම්ඇති.

‡ වාරුඛගණ. ශබ්දසඛුදු මින් ඇතහේ. වෙනගණත්වනම්.

402 වැහැරි සිවුරු දරමින් යන එන ගු වන
මි හි රි පලාපල රසවිඳ සා නි වන
එ හි රි ඔතප් යුතු තවසර ඇත මෙ වන
බි හි රි නුවොත් මගෙදුක් නෑසෙද ස වන

403 වෙනසක් නොවී ඉඳ සමගිව සැප විඳු ලා
මන ස ක් තුටුව උන් මට දුක්වනි මෙක ලා
අ ද ස ක් දෙවිඳු මෙවියෝ දුක් නුදුටු ක ලා
ද ග ස ක් නුවන් ලද්දසින් කිම්ද ප ලා

404 පෙර කල් සුජාතාවන් කෙකිතිව උප න
ම න කල් සක්ඉසුරු ගැරවින් මින් *ලෙසි න
හැ ම කල් රකින සිල් විමසා පසසම් න
සු ර කල් කෙළෙ යලිසක්රද තොප විසි න

---

402 වැහැරිසිවුරු, වාකචීවරයන්; දරමින්, ධාරණයකරමින්; ගුවන, ආකාශයෙන්; යනඑන, ගමනාගමනය කරන්නාවූ; මිහිරි පලාපල, රසමධුරවූ ඵලාඵලයන්ගේරසය; (කුඩාමහත්ඵලයන්ගේ) විද, විඳනයකොට; සානිවන, ක්ෂුධාව නිවාපණය කරන්නාවූ; හිරිඔතප්යුතු, ලජ්ජාභයදෙකින්යුක්තවූ; එතවසර, ඒතපෝවාරිහුද; මෙවන, මේවනයෙහි; ඇත, ඇත්තාහ; බිහිරිනුවොත්, බධිරීනුවූවාහු නම්: මගෙදුක්, මාගේ දුඃඛසංඛ්‍යාතවචනයන්; සවණ, කන්වලට; නෑසෙද, ශ්‍රවණය නොවන්නේද.

403 සමගිව, සාමග්‍රියෙන්යුක්තව; ඉඳ, නිසීදනයකොට; විඳුලා සැප, මහත්වූසම්පත් අනුභවයෙන්; මනසක්, මනොචක්ෂුන්; තුටුව, තුටුකරමින්; උන්, උන්නාවූ; මට, මාහට; මෙකලා, මේකාලයෙහි; දුක්, (බලවත්) දුඃඛයෙක්; වනි, වැදුණේය; අද, මේකාලයෙහි; සක්දෙවිඳු, ශක්‍රදෙවේන්ද්‍රතෙම; මෙවියෝදුක්, මේවියොගදුඃඛය; නුදුටුකලා, දර්ශනයනොකලකල්හි; දගසක්නුවන් ලද්දෙසින්; සහස්‍රනයන ප්‍රතිලාභයාගේ; කිම්දපලා, කිනම් ඵලයෙක්ද.

404 පෙරකල්, පූර්වයෙහි එක්කලෙක; සුජාතාවන්, (සක්දෙවිඳුගේ පෙර අඹුවවූ සුජාතාව; කෙකිතවඋපන, කණකොකියක්ව උපන්කල්හි; මනකලා, මනොඥවූ; සක්ඉසුරු, ශක්‍රඓශ්චර්යය; හැර, විජහනයකොටලා; මින්ලෙසින, මත්ස්‍යයෙකුමෙන්; ඇවිත්, ආගමනයකොට; හැමකල්රකින, සියලුකාලයෙහිරක්ෂාකරන්නාවූ; සිල්විමසා, සීලයපරීක්ෂාකොටලා; පසසම්ණ, ප්‍රශංසාකොට; සක්රද, ශක්‍රරාජයා; යලි, නැවතත්; සුරකල්කෙළේ, සුරංගනාවක් කරණලද්දේත්; තොපවිසින, නුඹවහන්සේවිසින්ම නොවේද.

---

* මින්වෙසින වූවානම් වඩා මැනව. එසෙත් හැමපොත්වලම මෙසේම තිබුනනිසා වෙනස් නොකලෙමු.

405 එ බැ වි න් මහත් කුළුණෙන් පසිදු සක් ර ද
වෙසෙ සි න් පිහිටවන අය නොප මිසක් කො ද
නොල සි න් මසිත දෙවමින් සන්තොසක් අ ද
මෙ දු සි න් සැනසෙන්ඩ කිය උපදෙසක් සො ද

406 වි දි නා විරහදුක් බලවත්වූ ස දින*
ය දි නා කිඳුරඟණ ගුණ බලයෙන් සෙ දින
ඉ දි නා සැපපහස ලැබ සුරරජ සො දින
න දි නා උණුවගියෙ පඩුපුල්සල එ දින

407 අතැඹු ල් ලෙස සියල් දනුමෙහි මින තා න් ද
දසැඹු ල් බව ලබන කෙනෙකුත් මහිමෙ න් ද
සුහුඹු ල් මගෙ සැපත අතිකෙක් පැතුමෙ න් ද
පඩු පු ල් අස්න උණුවු කාරණ කි න් ද

---

405 එබැවින්, එසේහාවයෙන්; මහත්කුළුණෙන්, මහත්වූ කරුණාවෙන්; පසිදු, ප්‍රසිඩවූ; සක්රජ, ශක්‍රරාජයානෙනි; වෙසෙසින්, විශෙෂයෙන්; පිහිටවනඅය, ප්‍රතිෂ්ඨාවක්වන්නාහුනම්; මෙනොපමිසක්, මෙයුෂ්මතුන්වහන්සේලාහැර; කොද, අන්කවරෙක්ද; අද, අද්‍යකාලයෙහි; නොලසින්, වහා; මසිත, මාගේ චිත්තයට; සන්තොසක්, සන්තොෂයක්; දෙවමින්, දනයකරවමින්; මෙදුසින්, මේදුඃඛයෙන්; සැනසෙන්ඩ, සැනසීමට; සොද, සුන්දරවූ; උපදෙසක්, උපදෙශයක්; කිය, කථනයකළමැනව.

406 විදිනා, විඳනයකරන්නාවූ; විරහදුක්, විප්‍රයොගදුඃඛය; බලවත්වූසදින, දසවුකල්හි; යදිනා, යාඥකරන්නාවූ; කිඳුරඟණ, කින්නරාංගණාවගේ; ගුණබලයෙන්, ගුණානුභාවයෙන්; සෙදින, එහා; සුරරජ, ශක්‍රදෙවෙන්ද්‍රතෙම; සොදින, යහපත්වූ සැපපහස් ලැබ, සුඛස්පර්ශලාභීව; ඉදිනා, නිසීදනයකරන්නාවූ; පඩුපුල්සල, පාණ්ඩුකම්බලශෛලාසනය; එදින, තත්දිනයෙහි; නදිනා, සබඳව; උණුවගියෙ, උෂ්ණාකාරවිගියේය.

407 අතැඹුල්ලෙස, හස්තාමලකයක්මෙන්; (අතටගත් නෙල්ලි ඵලයක්මෙන්දෙශයෝ නොමහාත් දර්ශන මිණිරුවණක්මෙන්) සියල් දනුමෙහි, සකල ධර්මයන් අවබොධයෙහි; මිනතාන්ද, මනොනන්දනීයවූ; දසැඹුල්බව ලබන කෙනෙකුත්, දසබලධාරී බුද්ධත්වයලබන්නෙනකුගේ; මහිමෙන්ද, මහිමතාවයෙන්දෝහෝ; (නොහොත්) සුහුඹුල්, තරුණවූ නොහොත් මහත්වූ; මගෙසැපත, මාගේ (පඤ්චකාම) සම්පත්තිය; අතිකෙක්, අන්කෙනෙක්; පැතුමෙන්ද, ප්‍රාර්ථනාකළහෙයින්දෝ; පඬුපුල්අස්න, පාණ්ඩුකම්බලසිලාසනය; උණුවූකාරණ, උෂ්ණවීමටහේතු; කින්ද, කවරේදෝහෝයි.

---

සදිනායනු. යදිනාකියා ආකාරනනවද පෙනේ.

408 ද ස ස ක්  නුවණැසින් බලමින් ලොව සොදි  න
ඇගෙදුක්  ඇසිල්ලෙක දුක බමුණෙකු ලෙසි  න
පි හි ට ක්  වන ලෙසින් ඇවිදින් සුරපුරෙ  න
බැ ස ස ක්  රද එසඳ සඳ පව්වට යෙහෙ  න

409 දී ය ගෙ න  කොත්ඩියෙන් මහබෝසතුන් වෙ  ර
ඉ සි මි න  වණය සුවකෙළෙ කැලල නැති ක  ර
වෙහෙස න  ලෙස අනුන් මලවස් ගෙණම ති  ර
නැ ගි ටි න  එකකුමෙන් බෝසත් නැගිටි ව  ර

410 එසඳ පුවප  ත් වූ
එහිමි දුක බලව  ත් වූ
සොම්නසිනි ම  ත් වූ
කියයි කිඳුරඟණ සිරිම  ත් වූ

---

408 දසසක් නුවණැසින්, සහස්‍රසංඛ්‍යාතප්‍රඥාචක්ෂුසින්; ලොව, ලොකය; සොදින, මනාකොට; බලමින්, අවලොකනයකොට; ඇගෙදුක්, ඇගේදුඃඛයන්; ඇසිල්ලෙක, එඇසිල්ලෙහි; දුක, දශීනයකොට; බමුණෙකු ලෙසින, බ්‍රාහමණයකුමෙන්; පිහිටක්වනලෙසින්, ප්‍රතිෂ්ඨාවක්වනපරිද්දෙන්; සුරපුරෙන, දෙව්ලොවෙහෙරෙන්; ඇවිදින, ආගමනයකොට; එසඳ, එකල්හි; සක්රද, ශක්‍රදෙවෙන්ද්‍ර තෙම; සඳපව්වට, චන්ද්‍රනම් පර්වතයට; යෙහෙන, නිදුකින්; බැස, අවතීණීව.

409 කොත්ඩියෙන්, කුණ්ඩිකාවෙන්; දියගෙණ, උදකග්‍රහණය කොට; මහබෝසතුන්, මහාබොධිසත්වයන්ගේ; වෙර, ශරීරයෙහි; ඉසිමිණ, සෙවනයකරමින්; කැළලනැතිකර, කැළලපවානැතිකොට; වණය, ව්‍රණය; සුවකෙළේ, සුවපත්කෙළේය; අනුන්, අන්‍යයන්; වෙහෙසනලෙස, විහෙඨනයකරණපරිද්දෙන්; තිර, ස්ථිරව; මලවෙස් ගෙණම, මාතවෙසග්‍රහණයකොටසිට; නැගිටිනඑකෙකුමෙන්, නැගී සිටින්නෙකුමෙන්; බෝසත්, මහාසත්වතෙම; නැගිටිවර, නැගීසිටිය කල්හි.

410 එසඳ, එකල්හි; සුවපත්වූ, සුඛිතභාවයට පැමිනියාවූ; එහිමි, ඒස්වාමියා; දුක, දශීනයකොට; බලවත්වූ, දෘඪවූ; සොම්නසින්, සෞමනස්‍යයෙන්; මත්වූ, මත්තභාවයටපැමිණියාවූ; සිරිමත්වූ, ශ්‍රීමත්වූ; කිඳුරඟණ, කින්නරාංගනාව; කියයි, (මෙසේ) කථනයකෙරෙයි.

411 සුරරදිනි තුඹ අ ද
දුකවපත් මගෙ හිමි ස ද
අමාපැන් ඉස සෙ ද
කෙලේ සුවපත් කුසල් අත්බැ ද

| 412 | | 413 | |
|---|---|---|---|
| හිමි සමග බෝ ක | ල් | ලෙහි මගෙ වියෝ ගි | නී |
| සැපවිඳ ඉඳිම් මන ක | ල් | නැගේනම් තිදසග ග | නී |
| නිවන් දකිනා ක | ල් | බව නාලොවද ග | නී |
| සුරිඳු සඳ ඇත තුඹට මෙකුස | ල් | *නිවීගියෙ තුඹෙකුළුණුමින් දූ | නී |

414 කියා කිඳුරග නා
තබා සිරිපද මුදු නා
වඳිමින් සුරිඳු නා
සිටින හිමිසමග සත්තොසි නා

---

411 සුරරදිනි, දිව්‍යරාජයාණෙනි; තුඹ, තුඹවහන්සේ; අද, අද දිනයෙහි; දුකවපත්වූ, දුඃඛයට පැමිණියාවූ; මගෙ හිමිසඳ, මාගේස්වාමිපුත්‍රයාහට; අමාපැන්, අමෘත ජලය; ඉස, සිංචනයකොට; සෙද, වනා; අත්බැඳ, ස්වකීයආත්මභාවය පිළිබඳව; කුසල්, පින් පිණිස; සුවපත්කෙළේ, සුඛප්‍රාප්තකෙළේය.

412 හිමිසමග, ස්වාමියාහා එක්ව; බෝකල්, බොහෝකාලයක් මුලුල්ලෙහි; මනකල, මනොකල්‍යවූ; සැපවිඳ, සුඛ විඳිනය කොට; ඉඳිම්, නිසීදනයකරමි; සුරිඳුසඳ, සුරෙන්ද්‍රය; තුඹට, තුඹ වහන්සේට; මෙකුසල්, මේකුසලය; නිවන්දකිනාකල්. නිර්වාණාව බෝධය කරණතුරුම; ඇත, ඇත්තේය.

413 මගෙ, මාගේ; ලෙහි, හෘදයඅභ්‍යන්තරයෙහිවූ; වියෝගිනි. වියොග නැමති ගින්න; නැගේනම්, උද්ගතවේනම්; තිදසග, ත්‍රිදශාග්‍රය; ගනී, ග්‍රහණයකෙරේ; බව, අධොභාගයට බටුයේනම්; නාලොවද, නාගලොකයද; ගණී ග්‍රහණයකෙරේ; (එබඳු වියොග අග්නිය) නිවීගියෙ, නිර්වාපනයට ගියේය; තුඹෙකුළුණු තුඹවහන් සේගේ කරුණාව; මින් මෙයින්; දූනී, අවබොධවීය.

414 කිඳුරඟණ, කින්නරාංගණාව; කියා, (මෙසේ) කථනය කොට; සිරිපද, ශ්‍රීපාදයුගලයෙහි; මුදුනා, මස්තකය; තබා, ස්ථාපනයකොටලා; සුරිඳුනා සුරෙන්ද්‍රයාහට; වඳිමින්, නමස්කාරකොට; හිමිසමග, ස්වාමියාහා; සත්තොසිනා, සන්තොෂයෙන්; සිටිය, සිටියකල්හි.

---

* නිවීගිය මගෙ කුළුණුසිත් ගිනි. පොත්.

415 සක්දෙව්දු විසි නා
ජීවත්ව නොපි දෙදෙ නා
ඉඳුව ගිරි මුදු නා
*නොයව් තැනකට මෙවක් පව නා

416

අවවාද සොඳි නා
සිතතුල තබන ලෙදි නා
කියමින් නොලසි නා
ගියේ යලි සුරපුරට එදි නා

417

නරන් නිති සර නා
විනයට නොබැස නොදු නා
සිහිඇතිව සොඳි නා
සමග වාසයකරව් යෙහෙ නා

418 කිම්සඳිනි මෙව නා
උවදුරු බෝය නිති නා
ඉන් නොසිට මෙව්† නා
යමුව සඳපව්වටම දෙදෙ නා

---

415 සක්දෙව්දුවිසිනා, ශක්‍රදෙවේන්‍ද්‍රයාවිසින්; නොපිදෙදෙනා, යුෂ්මත්හුදෙදෙනා; ජීවත්ව, බොහෝකලක් ජීවත්වී; ගිරිමුදුනා, පර්වත මස්තකයෙහිම; ඉඳුව, නිසීදනයකරව; මෙවක්පවනා, මේ දිනයෙහිපටන්; තැනකට, අන්‍යකිසිස්ථානයකට; නොයව්, ගමනය නොකරව්යයි.

416 සොඳිනා, යහපත්වූ; අවවාද, ඔවාබස්; සිතතුල, චිත්තාභ්‍යන්තරයෙහි; තබනලෙදිනා, තබන පරිද්දෙන්; නොලසිනා, වහා; කියමින්, කථනයකරමින්; එදිනා, ඒදිනයෙහි; යලි, නැවත; සුරපුරට, දිව්‍යලොකයටම; ගියේ, ගමනයකෙළේය.

417 නිති, නිත්‍යයෙන්; නරන්සරනා, මනුෂ්‍යයන් සංඛාරණය කරන්නාවූ; නොදුනා, අඥානනයකොට; විනයට, විනාන්තරය කට; නොබැස, අවතීර්ණනොව; සොඳිනා, යහපත්ව; සිහිඇතිව, සමෘතිමත්ව; යෙහෙනා, යහපත්ව; සමග, එක්ව; වාසයකරව්, වාසයකරව්යයි.

418 කිම්සඳිනි, ස්වාමිඋත්තමයාණෙනි; මෙවනා, මේවනයෙහි; නිතිනා, නිත්‍යයෙන්ම; උවදුරුබෝය, බොහෝ උපද්‍රව ඇත්තේය; ඉන්, එසේහෙයින්; මෙවනා, මේවනයෙහි; නොසිට, වාසයනොකොට; දෙදෙනා, අපදෙදෙනාම; සඳපව්වටම, එනම් පර්වතයටම; යමුව, ගමනයකරමුයයි.

---

* මෙතැන් පටනා. † ඉඳිවූ සොඳිනා පොත්.

419 ගං තිස්වල ම නා
මල් රොන් රැගෙණ තෙවු නා
දියවලෙක බැස නා
රුකක්යට කෙළඇවිද සොබ නා

420
සමගව හැමදි නා
ලපසඳ ලෙසින් සොඳි නා
සැපවිඳ නොමඳි නා
ඉන්වතැන් එමය තිමි සඳි නා

421
තියමින් එම දි නා
වියොවුන්බ නිති වි දි නා
මන්මදහට දි නා
ඉන් නලෙස බෝකලක් නදි නා

422 පෙර විසූ ලෙ සි නා
කාරණ නොයෙක වි සි නා
එපවි කිස නො සි නා *
කලක්සැපවිඳ ඉඳිමු ය සි නා †

419 මනා, මනොහරවූ; ගංතිස්වල, ගංගාශ්‍රීයතත්හි; මල්රොන්, පුෂ්පරේනුන්; රැගෙණ, ග්‍රහණයකොට; තෙවුනා, තබලන්නාවූ; දියවලෙක, උදකාවාටයෙක්හි; බැස, බැහැලා; නා, ස්නානය කොට; සොබනා, සොභමානවූ; රුකක්යට, වෘක්ෂයක්හුගේ අධොභාගයෙහි; කෙළ, ක්‍රීඩාකරලා; ඇවිද, ඇවිදිමින්.

420 හැමදිනා, සියලුකාලයෙහි; සමගව, සාමග්‍රියෙන් යුක්තව; ලපසඳලෙසින්, සසලාඤ්ඡනයහා චන්ද්‍රයාමෙන්; සොඳිනා, සුන්දරවූ; නොමඳිනා, අමන්දවූ; සැපවිඳ, සුඛවින්දනයකොට; තිමිසඳිනා, ස්වාමිපුත්‍රයාණෙනි; ඉන්වතැන්, වසීමට ස්ථානයතම්; එමය, ඒ සඳගිරිපව්වයයි:-

421 තියමින්, කථනයකරමින්; වියොවුන්බ, වියෝගයෙක් වසන්නවුන්ට; (ස්වාමිපුරුෂයාගෙන් වෙන්ව වසන්නාවූ ස්ත්‍රීන්ද, ස්ත්‍රීන්ගෙන් වෙන්ව වසන්නාවූ පුරුෂයන්ද යනු,මොහු, ඔවුනොවුනු වියෝගවූවෝවෙති;) නිති, නිරන්තරයෙන්; විදිනා, ශරප්‍රහාර යවන්නාවූ;.මන්මදහට, අනංගයා; දිනා,ජයග්‍රහණයකොට; නදිනා, විත්තපීනනයෙන්; බෝකලක්, බොහෝකාලයක් මුලුල්ලෙහි; ඉන් නලෙස, වාසයකරණපරිද්දෙන්.

422 පෙරවිසූලෙසිනා, පූර්වයෙහිලූ ආකාරයෙන්; නොයෙක කාරණවිසිනා, අනෙකකාරණයෙන් හේතුකොටගෙණ; එපවිකිස, එපව්තගිරියෙහි; නොසිනා, සනෙනාමෙහි; කලක්, කාලයක්; මුලුසැපවිඳ, සුඛඅනුභවකොට; යසිනා, කීර්තියෙන්යුක්තව; ඉඳිමු, වාසයකරමු.

* දෙදෙනම නොලස්නා.
ගිරයෝසඳපව්වටමසොඳිනා-මේකාව නොයක්විධිවලට ඉතාඅනා ලව පෙනේ. අපට වැටහුනුඅන්දමටගෙණ යොදුවෙමු. යාපත් වඩි වලට තිබෙබි ඒවා මෙහි නොයෙදුයෙමු. වෙනනා. නොත්,

423 පෙරකළ පිණ කි නා*
දිවි ලදිමු හිමි සඳි නා
කියමින් නොවදි නා
ගියෝ සඳපව්වටම දෙදෙ නා

424
මහරද මිදි එ ද
බරණැස් නිරිඳු එස ද
දිවසැතියන් මැ ද
පසිදු අනුරුත් තෙරිඳු වේ ද

425
සඳ කිඳුරගණ ර ද
දූත් මෙමනොප යෙහෙලි වේ ද
එදවස් කිඳුරු ර ද
ලොව්තුරා බුදුවූ මම්ම වෙ ද

426 වදරා එස ද
කුළුගත්වා කිඳුරු ද
සතන් සිත පහ ද
දෙසුත් අවසන්කෙළේ මුනි ද

---

423 පෙරකළ, පූර්වයෙහිකරණලද; පිණකිනා, පුණ්‍යයකින්; හිමිසඳිනා, ස්වාමිපුත්‍රයානෙනි; දිවිලදිමු, ජීවිතලද්දෙමෝයයි; නොවදිනා, බෙණෙගව්න්; කියමින්, කථනයකෙරෙමින්; දෙදෙනා, උභයජනයෝතුමු; සඳපව්වටම, එනම් පර්වතයටම; ගියෝ, ගමනයකළෝය.

424 මහරද, (පිය) මහාරාජය; එදා, එකාලයෙහි; මිදි, මිදුනුවූ; එසඳ, එකල්හි; බරණැස්නිරිඳු, බාරානසීරාජනාතම්; දිවස්ඇතියන්මැද, දිව්‍යචක්ෂුර්ලාභීන් මධ්‍යයෙහි; පසිදු, ප්‍රසිඩවූ; අනුරුත් තෙරිඳුවේද, අනුරුඩස්ථවිරෙන්ද්‍රයාවේමයයි.

425 රද, (පිය) මහාරාජය; සඳකිඳුරගණ, චන්ද්‍රකින්නරාංඝනාවනම්; දූත්, මේකාලයෙහි; මෙමනොප, මෙනුම්ඳුගේ; යසෙහෙලිවේද, යශෝධරාවන්නේමය; එදවස්, ඒකාලයෙහි; කිඳුරුරද; කින්නරරාජයාවූයෙම්; ලොව්තුරා බුදුවූ, ලෝකෝත්තරබුඩරාජ්‍යශ්‍රියට පැමිනියාවූ; මම්මවේද, මම්මවෙම්දුයි.

426 එසඳ, එකල්හි; වදරා, දෙසනාකොට; කිඳුරුද, (චන්ද්‍ර) කින්නරජාතකය; කුළුගත්වා, කූටග්‍රහණකොටලා; සතන්, සත්වයන්ගේ; සිත, චිත්තය; පහද, ප්‍රසන්නාකරවදරා; මුනිඳ, මුනීන්ද්‍රයන්වහන්සේ; දෙසුත්, (චන්ද්‍රකින්නරජාතක) දෙශනාව; අවසන්කෙළේ, අවසානකර වදාළසේක.

---

* මේකව අපටලැබුනපොත්වලින් එකකපමණක් ඉතා ආකූලව තිබුනා හැකිනාක් පිළිවෙල කොළෙමු.

427 මෙදහම් අනුහ සි න්
උවදුරු නසා තොල සි න්
සිතපිරි සන්තො සි න්
මෙලොව නිතිවිද ඉසුරුවෙසෙ සි න්

428
එළුවෙන් කී සපි රි
මෙදහම් අසා සුබසි රි
සව්සත් හැර දුසි රි
ලබත්වා මතු සගපවග සි රි

429
කුසල් පිණිස කී
මෙකව් සාරසියය කී
යලි පස්විස්ස කී
සිතැඟි සිදුකරණ සිතුමිණ කී

430 *රන්ගිරි සිරි අස ල
මල්රමින් යුත් මතක ල
තුන්බෝ සැදි විපු ල
පසිදු දෙනගමුවෙහෙර හැමක ල

---

427 මෙදහම්, මේ (වඤ්කිනතජාතක දෙශනාව නැමැති) ධර්මයාගේ; අනුහසින්, ආනුභාවයෙන්; තොලසින්, වහා; උවදුරු, උපද්‍රවයන්; නසා, දුරුකොට; සිත, චිත්තයාගේ; පිරි, පිරුණාවූ; සන්තොසින්, සන්තොෂයෙන්; මෙලොව, මේලෝකයෙහි; වෙසෙසින්, විශේෂයෙන්; නිති, නිත්‍යයෙන්; ඉසුරුවිඳ, ඓශ්චර්ය්‍ය විඳනයකොට.

428 එළුවෙන්, සිංහලභාෂාවෙන්; කී, කථනය කරණලද; සපිරි, සම්පූර්ණවූ; සුබසිරි අභිවෘද්ධිවූ; මෙදහම්, මේධර්මය; අසා, ශ්‍රවණයකොට; සව්සත්, සකලසත්ත්වයෝතුමූ; දුසිරි, දුශ්චරිතයන්; හැර, දුරුකොට; මතු, අනාගතකාලයෙහි; සගපවගසිරි, ස්වර්ගාපවර්ගශ්‍රීය; ලබත්වා, ප්‍රතිලාභය කෙරෙත්වා.

429 කුසල්පිණිස, පින්සඳහා; කී, කියනලද්දාවූ; මෙකව්, මේ කාව්‍යයත්; සාරසියයකි, චතුර්ශතයක් ප්‍රමාණද; යලි, නැවත; පස්විස්සක්, පංචවිංශතියක්දවෙති; (ඒකාව්‍යය) සිතැඟි, සිතෙහි අභිප්‍රාව; සිදුකරණ, සිද්ධකරන්නාවූ; සිතුමිණකි, චින්තාමාණික්‍යරත්නයක්ද වැනිවෙයි.

430 රන්ගිරි, ස්වර්ණපර්වතරාජයාගේ; සිරි, ශොභාව; අසල, සමීපස්ථාවූ; මල්රමින්, පුෂ්පාරාමයන්ගෙන්; යුත්, යුක්තවූ; තුන්බෝ, (ශාරීරිකාදි) ත්‍රිවිධබෝධීන්; සැදි, සර්ජිතවූ; විපුල, මහත්වූ; පසිද්ධ, ප්‍රසිද්ධවූ; දෙනගමුවෙහෙර, දෙනගමුවිහාරයෙහි; හැමකල, සියලු කාලයෙහි;-

---

* දෙනගමුවෙහෙර මතකල. පොත්

431 432

වසන පිළිවෙත් ස රු පරපුරැති නිකස ලු
*සඟගන සමග පියක රු මහතෙරිඳු විල්ගම් මු ලු
සදහම් දරු ස රු පරවැඩ පිණිස ක ළු
සියල් සතරෙහි සුරඇදුරු යු රු මෙකව් වස්වා දනන් මනදො ළු

මේ ලිව් පින් පු රා
විඳ සව්සැපත් නිතො රා
නොවැද බිය සස රා
මමද බුදුවෙම්වා ලොව්තු රා

---

431 පිළිවෙත්සරු, ප්‍රතිපත්තිසාරවූ; පියකරු, ප්‍රියඞ්කරවූ; සඟගනසමග, සඞ්ඝසමූහයා හා; වසන, වැඩවාසය කරන්නාවූ; සරු, සාරවූ; සදහම්, ශ්‍රීසද්ධර්මය; දරු, ධාරණයකළාවූ; සියල්සතරෙහි, සකල ශාස්ත්‍රයෙහි; සුරඇදුරුයුරු, දේවාචාර්යයාවැනිවූ; (බෘහස්පති.)

432 නිකසල, පවිත්‍රවූ; පරපුරැති, පරම්පරාවක් ඇත්තාවූ; විල්ගම්මුල මහතෙරිඳු, එනම් සඞ්ඝරාජමහාස්ථවිරෙන්ද්‍රයාණන්තෙමේ; පරවැඩපිණිස පරාභිවෘද්ධිය සඳහා; කළ, කරනලද්දවූ; මෙකව්, මේ කාව්‍යය; දනන්, ජනයාගේ; මනදොළ, මනෝදෝහලය; වස්වා, වහසකෙරේවා.

මේලිව්, මේ කාව්‍යය ලියනලද; පින්, පිණ; පුරා, පූර්ණයකොට; නිතොරා, නොරතොව; සව්සැපත්, සකලසම්පත්තීන්; විඳ, විඳිනකොට; සසරාබිය, සංසාරභීතියට; නොවැද, ප්‍රවේශනොව; මමද, අස්මත්තෙමේද; ලොව්තුරා, ලෝකෝත්තරවූ; බුදුවෙම්වා, බුද්ධරාජ්‍යශ්‍රියට පැමිණෙම්වා.

—( නිමි )—

* පින්සරු. පොත්.

# දැන්වීමයි.

ශ්‍රීරාජාධිරාජසිංහ මහරජාණන් ලඞ්කාරාජ්‍යානුශාසනය කරණකල දක්ෂිණ ලඞ්කාවෙහි සිංහල නරේන්ද්‍රලීලාවෙන් වැජඹුණු ඉලඞ්ගක්කෝන් මුදලිමන්ත්‍රීශ්වරයාණන්ගේ පණ්ඩිත සභාවෙහි ප්‍රධාන තැන්පත්ව සිටි දෙළොස්දහස්රට රාජකීය ධාන්‍යකොෂ්ඨයන්හි ලේකම්ධුරය දැරූහෙයින් තංගල්ලේපත්තායමේ ලේකමයයි ප්‍රසිද්ධ දෙන් ජාසූද්විද සිල්වා අභයගුණවර්ධන සමරජීව පඬිතුමන් විසින් විරචිත මෙම විශෝධගරත්නමාලය නමැති රස වත් කාව්‍යය එතුමන්ගේ මුනුබුරුවූද නම් සඳහන්වන මාගේ කුඩාපියාණන්වූද දෙන් සාමෙල් අභයගුණවර්ධන සමරජීව මැති තුමන් විසින් මහාපණ්ඩිත තුඩාවේ ගුරුතුමන්ගේ ආධාර ඇතුව සත්තකොට 1873 වෙනි වර්ෂයෙහි පළමුවනවර මුද්‍රණයකරවන ලදී. දැනට එයින් එකම පිටපතක් පමණවත් දුර්ලභනිසා බොහෝ දෙනාගේ ඉල්ලීම්පිට නැවත ප්‍රසිද්ධකරන්නටවීය; මෙහි අර්ථව්‍යාඛ්‍යානය මීගිරිපැත්තෙන් අරියාකර විහාරාධිපතිව වැඩවිසූ තංගල්ලේ සිරිසුමනතිස්සාභිධාන මහානායක ස්වාමිපාදයන්වහන්සේ විසින්ද දෙන් අන්ද්‍රිස් තුඩාවේ පණ්ඩිත ගුණවර්ධන ගුරුතුමන් විසින්ද සමාදරයෙන් පිළිගණු ලැබුබැවින් මේවර ශුද්ධකිරිම සම්බන්ධ ව්‍යායාමක් නොකෙළෙම් සන්තකනීවූ අප කුඩාපියාණන්ගේ සංඥපනය මීට ප්‍රමාණවන නිසා මෙහි බහාලම් එනම්-

"ශ්‍රී ලංකාද්වීපයේ ගිරිපාදයෙහි තංගල්ලුපිටස අනෙකශාස්ත්‍ර තොරතුරු සමග සියබස් ආදිය දැන ප්‍රසිද්ධ සම්භාවනීය පදයපණ්ඩිතව විසූ පරම මධුර විචිත්‍රකාව්‍ය ලක්ෂණයෙන් යුක්ත "කාව්‍යමණිකුණ්ඩලා" නම් මහාකාව්‍යයකළ අභයගුණවර්ධන සමරජීවනම්වූ පත්තායමේ ලේකම් මැතිතුමා විසින් මෙයින් හවුරුදු සියයකට පමණ පුරාණකාලයෙහි ස්ත්‍රීවියොගයක් කථාශරීරකොට කරණලද "විශොධගරත්නමාලා" නම්වූ මෙම කාව්‍ය ශ්‍රොතෘජනශ්‍රවණ මනොහාරිවූ මධුර කොමල පද පඞ්ක්තියෙන් හා විවිධ විචිත්‍ර කාව්‍ය ලක්ෂණයෙන්ද යුක්තය; අතිශයින්ම ශබ්දාලංකාරව්‍යාකරණාදියට අවිරුද්ධය, ස්වභාෂා කාව්‍යශාස්ත්‍රයෙහි ලාභිලාෂීවූ ආධුනිකයන් විසින් උගතමනා ස්ත්‍රීවර්ණනාදියෙන් යුක්තවූයේද පහසුවෙලස තේරුම්ගතනොහැකි අනුප්‍රාසපදවාක්‍යාදියෙන් ගහණවූය එබැවින් මෙම කාව්‍යකර්තෘභූත අභයගුණවර්ධන සමරජීව මැතිතුමාහට මුනුබුරුවූ දෙන් සාමෙල් අභයගුණවර්ධන සමරජීව යන මම, ගාලු කෝරළේ තල්පේ පත්තුවේ මීගිරිපැත්තෙන් අරියාකරවිහාරාධිපති සාධුසම්මත ශීලාචාරගුණසම්පන්න සුගතාගමධාරී ශාස්ත්‍රාන්තරයෙහි නිපුණවූ සිරිසුමනතිස්සාභිධාන ශ්‍රී ධර්මරක්ෂිත වංශික අමර

පුර සම්භාගමේ නායකස්ථවිරපාදයන්වහන්සේගෙනරෙන් ශාස්ත්‍රාගම ඉගෙණ යලිත් වැලිගමපලාතේ විවාහලේකම් තනතුරට පැමිණ සිටින ප්‍රසිද්ධවූ දොන් අන්ද්‍රිස් තුඩාවේ පණ්ඩිතගුණවර්ධන මුහන්දිරම් මැතිතුමා ආශ්‍රයකිරීමෙන් දන්නාලද සියබස් තොරතුරු ඇතිව අනන්‍යාධීනවූ විසිවයස්හි සිටීයම් සවභාෂා කාව්‍ය සමය ජානනාදී යෙහි තත්පරවූ මොරවකසි තරුණයන්ගේ ශාස්ත්‍රාභිවෘද්ධිය සඳහා එම "විශෝවගරත්නමාලා" නම්වූ මාහැඟි කාව්‍යය පූජෝපායන දොන් අන්ද්‍රිස් තුඩාවේ පණ්ඩිත ගුණවර්ධනමුහන්දිරම් මැතිතුමාගේ ප්‍රශංසනීයවූ උපකාරයෙන් අව්‍යාකූලලෙඛක දෝෂාපහකර ප්‍රභාව බොධයවන්තයේ ගිණිල්ඛසින් සන්නාහකාව නැවත යළුවතන් කීපවිටක්ම එම මැතිතුමා ඉදිරියේ තිබවා මෙන්ාලෙස පුඩකරවාගෙණ එය ඉදිරිකාලයටත් අවුනැස්වීමේ අසිතිකම නැතිකරවාකෙරෙසි නබා ගණිමින් අවුනස්වා ප්‍රසිඩකෙළෙමි" නනුසි.

පෘථක්ජනවූ සියල්ලන්ටම වැරදීම සවභාවධර්මයක් බැවින් මෙහි වරද ඇතද ශාස්ත්‍රඥයෝ සංශෝධනය කෙරෙත්වා.

මේ පොත අපෙන් අනුවූ කිසිවෙකුටත් කිසිලෙසකින් කිසි කලක මුද්‍රණයකිරීමට අවසර නැත.

J. A. SAMARAJIWA

Dickwella
2nd, October, 1909.

# ශුද්ධිපත්‍රයයි.

| පිට. | පෙළ. | වරද. | නිවරද. |
|---|---|---|---|
| 2 | 25 | තැතැති | තැණැති |
| 4 | 2 | බැදුනු | බැඳුණු |
| ,, | 3 | නුවන | නුවණ |
| ,, | 19 | විද | විඳ |
| 5 | 6 | ස්නිග්ධ | සනිග්ධ |
| ,, | 11 | කලාංභ්‍රරූවය | කලාංභ්‍රකූව |
| ,, | 14 | ලසද | ළසඳ |
| ,, | 19 | උෂ්ණීය | උෂ්ණීෂ |
| ,, | 28 | විදිනුපුල් | විඳිනුපුල් |
| ,, | 29 | කලු | කළු |
| 6 | 14 | නිත | නීති |
| ,, | 26 | දිස | දිසි |
| 7 | 4 | සිරිසිලි | සිරිසීලි |
| ,, | 17 | සපි | සිපි |
| ,, | 28 | දෙසා | දෙසා |
| 8 | 19 | දිස | දිසි |
| 10 | 23 | ශෙනගී | සෙනඟී |
| 12 | 29 | තනේ | නනේ |
| 13 | 19 | සබදිති | සබඳිති |
| 14 | 3 | මතේමතේ | මතෝයුතේ |
| ,, | 20 | සෙනග | සෙනඟ |
| 16 | 31 | දවස්හිා | දවස්හි |
| 19 | 32 | හෙත් | හෙවත් |
| 21 | 30 | අසවයා | අශ්වයා |
| 23 | 2 | කුසම | කුසුම |
| ,, | 6 | හක්පිමින් | හක්පිඹිමින් |
| 85 | 23 | පිඹි | පිඹ |
| 43 | 28 | වීරහ | විරහ |

මූර්ධජ දන්තජ ණ, ළ, න, ල, අක්ෂර එළිසමය පිණිස කවිවල වෙනස්ව යොදා ඇතත් සන්නලියනාතන්හි ශුද්ධකළෙමි. නමුත් එම අක්ෂර බොහෝතැනක විපර්‍යාසව වැටී ඇතත් අර්ථබාධක නොවන්නෙන් මෙහි අඩංගු නොකළෙමි.